# 10. මූල්‍ය අංශය

## 10.1 මුදල් සැපයුම

දැඩි මූල්‍ය ප්‍රතිපත්ති තව දුරටත් පවත්වාගෙන යෑම, ආර්ථික ක්‍රියාකාරීත්වයේ අඩු වේගය, විශේෂයෙන් ම නියගය හා විදුලිබලය කපා හැරීම් පැවතුණු කාලපරිච්ඡේදය හා ඉන්පසු ඇතිවූ වාතාවරණය තුළ වාණිජ බැංකු ණය දීමේ දී වඩා සුපරීක්ෂාකාරී වීම, දෙවැනි හා තුන්වැනි කාර්තු තුළ අක්‍රිය ණය වැඩි වීම හේතුවෙන් වාණිජ බැංකුවලට මුහුණ දීමට සිදුවූ ද්‍රවශීලතා ගැටලු හා ශුද්ධ විදේශ වත්කම් පහත වැටීම නිසා මූල්‍ය ප්‍රසාරණ වේගය සැලකිය යුතු තරම් පහත වැටිණි. කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ සඳහා ඉල්ලුම දුර්වල වීම ද මූල්‍ය ප්‍රසාරණ වේගය අඩු කිරීමට දායක විය. එහෙත් ද්‍රවශීලතා ගැටළු වලට මුහුණ දුන් වාණිජ බැංකු විසින් භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවට්ටම් කිරීම ද, රජයේ ණය ලබාගැනීමේ අවශ්‍යතාවය ද පිළිබිඹු කරමින් මහ බැංකුව විසින් රජයට දුන් ණය ප්‍රමාණය වැඩි විය. පුද්ගලික අංශයට සැපයූ ණය ප්‍රමාණයෙහි වර්ධනය තියුණු ලෙස පහත වැටීම 1996 වසරේ මූල්‍ය ප්‍රසාරණ වේගය අඩු කළේ ය. 1995 වසර අවසානයේ දී වූ සියයට 19.2 ක වර්ධනය හා සසඳන විට 1996 වසර අවසානයේ දී පුළුල් මුදල් සැපයුමෙහි ($M_2$) වර්ධනය ලක්ෂ්‍යමය පදනමක් මත, සියයට 10.8 ට අඩු වී තිබුණි. පසුගිය වසරේ මෙන් ම 1996 වසරේ දී ද පටු මුදල් සැපයුම ($M_1$) පුළුල් මුදල් සැපයුමේ වර්ධන වේගයට වඩා පහත් වර්ධන වේගයක් දක්වමින් සියයට 4 ක ඉතා අඩු වේගයකින් ප්‍රසාරණය විය. $M_1$ අඩු වර්ධන වේගයක් දැක්වීමට හේතු වූයේ ආරූඪ මුදල් (quasi money) හි ද්‍රවශීලතාවය වැඩි කරන ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර, ණය පත් සහ විද්‍යුත් බැංකු ක්‍රම වැනි නවීන බැංකු පහසුකම් ප්‍රචලිත වීම හා ඉහළ පොලී අනුපාතික පවතින වාතාවරණයක් තුළ මහජනයා ගනුදෙනු ශේෂයන් භාවිතා කිරීමේ දී වැඩි සැලකිලිමත් බවක් දැක්වීමත් ය. අධික ණය ප්‍රසාරණය නිසා පසුගිය වර්ෂයේ අවසානය වන විට ඇතිවූ අධි ද්‍රවශීලතාවය (එනම් නාමික දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය ඉක්ම වූ මුදල් සැපයුමේ වර්ධනය), වර්ෂයේ දෙවැනි භාගය වන විට ක්‍රමයෙන් තුරන් ව ගිය අතර, වර්ෂය අවසානය වන විට, මුදල් සැපයුමේ වර්ධනයෙන් මූර්ත ආර්ථික වර්ධනය අඩු කිරීමෙන් ගණනය කෙරෙන උද්ධමන අනුපාතිකය සියයට 10 දක්වා පහත වැටුණි.

**සංඛ්‍යා සටහන 10.1**

**මූල්‍ය සංඛ්‍යා සාරාංශය**

| ශීර්ෂය | 1996 අවසානයට රුපියල් බිලියන | වෙනස 1995 ප්‍රමාණය රු. බිලියන | 1995 % | 1996 ප්‍රමාණය රු. බිලියන | 1996 % |
|---|---|---|---|---|---|
| මූල්‍ය සමස්තයන් : | | | | | |
| පටු මුදල් සැපයුම $M_1$ | 78.2 | 4.8 | 6.7 | 3.0 | 4.0 |
| පුළුල් මුදල් සැපයුම $M_2$ | 253.2 | 36.9 | 19.2 | 24.7 | 10.8 |
| තුඩු දුන් සාධක | | | | | |
| දේශීය ණය | 252.3 | 50.0 | 28.8 | 28.5 | 12.7 (අ) |
| රාජ්‍ය (ශුද්ධ) | 47.5 | 7.1 | 25.1 | 12.3 | 35.1 |
| රාජ්‍ය සංස්ථා | 9.9 | 3.3 | 65.2 | 1.4 | 16.6 (අ) |
| පෞද්ගලික අංශය | 194.8 | 42.9 | 29.5 | 14.8 | 8.2 (අ) |
| විදේශීය වත්කම් (ශුද්ධ) | 61.9 | 2.0 | 3.2 | -4.6 | -7.0 |
| අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) | 61.0 | -15.2 | 32.6 | 0.8 | 1.3 (අ) |
| සංචිත මුදල් | 85.5 | 10.5 | 15.5 | 6.9 | 8.8 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) රජයේ උපදෙස් මත ඉහත කාලයේ දී නිකුත් කරන ලද සමහර ණය වෙනුවට භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද පිළිණපත් වල බලපෑම ඉවත් කළ විට, වූ වැඩිවීම් පිළිවෙලින් සියයට 18.5, 31.5, 14.7 සහ 19.7 වේ.

ප්‍රධාන වශයෙන් පුද්ගලික අංශයේ ණය වර්ධනයෙහි අඩු වීම පිළිබිඹු කරමින්, 1995 වසරේ දී සිදුවූ සියයට 27.4 ක වඩා තියුණු වර්ධනයට සාපේක්ෂ ව, 1996 වසරේ දී ශුද්ධ දේශීය වත්කම් සියයට 18.1 කින් වැඩි විය. 1995 වසරේ දී සිදුවූ සියයට 28.2 ක වර්ධනයට සාපේක්ෂ ව 1996 වසරේ දී පුද්ගලික අංශයට දුන් ණය ප්‍රමාණය සියයට 14.7 කින් වැඩි විය. ආරක්ෂක කටයුතු සඳහා සහ තිරිඟු පිටි සහනාධාර සඳහා වියදම වැඩි වීම සමග පුද්ගලිකරණයෙන් ලත් ආදායම අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු වීම නිසා ඇතිවූ රජයේ ආදායම් පහත වැටීම ද හේතුකොට ගෙන රජයට බැංකු ණය වැඩිපුර ලබා ගැනීමට සිදු විය. මූල්‍යකරණය සඳහා වැඩි අවශ්‍යතාවක් ඇති වුව ද රජය නිකුත් කළ හැකි භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය සඳහා වූ රුපියල් දශ ලක්ෂ 125,000 සීමාව වැඩි නොකළේ ය. මෙම සීමාව වැඩි නොකිරීමත් රජයේ මුදල් කලමනාකරණය වඩා කාර්යක්ෂම වීමත්, ජාත්‍යන්තර වෙළෙඳපොලේ මිල ඉහළ යෑමට ප්‍රතිචාරයක් වශයෙන් තිරිඟු පිටි හා ඛනිජ තෙල් මිල සැකසීමත්, රජයේ අය වැය හිඟය සහ බැංකුවලින් ගත් ණය ප්‍රමාණය පාලනය කිරීමට උපකාරී විය. එසේ වුව ද, 1995 වසරේ රජයට දුන් ශුද්ධ ණය ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 7,067 (සියයට 25.1 ක වර්ධනයක්) සාපේක්ෂ ව 1996 වසරේ රුපියල් දශ ලක්ෂ 12,344 කින් (සියයට 35.1) කින් වැඩි විය. මෙම වැඩිවීමෙන් රුපියල් දශ ලක්ෂ 9,873 ක් මහ බැංකුවෙන් ලැබුණු අතර, රුපියල් දශ ලක්ෂ 2,471 ක් වාණිජ බැංකුවලින් ලැබුණි. මෙවැනි මට්ටමක බැංකු අරමුදල් මගින් හිඟය මූල්‍යකරණය කර තිබූ නමුත් විශේෂයෙන් ම 1996 වසර මැද දී සිදු වූ පසුබෑස්මෙන් ආර්ථිකය ඉක්මනින් මිදුන වාතාවරණයක් තුළ මූල්‍ය තත්ත්වයන්හි දැඩි භාවය අධික බවක් පෙණුනි. එබැවින් මූල්‍ය ප්‍රතිපත්තීන්හි යම් ලිහිල් කිරීමක් අවශ්‍ය විය. මෙම ලිහිල් කිරීම 1997 වසරේ මුල් කාලයේ දී ක්‍රියාත්මක විය.

1996 වසර සඳහා රජයේ අයවැය ලේඛනයේ සඳහන් වූ ආකාරයට, 1996 වසරේ ඔක්තෝබර් මස රුපියල් දශ ලක්ෂ 19,933 ක් වටිනා රජයේ පිළිණපත් රජය විසින් රාජ්‍ය බැංකු දෙකට නිකුත් කරන ලදී. රජයේ උපදෙස් මත දුන් ණය පැහැර හැරීම නිසා මෙම බැංකු දෙකට දැරීමට සිදුවූ පාඩු සඳහා වන්දි වශයෙන් මෙම පිළිණපත් නිකුත් කරන ලදී. මෙම පිළිණපත් නිකුතුව මගින් ද මූල්‍ය සංඛ්‍යා කෙරෙහි බලපෑමක් ඇති විය. බැඳුම්කර සඳහා ගණන් තැබීමේ දී සමස්ත මූල්‍ය එකතුව මත බලපෑමක් ඇති නොවන නමුත්, එමගින් පුද්ගලික අංශයට දුන් ණය රජයේ සංස්ථාවන්ට දුන් ණය, සමුපකාර ආයතන සඳහා දුන් ණය හා ශුද්ධ වෙනත් වත්කම් අගයන් වෙනස් වේ. පිළිණපත් නිකුතුව සඳහා අදාළ ගැලපීම් කළ පසු, 1996 වසරේ දී පුද්ගලික අංශයට සැපයූ ණය ප්‍රමාණය සියයට 8.2 කින් (පිළිණපත් රහිත ව සියයට 14.7 කින්) වර්ධනය වී ඇත. රාජ්‍ය සංස්ථාවනට දුන් ණය ප්‍රමාණය සියයට 16.6 කින් (පිළිණපත් රහිත ව සියයට 31.5 කින් ) වැඩි විය. මෙම පිළිණපත් නිකුතුවෙන් කොටසක් වී අලෙවි මණ්ඩලයට සපයා ඇති ණය බේරුම් කිරීම සඳහා වූ බැවින් සමුපකාර ආයතන සඳහා සැපයූ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,474 කින් අඩු විය.

පිළිවෙළින් දෙවැනි වසරටත් ඇතිවූ සමස්ත ගෙවුම් තුලන හිඟය අනුව, බැංකු ක්ෂේත්‍රයේ ශුද්ධ විදේශ වත්කම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ

4,671 (සියයට 7.0) කින් පහත වැටුණි. රුපියල් දශ ලක්ෂ 4,156 කින් පහත වැටුනු වාණිජ බැංකු ශුද්ධ වත්කම් ප්‍රමාණය මෙම සමස්ත අඩු වීමේ ප්‍රධාන කොටස විය. සම්පූර්ණයෙන්ම වාගේ නේවාසික නොවන විදේශ ව්‍යවහාර මුදල් ගිනුම් හි වර්ධනය පෙන්නුම් කරමින් වාණිජ බැංකුවල දළ විදේශ වගකීම් රුපියල් දශ ලක්ෂ 5,260 කින් වැඩිවිය. එසේ නමුත්, වාණිජ බැංකුවල දළ විදේශ වත්කම් වැඩි වූයේ රුපියල් දශ ලක්ෂ 1,103 කින් පමණි. ශුද්ධ විදේශ වත්කම්හි අඩුවීම විදේශ විනිමය වෙළෙඳපොල කෙරෙහි බලපෑමක් ඇති කළ අතර, 1996 වසරේ දී ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂ ව රුපියලෙහි අගය සියයට 5 කින් පහත වැටුණි.

නේවාසික නොවන විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවලින් සියයට 50ක් පමණ ප්‍රමාණයක් විදේශයන්හි රැකියාවල යෙදී සිට පෙරලා පැමිණි දැනට ශ්‍රී ලංකාවෙහි පදිංචි ශ්‍රී ලාංකිකයන් සතු බව සැලකිය යුතු කරුණකි. විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවල මෙම අගය වර්තමාන ක්‍රමය අනුව නේවාසිකයන් නොවන්නන් වෙතැති වාණිජ බැංකුවල වගකීම් ලෙස සලකනු ලැබේ. එහෙත් මෙම තැන්පතු සැලකිය යුත්තේ විදේශ ව්‍යවහාර මුදල්වලින් ප්‍රකාශිත දේශීය තැන්පතු වගකීම් ලෙස ය. අදාළ ගැලපීම්කළ විට පුළුල් මුදල් සැපයුම $M_2$ ඉහළ නංවමින් වාණිජ බැංකුවල ශුද්ධ විදේශ වත්කම් ද ආරක්ෂ මුදල් මට්ටම ද ඉහළ යනු ඇත. එයට අමතර ව, විදේශ ව්‍යාවහාර මුදල් බැංකු ඒකකයන්හි දේශීය ගනුදෙනු කරුවන් සමග ඇති සබැඳියාව වැඩි වී ඇති බැවින්, මෙම බැංකු ඒකකයන් ඇතුළත් වන ඒකාබද්ධ මුල්‍ය සමීක්ෂණයක් සැකසීම අවශ්‍ය වේ. මෙම සංශෝධිත මුල්‍ය සමීක්ෂණය මහ බැංකුව විසින් සකසන මුල්‍ය සංඛ්‍යාණයන්හි නිරන්තර අංගයක් කිරීමේ අරමුණ සහිතව මෙම සමීක්ෂණය පිළිබඳ තාක්ෂණික සටහනක් ද, මුල්‍ය සමීක්ෂණයට මෙම සංශෝධන දෙක කිරීමේ දී ඇතිවන බලපෑම ද විශේෂ සංඛ්‍යා සටහන 10 හි සඳහන් කර ඇත.

1995 වසර තුළ සිදුවූ රුපියල් දශ ලක්ෂ 10,532 හෝ සියයට 15.5 වර්ධනයට සාපේක්ෂ ව 1996 වසර තුළ සංචිත මුදල් (අධි බලැති මුදල් හෝ මුල්‍ය පදනම) රුපියල් දශ ලක්ෂ 6,922 (සියයට 8.8 ) කින් වැඩි විය. බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම් හි සිදුවූ සියයට 18.1 ක සමස්ත වර්ධනය හා සලකන විට සංචිත මුදල් ප්‍රමාණයේ අඩු වර්ධනය නිසා ද්‍රවශීලතාවයේ සැලකිය යුතු අඩුවීමක් සිදු විය. මෙම ද්‍රවශීලතා අඩු වීම පුළුල් මුදල් ගුණකයෙහි අගය යම් ප්‍රමාණයකින් ඉහළ යෑමෙන් නිරූපනය විය. වසරේ දෙවැනි භාගය තුළ මෙම පුළුල් මුදල් ගුණකයේ අගය ආසන්න වශයෙන් 3 ක් ලෙස පැවතුණි. 1995 වසරේ මෙන් 1996 වසරේ ද ආදායම් ප්‍රවේගයෙහි අගය ආසන්න වශයෙන් 3 ක් ලෙස පැවතුණි. සැපයුම් අංශයෙන් සලකා බලන කල සංචිත මුදල්හි සියයට 8.8 ක වැඩි වීමට හේතු වූයේ මහ බැංකුවේ ශුද්ධ විදේශ සංචිතයන්හි අඩුවීම නිසා සමනය වූ රජයට දෙන ලද ශුද්ධ ණය ප්‍රමාණයෙහි රුපියල් දශ ලක්ෂ 9,873 ක වැඩි වීමකි. භාවිත අංශයෙන් බලන කල මෙම වැඩි වීම මූලික වශයෙන් පිළිබිඹු වූයේ මුදල් සංසරණය රුපියල් දශ ලක්ෂ 2,795 කින් වැඩි වීමෙන් හා මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු රුපියල් දශ ලක්ෂ 4,504 කින් වැඩි වීමෙන්ය.

**සංඛ්‍යා සටහන 10.2**

## මුල්‍ය සමස්තයන් 1995 - 1996

ප්‍රමාණය රුපියල් දශලක්ෂ

| කාලච්ඡේදය අවසානයට | පටු මුදල් සැපයුම ($M_1$) | | | | | | පුළුල් මුදල් සැපයුම ($M_2$) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | වෙනස: ලක්ෂ්‍යමය පදනම මත | | වෙනස: චල සාමාන්‍යය | | 1995 | 1996 | වෙනස: ලක්ෂ්‍යමය පදනම මත | | වෙනස: චල සාමාන්‍යය | |
| | | | 1995 | 1996 | 1995 | 1996 | | | 1995 | 1996 | 1995 | 1996 |
| ජනවාරි | 69,875 | 73,783 | 21.0 | 5.6 | 19.3 | 9.2 | 193,010 | 228,090 | 21.4 | 18.2 | 21.2 | 18.2 |
| පෙබරවාරි | 70,702 | 77,439 | 13.4 | 9.5 | 18.5 | 8.9 | 192,859 | 234,198 | 18.2 | 21.4 | 20.9 | 18.5 |
| මාර්තු | 71,335 | 81,795 | 13.8 | 14.7 | 18.2 | 9.0 | 195,370 | 239,177 | 17.9 | 22.4 | 20.7 | 18.9 |
| අප්‍රේල් | 68,718 | 79,478 | 11.5 | 15.7 | 17.8 | 9.4 | 195,982 | 241,894 | 17.8 | 23.4 | 20.7 | 19.4 |
| මැයි | 68,376 | 76,619 | 12.4 | 12.1 | 17.5 | 9.4 | 197,892 | 242,072 | 18.9 | 22.3 | 20.6 | 19.7 |
| ජුනි | 68,714 | 75,956 | 10.1 | 10.5 | 16.6 | 9.4 | 201,170 | 240,407 | 17.6 | 19.5 | 20.1 | 19.8 |
| ජූලි | 68,194 | 76,199 | 7.8 | 11.7 | 15.6 | 9.7 | 202,826 | 240,083 | 17.3 | 18.4 | 19.7 | 19.9 |
| අගෝස්තු | 69,321 | 76,184 | 9.1 | 9.9 | 14.8 | 9.8 | 205,325 | 240,096 | 18.1 | 16.9 | 19.4 | 19.7 |
| සැප්තැම්බර් | 70,306 | 76,634 | 6.3 | 9.0 | 13.6 | 10.0 | 211,009 | 241,699 | 18.5 | 14.5 | 19.0 | 19.4 |
| ඔක්තෝබර් | 71,538 | 74,003 | 7.0 | 3.5 | 12.4 | 9.7 | 215,349 | 242,845 | 17.6 | 12.8 | 18.6 | 18.9 |
| නොවැම්බර් | 71,847 | 75,276 | 7.7 | 4.8 | 11.4 | 9.4 | 218,999 | 245,227 | 18.8 | 12.0 | 18.5 | 18.3 |
| දෙසැම්බර් | 75,217 | 78,203 | 6.8 | 4.0 | 10.4 | 9.2 | 228,536 | 253,201 | 19.2 | 10.8 | 18.4 | 17.5 |
| මාසික සාමාන්‍යය | 70,345 | 76,797 | 10.4 | 9.2 | | | 204,861 | 240,749 | 18.4 | 17.5 | | |

සටහන : සම්මත ජාත්‍යන්තර පිළිවෙතට අනුකූල වන පරිදි, 1990 සිට මුල්‍ය දත්ත ප්‍රතිවර්ගීකරණය කර ඇත. පරිශිෂ්ඨයෙහි ඇති 100, 101, 105 සංඛ්‍යා සටහන් වල ඇති සටහන් බලන්න

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සංඛ්‍යා සටහන 10.3

## මුල්‍ය සමස්තයන් සහ ඒවාට තුඩුදුන් සාධක 1994 - 1996

ප්‍රමාණය රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | දෙසැ. 1994 | දෙසැ. 1995 | දෙසැ. 1996 | වෙනස 1995 ප්‍රමාණය(අ) | වෙනස 1995 ප්‍රතිශතය | වෙනස 1996 ප්‍රමාණය(අ) | වෙනස 1996 ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| **මුල්‍ය සමස්තයන් :** | | | | | | | |
| 1. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | 38,906 | 42,198 | 42,565 | 3,292 | 8.5 | 367 | 0.9 |
| 2. මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු | 31,555 | 33,019 | 35,638 | 1,464 | 4.6 | 2,619 | 7.9 |
| පටු මුදල් සැපයුම ($M_1$) | 70,461 | 75,217 | 78,203 | 4,756 | 6.7 | 2,986 | 4.0 |
| 3. වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු | 121,209 | 153,319 | 174,998 | 32,110 | 26.5 | 21,679 | 14.1 |
| සමුපකාර ආයතන | 3,781 | 3,598 | 3,056 | -183 | -4.8 | -542 | -15.1 |
| රාජ්‍ය සංස්ථා | 13,236 | 15,888 | 17,864 | 2,652 | 20.0 | 1,976 | 12.4 |
| අනෙකුත් පෞද්ගලික අංශයේ (ආ) | 104,192 | 133,833 | 154,078 | 29,641 | 28.4 | 20,245 | 15.1 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 191,670 | 228,536 | 253,201 | 36,866 | 19.2 | 24,665 | 10.8 |
| **තුඩුදුන් සාධක :** | | | | | | | |
| 1. දේශීය ණය | 173,794 | 223,798 | 252,317 | 50,004 | 28.8 | 28,519 | 12.7 |
| රජයට දෙන ලද ශුද්ධ ණය | 28,147 | 35,214 | 47,558 | 7,067 | 25.1 | 12,344 | 35.1 |
| රජයට දෙන ලද දළ ණය | 40,250 | 47,738 | 63,970 | 7,488 | 18.6 | 16,232 | 34.0 |
| මහ බැංකුව විසින් | 19,568 | 27,458 | 37,801 | 7,890 | 40.3 | 10,343 | 37.7 |
| වාණිජ බැංකු විසින් | 20,682 | 20,280 | 26,169 | -402 | -1.9 | 5,889 | 29.0 |
| රජයේ තැන්පතු සහ මුදල් ශේෂ | 12,103 | 12,524 | 16,412 | 421 | 3.5 | 3,888 | 31.0 |
| පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය | 145,647 | 188,584 | 204,759 | 42,937 | 29.5 | 16,175 | 8.6 |
| සමුපකාර ආයතන | 2,541 | 3,939 | 1,465 | 1,398 | 55.0 | -2474 | -62.8 |
| රාජ්‍ය සංස්ථා | 5,163 | 8,527 | 9,938 | 3,364 | 65.2 | 1,411 | 16.5 |
| අනෙකුත් පෞද්ගලික අංශයේ ගනුදෙනුකරුවන් | 137,943 | 176,118 | 193,356 | 38,175 | 27.7 | 17,238 | 9.8 |
| 2. බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) | 64,467 | 66,532 | 61,861 | 2,065 | 3.2 | -4,671 | -7.0 |
| මහ බැංකුවෙන් | 65,864 | 74,301 | 73,786 | 8,437 | 12.8 | -515 | -0.7 |
| වාණිජ බැංකුවලින් | -1397 | 7,769 | 11,925 | -6372 | -456.1 | -4156 | -53.5 |
| 3. අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) | -46,590 | -61,794 | -60,978 | -15,204 | -32.6 | 816 | 1.3 |
| මහ බැංකුවේ අනෙකුත් වගකීම් (ශුද්ධ) | -39,398 | -51,986 | -58,476 | -12,588 | -32.0 | -6,490 | -12.5 |
| වාණිජ බැංකුවල අනෙකුත් වගකීම් සහ ගිණුම් (ශුද්ධ) | -7,192 | -9,808 | -2,502 | -2,616 | -36.4 | 7,306 | 74.5 |

(අ) මන්වාසික නොවන්නන්ගේ විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ඇතුළත් නොවේ.

(ආ) සලකුණු වලින් ( + හා - ) පුළුල් මුදල් සැපයුම ($M_2$) හි බලපෑම් දැක්වේ.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව


සටහන : සම්මත ජාත්‍යන්තර පිළිවෙතට අනුකූල වන පරිදි 1990 සිට මුල්‍ය දත්ත ප්‍රතිවර්ගීකරණය කර ඇත.
පරිශිෂ්ඨයෙහි ඇති 100, 101, 105 සංඛ්‍යා සටහන් වල ඇති සටහන් බලන්න.

## 10.2 මුල්‍ය ප්‍රතිපත්තිය

1996 වසරේ මැද භාගයේදී, ආර්ථිකයේ තාවකාලික පසුබෑස්මක්, සහිත වාතාවරණයක් තුල මහ බැංකුවට මුල්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියා කරවීමට සිදුවිය. විදුලි බලය කපාහැරීම නිසා අහිතකර බලපෑමකට හසුවූ ආයතන විසින් සහනදායී ණය සඳහා වැඩිවූ ඉල්ලුමක් ඇති කළ අතර පෙර වසරේ සිට පැවත ආ සැලකිය යුතු ප්‍රමාණයේ අධි ද්‍රවශීලතාවයක්ද පැවතුණි. මෙවැනි තත්ත්වයන් යටතේ මුල්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවයන් රජයේ මුදල් කලමනාකරණයේ කාර්යක්ෂමතාවය වැඩිවීම නිසා අඩුවිය. මෙම මුදල් කලමනාකරණ කාර්යක්ෂමතාවය වැඩි වූයේ අයවැය හිඟය පාලනය කිරීම සඳහා තිරිඟු පිටි, පාන් හා ඛනිජ තෙල් වර්ග වල මිල වැඩි කිරීමට යෙදූ ක්‍රියාමාර්ග. හා අත්‍යාවශ්‍ය නොවන වියදම් අඩු කිරීමට යෙදූ ක්‍රියාමාර්ග මගිනි. නියගය හා විදුලි බල කපා හැරීම නිසා ඇතිවූ භාණ්ඩ සැපයුමෙහි තාවකාලික අපහසුතාවයන් නිසා මිල ගණන් වැඩි විය. වසරේ පළමු කාර්තු තුනේ දී මුදල් සැපයුමෙහි ප්‍රසාරණය ඉහල මට්ටමක පැවතීම නිසාත් (පුළුල් මුදල් අනුව මෙම

**රූප සටහන 10.1**

**මූල්‍ය සමස්තයන්, සංසරණ ප්‍රවේගය සහ මුදල් ගුණකය**





ප්‍රසාරණය සියයට 20 කට අධික විය) වසරේ පළමු කාර්තු තුන තුල මිල ගණන් ඉහල යැම නිසාත්, මුදල් සැපයුමේ වර්ධනය සහ මූර්ත ආර්ථික වර්ධනයේ වෙනස ලෙස ගණනය කෙරෙන උද්ධමන පීඩනය අඩුවන තුරු මූල්‍ය පාලනය ලිහිල් කිරිම යෝග්‍ය නොවීය.

ඉහල ව්‍යවස්ථාපිත සංචිතය තවදුරටත් පැවැත්වූ අතර, අවදානම් සහිත ණය සහ පරිභෝජනය උදෙසා දෙන ණය ප්‍රමාණය අඩු කිරිමට වාණිජ බැංකුවලට අවවාද කිරිමට ශිෂ්ඨ ප්‍රයෝග භාවිතා කරන ලදී. මූල්‍ය ක්‍රමයෙහි ස්ථායිතාවය සුරැකීම සඳහා මනා බැංකු පුරුදු පවත්වාගෙන යැමෙහි වැදගත්කම වාණිජ බැංකු කලමනාකරුවන් සමග සාමාන්‍යයෙන් පවත්වන මාසික රැස්වීම් වලදී මහ බැංකුව අවධාරණය කළේය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකර වීම සඳහා ප්‍රධාන උපකරණය විවට වෙළදපොළ කටයුතු විය. 1996 මැද භාගයේදී ද්‍රවශීලතා හිගයකට මුහුණ දුන් ආයතනයන් වෙතින් සහනාධාර සහිත ණය සඳහා ඉල්ලුම වැඩිවු විට, අවශ්‍ය අවස්ථාවන්හි ණය ප්‍රති ව්‍යුහගත කිරිමෙන් අනතුරුව, තම ගනුදෙනු කරුවන්ගේ තාවකාලික ණය අවශ්‍යතා, එකිනෙක සලකා බැලීමේ පදනමක් මත සැපයීමට වාණිජ බැංකු කැමැති කරවා ගැනීමට මහ බැංකුව ශිෂ්ඨ ප්‍රයෝග යෙදවිය.

මුදල් වෙළෙඳපොල ස්ථායි කිරිමේ ප්‍රයත්නයන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව රුපියල් දශලක්ෂ 5000 ක විශේෂ භාණ්ඩාගාර බිල්පත් නිකුතුන් මිල දී ගැනීමට අමතරව වසරේ ආරම්භක භාගය තුළ ප්‍රාථමික වෙන්දේසි

**රූප සටහන 10.2**

**මූල්‍ය පදනම සහ මුදල් ගුණකය 1992-1996**



**විශේෂ සටහන 10**

## විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක අන්තර්ගත කිරීමට මූල්‍ය සමීක්ෂණය සංශෝධනය කිරීම.

වත්මන් ක්‍රමය අනුව මූල්‍ය සමීක්ෂණ මහ බැංකුවේ හා ලංකාවෙහි ගනුදෙනු කරන වාණිජ බැංකුවල දේශීය ඒකකයන් හි කටයුතු වලට සීමා කර ඇත. මුදල් සංඛ්‍යාන ඉදිරිපත් කරන ආකාරයන් ඒවාහි අඩංගු දත්තයනුත් වැඩි දියුණු කිරීමට මූල්‍ය සමීක්ෂණයේ ප්‍රධාන වෙනස්කම් දෙකක් අවශ්‍ය වේ. ඉන් එකක් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක සලකන ආකාරය වේ. දෙවැන්න නේවාසික නොවන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සලකන ආකාරයයි. අවශ්‍ය වෙනස් කිරීම් හා එම වෙනස් කිරීම් මගින් මූල්‍ය දත්තයන් මත ඇතිවන බලපෑම් මෙම තාක්ෂණික සටහන මගින් පැහැදිලි කෙරේ.

### විදේශ ව්‍යවහාර මුදල් ඒකක සලකනු ලබන ආකාරය

වත්මන් මූල්‍ය සමීක්ෂණය තුළ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි කටයුතු නියි ආකාරයට ඇතුළත් නොවේ. මෙම ඒකක නේවාසික නොවන ආයතන හෝ මුළු මනින්ම අක් වෙරළ ආයතන ලෙස සලකනු ලබන අතර, දේශීය බැංකු ඒකක ශේෂ පත්‍රයන්හි මෙම විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්ට අදාළ ශේෂ විදේශ වත්කම් / බැරකම් ලෙස සලකනු ලැබේ. මෙම ශේෂයන් මූල්‍ය සමීක්ෂණයේ ශුද්ධ විදේශ වත්කම් ලෙස අන්තර්ගත වේ. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක පිහිටුවන ලද මුල් අවස්ථාවේ සිටම මෙම පිළිවෙත අනුගමනය කරන ලදී.

අක් වෙරළ බැංකු කටයුතු දියුණු කිරීමටත්, අපනයන සැකසුම් කලාප සමාගම් වල කටයුතු පහසු කිරීමටත්, අංක 380 දරණ ශ්‍රී ලංකා මහ බැංකු චක්‍රලේඛනය යටතේ 1979 වසරේ ජූලි මැය මැද විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක පිහිටුවන ලදී. දේශීය ආයතන සමග මෙම විදේශ ව්‍යවහාර බැංකු ඒකකයන්හි ගනුදෙනු අල්ප වේ යැයි ද, ඒ නිසා දේශීය මූල්‍ය කටයුතු මත ඉන් ඇතිවන බලපෑම අවම වේ යැයි ද අපේක්ෂා කරන ලදී. එහෙත් මූල්‍ය පද්ධතිය තුළ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි වැදගත්කම සැලකියයුතු තරම් වැඩි වී ඇත. 1996 වසර අවසානයේ දී විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක 26 ක් රට තුළ ක්‍රියාත්මක වූහ. මෙම ඒකක විසින් සිය ගනුදෙනු කරුවන්ට සියළුම වාණිජ බැංකු සේවාවන් සපයන ලදී. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි ගනුදෙනුකරුවන් කාණ්ඩ තුනක ට වර්ගීකරණය කළ හැක. එනම් අනේවාසික, නේවාසික හා බැංකු වශයෙනි. අනේවාසික අංශය අක්වෙරළ ගනුදෙනු කරුවන්ගෙන් පමණක් සමන්විත වේ. නේවාසික අංශය තුළ ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාකරන ව්‍යවසායන් හා වෙනත් අවසරලත් ගනුදෙනුකරුවන් අන්තර්ගත වේ. මෙම නේවාසික ව්‍යවසායන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වැදගත් ණය ප්‍රභවයක් වී ඇත. 1979 වසර අවසානයේ දී රුපියල් දශ ලක්ෂ 576 (එ.ජ. ඩොලර දශ ලක්ෂ 39) ක් වශයෙන් පැවැති විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හා මුළු සම්පත් ප්‍රමාණය 1996 වසර අවසන් වන විට රුපියල් දශ ලක්ෂ 81,073 (එ.ජ.ඩොලර දශ ලක්ෂ 1,430) දක්වා වැඩි වූ අතර, එම ඒකකයන් මගින් තම නේවාසික ගනුදෙනු කරුවනට දුන් ණය ප්‍රමාණය 1982 වසරේ පැවැති රුපියල් දශ ලක්ෂ 5,050 සිට 1996 වසර වන විට රුපියල් දශ ලක්ෂ 44,572 ට වැඩි වී තිබුණි. 1996 වසර අවසානයේ දී ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියා නොකරන අපනයනකරුවන්ට ද විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීමට අවසර දීමට ගත් තීරණය අනුව මෙම ගනුදෙනු මට්ටම් තවදුරටත් වැඩිවේ යැයි අපේක්ෂා කෙරේ. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි අනේවාසික ගනුදෙනු සම්පූර්ණයෙන්ම අක්වෙරළ ගනුදෙනු වන බැවින්, එමගින් දේශීය මුදල් සැපයුම මත ඇති බලපෑම අවම වේ. එහෙත් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් නේවාසිකයන්ට සපයන ණය දේශීය මුදල් කළමනාකරණයමත බලපෑම් ඇති කෙරේ. එම ණය දේශීය ආර්ථිකයෙහි ද්‍රවශීලතාවය වැඩිකරනු ඇත. දේශීය ආර්ථිකය කෙරෙහි මෙම ඒකකයන්හි බලපෑම සලකන කළ මූල්‍ය සංඛ්‍යාන තුළ මෙම ඒකකයන්හි කටයුතු නියි ආකාරයට අඩංගු විය යුතු ය.

### නේවාසික නොවන විදේශ ව්‍යවහාරික මුදල් ශේෂ සලකන ආකාරය

වත්මන් ක්‍රමය අනුව, නේවාසික නොවන විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු අනේවාසිකයින් සතු තැන්පතු ලෙස සලකන අතර, එම ගිණුම් වල ශේෂ විදේශ බැරකම් ලෙස සැලකේ. මෙම තැන්පතු ප්‍රමාණයෙන්, වටිනාකම අනුව, සියයට 50 ට අධික ප්‍රමාණයක්, විශේෂයෙන් ම පිටරට රැකියාවන් සඳහා ගොස් පෙරලා පැමිණි නේවාසිකයින් සතු බව සොයා ගෙන ඇත. එබැවින් මෙම කොටස සතු නේවාසික නොවන විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ප්‍රමාණය සැලකිය යුත්තේ දේශීය බැංකු ඒකකයන් හි විදේශ බැරකම් ලෙස නොව, නේවාසිකයන් සතු විදේශ ව්‍යවහාර මුදල් වලින් ප්‍රකාශිත දේශීය බැරකම් ලෙසය. නේවාසික නොවන විදේශ ව්‍යවහාරික මුදල් තැන්පතු වලින් ලත් මුදල් ප්‍රමාණයෙන් වැඩි කොටසක් දේශීය බැංකු ඒකක විසින් විදේශ ව්‍යවහාරික මුදල් බැංකු ඒකකයන්හි ආයෝජනය කර ඇත. ප්‍රායෝගික වශයෙන්, මෙම විදේශ ව්‍යවහාරික මුදල් බැංකු ඒකක නේවාසික ආයතන වේ. එබැවින් ප්‍රායෝගිකව, මෙම තැන්පත් දැනට විදේශ වත්කම් වශයෙන් නොව දේශීය වත්කම් ලෙස සැලකිය යුතු වේ. ලංකාවේ බැංකු පද්ධතියේ විදේශීය සමස්ත ණයගැති භාවය සැලකීමේදී අදාල විනුයේ ව්‍යවහාර මුදල් බැංකු ඒකක හා දේශීය බැංකු ඒකක යන දෙකොටසේම ඇති අනේවාසිකයන්ට දී ඇති විදේශ ශුද්ධ ණය ගැතිභාවයේ එකතුව වේ. මෙම ශුද්ධ ණය ගැතිභාවයේ එකතුව වත්මන් මූල්‍ය සමීක්ෂණයෙන් පිළිබිඹු නොවේ. මෙයට හේතුව වන්නේ වත්මන් ක්‍රමයේදී සම්මත 'නේවාසික - නේවාසික නොවන' හිමිකම් පදනම මත නොව, තැන්පතු පවත්වාගෙන යන ව්‍යවහාරික මුදල් වර්ගය අනුව නේවාසික නොවන විදේශ ව්‍යවහාරික මුදල් තැන්පතු වලට අදාල වත්කම් බැරකම් වර්ගීකරණය කිරීමයි.

මේ හේතු නිසා, සංශෝධිත මූල්‍ය සමීක්ෂණයක් සකසා ඇත.

### විදේශ ව්‍යවහාරික මුදල් බැංකු ඒකක අන්තර්ගත මූල්‍ය සමීක්ෂණය

විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක නේවාසික නොවන ආයතන ලෙස සලකන අර්ථ දැක්වීම් මත පදනම්ව වත්මන් දේශීය මූල්‍ය සමීක්ෂණය (දේමූස) සකසනු ලැබේ. මෙම විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක මූල්‍ය සමීක්ෂණයට ඇතුලත් කිරීමේදී, එම බැංකු ඒකක නේවාසික ආයතන ලෙස සලකනු ඇත. එබැවින් දේමූස තුළ ඇති දේශීය බැංකු ඒකකයනට අදාල යම් අයිතමයන් ප්‍රතිවර්ගීකරණය කිරීම අවශ්‍ය වනු ඇත. එබැවින් දේමූස හි පහත සඳහන් උපකොටස් ප්‍රතිවර්ගීකරණය කර ඇත.

**සංඛ්‍යා සටහන**
**මූල්‍ය සමීක්ෂණයන් සැසඳීම**

රුපියල් දශ ලක්ෂ

| | පවතින | | | යෝජිත | | |
|---|---|---|---|---|---|---|
| | 1994 දෙසැ. | 1995 දෙසැ. | 1996 දෙසැ. | 1994 දෙසැ. | 1995 දෙසැ. | 1996 දෙසැ. |
| මුළු පුළුල් මුදල් සැපයුම ($M_2^+$) | 191,672 | 228,537 | 253,201 | 214,306 | 259,442 | 288,657 |
| පටු මුදල් සැපයුම ($M_1$) | 70,463 | 75,218 | 78,203 | 70,463 | 75,218 | 78,203 |
| ව්‍යවහාර මුදල් | 38,906 | 42,199 | 42,565 | 38,906 | 42,199 | 42,565 |
| ඉල්ලුම් තැන්පතු | 31,557 | 33,019 | 35,638 | 31,557 | 33,019 | 35,638 |
| ආරූඪ මුදල් | 121,209 | 153,319 | 174,998 | 143,843 | 184,224 | 210,454 |
| දේ.බැ.ඒ. | 121,209 | 153,319 | 174,998 | 136,734 | 171,157 | 195,672 |
| වි.ව.මු.බැ.ඒ. | | | | 7,109 | 13,067 | 14,782 |
| ශුද්ධ විදේශ වත්කම් | 64,467 | 66,532 | 61,861 | 58,760 | 64,745 | 63,319 |
| මූල්‍ය බලධාරීහු | 65,864 | 74,301 | 73,786 | 64,571 | 73,662 | 73,786 |
| වාණිජ බැංකු | (1,397) | (7,769) | (11,925) | (5,811) | (8,917) | (10,467) |
| දේ.බැ.ඒ. | (1397) | (7,769) | (11,925) | 393 | (3,037) | (4,186) |
| වි.ව.මු.බැ.ඒ. | | | | (6,204) | (5,880) | (6,281) |
| ශුද්ධ දේශීය වත්කම් | 127,205 | 162,005 | 191,339 | 155,546 | 194,696 | 225,334 |
| දේශීය ණය | 173,795 | 223,799 | 252,317 | 206,047 | 262,670 | 292,395 |
| රාජ්‍ය ණය (ශුද්ධ) | 28,148 | 35,215 | 47,558 | 30,882 | 38,430 | 46,152 |
| මූල්‍ය බලධාරීහු | 16,756 | 24,418 | 34,291 | 16,756 | 24,418 | 34,291 |
| වාණිජ බැංකු | 11,392 | 10,797 | 13,267 | 14,126 | 14,012 | 11,861 |
| දේ.බැ.ඒ. | 11,392 | 10,797 | 13,267 | 11,392 | 10,797 | 13,267 |
| වි.ව.මු.බැ.ඒ. | | | | 2,734 | 3,215 | (1,406) |
| රාජ්‍ය සංස්ථා ණය | 5,163 | 8,527 | 9,938 | 11,407 | 13,305 | 15,491 |
| දේ. බැ. ඒ. | 5,163 | 8,527 | 9,938 | 5,163 | 8,527 | 9,938 |
| වි.ව.මු.බැ.ඒ. | | | | 6,244 | 4,778 | 5,553 |
| පෞද්ගලික අංශ ණය | 140,484 | 180,057 | 194,821 | 163,758 | 210,935 | 230,752 |
| දේ.බැ.ඒ. | 140,484 | 180,057 | 194,821 | 140,484 | 180,057 | 194,821 |
| වි.ව.මු.බැ.ඒ. | | | | 23,274 | 30,878 | 35,931 |
| අනෙකුත් (ශුද්ධ) | (46,590) | (61,794) | (60,978) | (50,501) | (67,974) | (67,061) |
| දේ.බැ.ඒ. | (46,590) | (61,794) | (60,978) | (31,562) | (48,049) | (48,043) |
| වි.ව.මු.බැ.ඒ. | | | | (18,939) | (19,925) | (19,018) |
| සටහන් අයිතමයන් | | | | | | |
| සංචිත මුදල් | 68,055 | 78,587 | 85,509 | 68,055 | 78,587 | 85,509 |
| මූල්‍ය බලධාරීන්ගේ ශුද්ධ දේශීය වත්කම | 2,191 | 4,286 | 11,723 | 2,191 | 4,286 | 11,723 |
| මුදල් ගුණකය | 2.82 | 2.91 | 2.96 | 3.15 | 3.30 | 3.38 |
| දෙසැම්බර් සිට දෙසැම්බර් වෙනස % | | | | | | |
| මුළු මුදල් සැපයුම | 19.7 | 19.2 | 10.8 | 18.7 | 21.1 | 11.3 |
| ශුද්ධ විදේශ වත්කම් | 34.0 | 3.2 | (7.0) | 40.4 | 10.2 | (2.2) |
| ශුද්ධ දේශීය වත්කම් | 13.6 | 27.4 | 18.1 | 12.2 | 25.2 | 15.7 |
| රාජ්‍ය ණය (ශුද්ධ) | 4.3 | 25.1 | 35.1 | 3.7 | 24.4 | 20.1 |
| රාජ්‍ය සංස්ථා ණය | (33.6) | 65.2 | 16.5 | (26.0) | 16.6 | 16.4 |
| පෞද්ගලික ණය | 21.2 | 28.2 | 8.2 | 22.0 | 28.8 | 9.4 |
| වෙනත් ශුද්ධ | 20.5 | 32.6 | 1.3 | (24.0) | (34.6) | 1.3 |

දේ.බැ.ඒ. = දේශීය බැංකු ඒකක
වි.ව.මු.බැ.ඒ. = විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක

මූලාශ්‍ය : ශ්‍රී ලංකා මහ බැංකුව

*දේශීය ඒකක මගින් විදේශ ව්‍යවහාරික මුදල් බැංකු ඒකකයන් හි කෙරෙන ආයෝජන :* සියළුම වාණිජ බැංකු අනේවාසික විදේශ ව්‍යවහාරික මුදල් අරමුදල් තම විදේශ ව්‍යවහාරික මුදල් බැංකු ඒකක මාර්ගයෙන් ආයෝජනය කරති. මෙ ක්‍රමය දී මෙම ආයෝජන විදේශ වත්කම් ලෙස සැලකේ. එහෙත් විදේශ ව්‍යවහාරික මුදල් බැංකු ඒකක දේශීය ආයතන ලෙස සැලකීමත් සමඟ මෙම ආයෝජන විදේශ ව්‍යවහාර මුදල් වලින් ප්‍රකාශිත දේශීය වත්කම් ලෙස සලකනු ඇත. විදේශීය වත්කම් ද්විගණනය වීම වැලැක්වීම සඳහා, විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් නේවාසික නොවන්නන් සමඟ කළ අවසන් ආයෝජන ප්‍රමාණක් විදේශ වත්කම් ලෙස සැලකිය යුතුය. මෙම ගැලපීමේ ප්‍රතිඵලය වනුයේ දැනට ක්‍රමය ට අනුව සඳහන් වන දළ විදේශීය වත්කම් අගය අඩු වීමකි.

*අනේවාසික විදේශ ව්‍යවහාරික මුදල් තැන්පතු ශේෂ :* වත්මන් ක්‍රමය ට අනුව අනේවාසික විදේශ ව්‍යවහාරික මුදල් තැන්පතු ශේෂ විදේශ බැරකම් ලෙස සැලකේ. වාණිජ බැංකු දත්තයන් අනුව, නේවාසික නොවන විදේශ ව්‍යවහාරික මුදල් තැන්පතු හිමිකරුවන් ගෙන් සියයට 51 ක් පමණ ලංකාව තුළ පදිංචි වී සිටිති. එබැවින් මෙම තැන්පතු සත්‍යයෙන්ම දේශීය ආර්ථිකයේ විදේශ බැරකම් නොවනු ඇත. එබැවින්, මෙම නේවාසික නොවන විදේශ ව්‍යවහාරික මුදල් තැන්පතු වලින් කොටසක් (සියයට 50 ක්) දේශීය තැන්පතු ලෙස සලකන අතර, එනිසා පුළුල් මුදල් හි ($M_2$) කොටසක් ලෙස සැලකේ. ඉතිරිය (එනම් නේවාසික නොවන්නට හිමි තැන්පතු) විදේශීය බැරකම් ලෙස සැලකේ. මෙම ගැලපීමෙහි ප්‍රතිඵල වනුයේ දැනට ක්‍රමය හි සඳහන් වන මට්ටම්

වල සිට පුළුල් මුදල් ප්‍රමාණය වැඩිවීමත් විදේශීය බැරකම් අඩුවීමත්ය.

වාණිජ බැංකු වල දේශීය ඒකකයන් පිළිබඳ දත්තයන් පමණක් අඩංගු වත්මන් මූල්‍ය සමීක්ෂණයත් ඒකාබද්ධ මූල්‍ය සමීක්ෂණයත් අතර පහත සඳහන් ප්‍රධාන වෙනස්කම් ඇත.

*වඩා ඉහළ පුළුල් මුදල් ($M_2$) මට්ටමක් :* විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි පවතින ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාකරන හා වෙනත් අවසරලත් ගනුදෙනු කරුවන්ගේ තැන්පතු ඇතුලත් කිරීම හා අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ප්‍රතිනිර්වචනය කිරීම නිසා පුළුල් මුදල් ($M_2$) ප්‍රමාණය වැඩි වනු ඇත. 1996 වසර අවසානයේ දී පුළුල් මුදල් හි වර්ධනය වත්මන් මුදල් සමීක්ෂණය අනුව දක්වන සියයට 10.8 ට සාපේක්ෂව සියයට 11.3 ක් වනු ඇත.

*ශුද්ධ විදේශ වත්කම් පිළිබඳව වඩා අදාල ඇස්තමේන්තුවක් :* විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි දත්තයන් අන්තර්ගත කිරීම හා නේවාසික නොවන විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු කොටසක් ප්‍රතිවර්ගීකරණය කිරීම, වාණිජ බැංකුවල ශුද්ධ විදේශ වත්කම් අගයෙහි වෙනසක් ඇති කෙරේ. මෙය බැංකු අංශයෙහි ශුද්ධ විදේශ වත්කම් පිළිබඳ සම්පූර්ණ තත්ත්වය නිරූපණය කරයි. මේ අනුව 1996 වසරේ දී බැංකු අංශයේ ශුද්ධ විදේශ වත්කම් සියයට 2.2 කින් පහත වැටෙනු ඇත. සංශෝධනයන්ට පෙර, මෙම පහත වැටීම සියයට 7 ක් විය.

*ශුද්ධ දේශීය වත්කම් අගය ඉහළ යෑම :* විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් රාජ්‍ය අංශයටත්, පුද්ගලික අංශයටත් සැපයූ ණය අන්තර්ගත වීම නිසා වාණිජ බැංකුවල ශුද්ධ වත්කම් අගය වැඩිවේ.

*වඩා විශාල මුදල් ගුණකයක් :* යෝජිත මුදල් සමීක්ෂණයෙහි ආර්ථික ක්‍රියා මූල්‍යකරණය වඩා තාත්වික ලෙස අන්තර්ගත වේ. ඒකාබද්ධ මුදල් සමීක්ෂණය මගින් පුළුල් මුදල් හි සංකල්පාත්මක නිර්වචනය පිළිබඳ වෙනසකින් තොරවම, පුළුල් මුදල් තොගය ප්‍රසාරණය වී ඇත (එනම්, සංශෝධිත මුදල් සමීක්ෂණය අනුවද, පටු මුදල් සැපයුමෙන් මහජනයා සතු කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු ප්‍රමාණයේත් එකතුව ලෙස පුළුල් මුදල් සැපයුම නිර්වචනය කෙරේ. එහෙත් දැන් එය තුළ, විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන් වෙතැති ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාකරන හා වෙනත් අවසරලත් ගනුදෙනු කරුවන්ගේ ද තැන්පතු අඩංගු වේ.) එහෙත් සංචිත මුදල් (පදනම් මුදල් හෝ අධි බලැති මුදල්) ප්‍රමාණය නොවෙනස්ව පවතින බැවින්, මුදල් ගුණකයෙහි වැඩිවීමක් සිදුවේ. සංකල්පාත්මකව තැන්පතු වලට අතැති මුදල් දරණ අනුපාතයේ අඩුවීමක් හා සමස්ත සඵල ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයේ අඩුවීමත් (විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක තැන්පතු මත සංචිත අනුපාතයක් යොදවා නොමැති බැවින්) හේතු කොටගෙන මෙම වැඩිවීම සිදු වේ.

වල දී භාණ්ඩාගාර බිල්පත් සැලකිය යුතු ප්‍රමාණයක් මිලදී ගත්තේය. පසුව ද්විතීයික කවුළුව තුළින් මෙම බිල්පත් වෙළෙඳපොලට විකුණන ලදී. ප්‍රධාන වශයෙන් තාවකාලික අත්තිකාරම්හි රුපියල් දශලක්ෂ 3,759 ක වැඩිවීමක් පෙන්නුම් කරමින්, වසරේ මුල් භාගය අවසානයේදී, මහබැංකුව විසින් රජයට දුන් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,841 න් වැඩි වී තිබුණි. රජයේ වියදම් වැඩිවීමත්, පුද්ගලීකරණයෙන් ලත් මුදල් ප්‍රමාණයෙහි හිඟයක් ඇතිවීමත් සමග රජයේ මූල්‍යකරණ අවශ්‍යතාවන්හි කොටසක් සැපයීමට මහ බැංකුවට සිදුවීම නිසා, දෙසැම්බර් මස අවසන් වන විට රජයට දුන් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 9,873 කින් වැඩි විය. නිකුත් කර ඇති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද රුපියල් දශලක්ෂ 125,000 සීමාවට පැමිණීම හේතුකොට ගෙන, 1996 වසරේ ඔක්තෝබර් මසට පසු භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමෙන් රජයේ සෘජු ලෙස ණය ලබාගැනීම කෙරේ සීමා පැණවුනි. අඩු ඵලදායීතාවක් ඇති වියදම් අඩු කිරීමට හා අයවැය හිඟය සීමාකිරීමට උපකාරී වීමෙන් භාණ්ඩාගාර බිල්පත් නිකුතුව සඳහා වූ මෙම සීමාව මූල්‍ය කළමනාකරණය පිළිබඳ යම් විනයක් ඇති කළේය. ඊට අමතරව 1995 වසරේ පැවති පොලී අනුපාතික මට්ටම් වලට වඩා පහත් මට්ටමක 1996 වසරේ භාණ්ඩාගාර බිල්පත්හි පොලී අනුපාතිකයන් දිගින් දිගටම පවත්වාගෙන යෑමට තුඩු දුන් එක් සාධකයක් වූයේ මෙම සීමාවය. රජයේ මූල්‍යකරණ අවශ්‍යතාවයන්හි කොටසක් සපුරාලන ලද්දේ පරිපාලන ණය ගැනීම්, එනම් යම් රජයේ ආයතන වෙත තිබූ අතිරික්ත මුදල් ප්‍රමාණයන් සෘජු ලෙස භාවිතා කිරීම .මගිනි.

විවට වෙළඳපොළ කටයුතු සඳහා මහ බැංකුව වෙත තිබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණවත් විය. එබැවින් විවට වෙළඳපොළ කටයුතු සඳහා මහ බැංකුවට තම සුරැකුම් පත් නිකුත් කිරීමට අවශ්‍යතාවක් ඇති නොවිය. දිගින් දිගටම, මහ බැංකුව මුදල් වෙළඳපොළෙහි ක්‍රියාකාරීත්වය පරීක්ෂා කර, ඒකෂණ මුදල් පොලී අනුපාතිකයන්හි විචලතාවය අඩුකිරීමේ අරමුණින් ප්‍රති විකුණුම් සහ ද්විතික වෙළඳ පොළේ ගනුදෙනු සඳහා අදාල පොලී අනුපාතිකයන්හි ගැලපීම් ඇති කළේය. එහෙර ආයෝජනය කළ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු හැර, අන් සියළුම තැන්පතු සඳහා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 15 ක පවත්වාගෙන යන ලදී. එහෙර ආයෝජනය කළ විදේශ ව්‍යවහාර මුදල්. තැන්පතු සඳහා මෙම සංචිත අනුපාතය සියයට 5 ක අඩු මට්ටමක පැවතුනි. මධ්‍ය හෝ දිගකාලීන අරමුදල යටතේ හෝ මහ බැංකුවේ කෙටිකාලීන ප්‍රතිමූල්‍ය ක්‍රම යටතේ හෝ ප්‍රතිමූල්‍ය පහසුකම් නොදෙන ලදී.

වසරේ අවසාන කොටසේ දී මුදල් සැපයුමේ වර්ධනය අඩුවීමත් මිල මට්ටම් වල ඉහල යාම ක්‍රමයෙන් පහත වැටීමත් සමග, මූල්‍ය වෙළඳපොළ හා විනිමය වෙළඳපොළ වඩා ස්ථායී විය. කෙටිකාලීන පොලී අනුපාතිකයන්හි උච්චාවචන සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු විය. වාණිජ බැංකුවල කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු සියයට 15 කින් වැඩි විය. නේවාසික නොවන විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සියයට 16 කින් වැඩි විය. වසරේ අවසාන කොටසේදී ආර්ථිකය ඉක්මණින් යථා තත්ත්වයට පත්වෙමින් පැවති නිසාත්, උද්ධමන පීඩනය සැලකියයුතු තරම් අඩුවී තිබුන නිසාත්, මහ බැංකුව, මූල්‍ය ප්‍රතිපත්තියෙහි යෝග්‍ය ලිහිල් කිරීමක් පිළිබඳව සලකා බලමින් සිටියේය. මෙම සලකා බලමින් පැවති ලිහිල් කිරීම තුල ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයේ අඩු කිරීමක් හා ආයෝජන මණ්ඩලය යටතට නොපැමිණෙන අපනයන කරුවන්ට විදේශ ව්‍යවහාර මුදල් ණය ලබා ගැනීමට අවසර දීමක් අඩංගු විය. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සුදුසු මට්ටමකට ක්‍රමිකව අඩු කිරීම මගින් විවට වෙළෙඳ පොළ කටයුතු වැනි වෙළෙඳපොළ ආශ්‍රිත උපකරණ, මුදල් සැපයුම ක්‍රමවත් කිරීම සඳහා යොද ගැනීමට මහ බැංකුවට හැකිවේ යයි අදහස් කෙරුණි.

## 10.3 පොලී අනුපාතික


1996 වර්ෂයේදී 1995 වසරට වඩා පොලී අනුපාතික සාමාන්‍ය වශයෙන්, පහත මට්ටමක පැවති අතර, උච්චාවචනයන් බෙහෙවින් අඩුවිය. ප්‍රථම මාස

කීපය තුල රජයේ කටයුතු සහ ශුද්ධ විදේශීය වත්කම් ප්‍රවාහ හේතු කරගෙන වෙළඳපොල ද්‍රවශීලිතාවය වර්ධනය විමත් සමග, 1996 වසරෙහි මුල් කාලයේදී කෙටි කාලීන පොලී අනුපාතික තියුණු ලෙස පහත වැටුනි. ඉන්පසුව ණය සඳහා රජයේ ඉල්ලුම වැඩිවීම සහ ගෙවුම් තුලන හිඟයක් සමග, නොවැම්බර් මස මැද වනතුරු අනුපාතික ක්‍රමයෙන් වේගයෙන් ඉහල නැගුනි. වසර අවසානයේදී නැවතත් පොලී අනුපාතික පහත වැටීමක් දක්නට ලැබුනි. මෙම ප්‍රවනතාවයන්ට අනුකූලව, මධ්‍ය සහ දීර්ඝකාලීන පොලී අනුපාතිකද වර්ෂය තුලදී සාපේක්ෂ වශයෙන් ස්ථායීව පැවතුනි.

## කෙටිකාලීන පොලී අනුපාතික

1995 අවසාන කාර්තුවේදී පොලී අනුපාතික ඉතා ඉහළ මට්ටමක පැවතිම සහ උච්චාවචනයට ලක්වීම හා සසඳන කල, 1996 ප්‍රථම මාස කීපය තුල පැවති අධි ද්‍රවශීලතාවය හේතුවෙන්, පොලී අනුපාතික වේගයෙන් පහත වැටුනි. ප්‍රථම දෙමස තුල රජයේ ද්‍රවශීලතාවයෙහි කාලීන වැඩිවීම සහ එම කාලය තුල ගෙවුම් තුලනයේ ඇතිවූ සැලකිය යුතු අතිරික්තය මෙයට හේතු විය. වාණිජ බැංකු වෙතින් විදේශ විනිමය මිලදී ගැනීම රජයට මහ බැංකුවෙන් දෙන ලද තාවකාලික අත්තිකාරම් වැඩිවීම සහ මහ බැංකුවේ ලාභ කොටසක් රජය වෙත පැවරීම මගින්, මහ බැංකුව විසින් රුපියල් අරමුදල් සැපයීම වර්ධනය විමට හේතු විය. භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි වල දක්නට වූ විශාල අධිදායක විම මගින් වෙළඳපොලේ ද්‍රවශීලතාවය පිළිබිඹු කෙරිනි. මෙහි ප්‍රතිපලයක් ලෙස සියළුම කල්පිරීම් සඳහාවූ භාණ්ඩාගාර බිල්පත් වල බර තැබූ සාමාන්‍ය පලදා අනුපාතික 1995 අවසානයේදී වූ සියයට 19.2-18.97 ක පරාසයක සිට 1996 මාර්තු මසදී සියයට 11.98 - 14.40 ක අඩු පරාසයකට තියුණු ලෙස පහත වැටුනි. මෑත අතීතයේ දක්නට වූ වාරික ප්‍රවනතාවය පිළිබිඹු කරමින් මෙම අඩුවීම කෙටි කාලීන බිල්පත් පිළිබඳව වඩත් කැපී පෙණුනි. 1995 අගදී සියයට 20.00 - 58.00 ක සිට 1996 මාර්තු අවසානයේදී සියයට 9.80 - 10.80 දක්වා වඩාත් තියුණු ලෙස පහත වැටුණු. ඒක්ෂන මුදල් වෙළඳපොලේ පොලී අනුපාතිකයන්හිද මෙම අඩුවීම පිළිබිඹු විය. ප්‍රාථමික වෙළඳපොල පොලී අනුපාතිකයන්හි දක්නට ලැබුණු ප්‍රවනතාවය අනුව, ප්‍රතිමිලදී ගැණුම් වෙළෙඳපොලෙහි මහ බැංකුවේ ගණුදෙනු සඳහා අදාල පොලී අනුපාතික සහ ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළඳ පොලෙහි පොලී අනුපාතිකද අඩුවිය. වෙළඳපොලෙහි ද්‍රවශීලතා තත්වයන් සහ ප්‍රාථමික වෙළඳපොලෙහි එලදාවන් සැලකිල්ලට ගනිමින්, මහ

**රූප සටහන 10.3**
**පොලී අනුපාතික**



බැංකුව විසින් නොකඩවා. එක් දින ප්‍රති මිලදී ගැනීම් පොලී අනුපාතිකය සහ ද්විතියික වෙළඳපොල පොලී අනුපාතිකයන් නිර්ණය කරනු ලැබිය. මේ අනුව එක් දින ප්‍රති මිලදී ගැනුම් පොලී අනුපාතිකයන් 1995 අගදී පැවති සියයට 16.50 සිට 1996 ප්‍රථම කාර්තුව තුලදී සියයට 9.50 දක්වා අඩු කෙරිනි. එලෙසම 1995 අවසානයේදී සියයට 19.01 ක්වූ ත්‍රෛමාසික වට්ටම් අනුපාතිකය 1996 මාර්තු මැද භාගයේදී සියයට 10.98 ක් දක්වා අඩුකරන ලදී. රජයේ ණයගැනීම් වැඩිවීම, ආරක්ෂක වියදම් ඉහල නැගීමෙන්, අයවැය හිගය පුලුල් වෙතැයි වෙළඳපොලෙහි ඇතිවූ අපේක්ෂා, ගෙවුම් තුලන හිගය සහ විදුලිබලය කපාහැරීම නියා පීඩාවට පත් ආයතන වල අතිරේක ද්‍රවශීල අවශ්‍යතා ප්‍රධාන වශයෙන් හේතුවීමෙන් මාර්තු මසට පසුව පොලී අනුපාතිකයන් ඉහළ යෑමේ නැඹුරුවක් දක්නට ලැබුනි.

ජුනි මස අගදී භාණ්ඩාගාර බිල්පත් අනුපාතික ක්‍රමයෙන් සියයට 15.21 - 15.66 පරාසයකට ඉහල නැගුනි. මෙම ප්‍රවනතාවය අනුව යමින්, ජුනි මස අගදී ඒක්ෂණ මුදල් වෙළඳපොලේ පොලී අනුපාතිකය සියට 14.00 - 17.50 දක්වා පරාසයකට වැඩි විය. මේ අතරතුර, ප්‍රාථමික වෙළඳපොලෙහි ඵලදාවත් වැඩිවීමට අනුකූලව ද්විතිය භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලෙහි, මහ බැංකුවේ වට්ටම් සහ ප්‍රති වට්ටම් අනුපාතික ද වැඩිවීමට ඉඩ දෙන ලදී. මේ අනුව, ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් වල වට්ටම් සහ ප්‍රති වට්ටම් අනුපාතික, ජුනි මස අගදී පිළිවෙලින් සියයට 14.96 සහ සියයට 17.46 ක් විය. එලෙසම, ප්‍රතිමිලදී ගැනීම් පොලී අනුපාතිකය මැයි මසදී සියයට 11.75 දක්වාද, ඉන්පසුව ජුනිමසදී සියයට 12.75 දක්වා ඉහල නැගුණි.

1996 දෙවන භාගයේදී නොවැම්බර් මස මැද වනතුරු පොලී අනුපාතිකයන්හි ක්‍රමික ඉහළ නැගීමක් අඛණ්ඩව පැවතුනු අතර, ඉන්පසු එම අනුපාතික පහත වැටීමට පටන් ගැණින. ත්‍රෛමාසික බිල්පත්වල බර තැබූ සාමාන්‍ය ඵලදාව ජනවාරි මාසයේ සිට දක්නට වූ ඉහළම අගය වූ සියයට 18.25 දක්වා ඉහළ නැගුනු අතර, දොළොස් මාසික පොලී අනුපාතිකය සියයට 17.98 දක්වා වැඩිවිය. කෙසේ වෙතත් ඉන්පසුව, භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයන් අඩුවී 1996 අගදී සියයට 17.45 සිට 17.38 දක්වා පරාසයකට පහත වැටුනි. දෙවන භාගයේදී ඒක්ෂණ මුදල් වෙළඳපොළේ පොලී අනුපාතිකයන් සියයට 12.00 - 35.00 දක්වා පරාසයකට වැඩිවෙමින්, ඉහළ මට්ටමක පැවතීමේ නැඹුරුවක් පෙන්විය. භාණ්ඩාගාර පොලී අනුපාතික මෙන්ම ඒක්ෂණ මුදල් වෙළඳපොලෙහි පොලී අනුපාතිකද අඩුවීමේ නැඹුරුවක් දෙසැම්බර් මස දක්නට ලැබුනි. 1996 අවසානයේදී ඒක්ෂණ මුදල් වෙළඳපොලෙහි පොලී අනුපාතික සියයට 17.50 - 28.00 ක් පරාසයක පැවතුනි.

අනෙකුත් කෙටිකාලීන පොලී අනුපාතිකයන් සමග වෙනස් වෙමින් වාණිජ බැංකුවල සාමාන්‍ය බර තැබූ ප්‍රමුඛ ණයදීමේ පොලී අනුපාතිකයද 1995 අගදී පැවති සියයට 20.10 සිට 1996 මාර්තු අවසානයේදී සියයට 16.9 දක්වා පහත වැටී ජුනි මස අගදී සියයට 17.4 ක් දක්වා වැඩි විය. මෙම පොලී අනුපාතිකය 1996 දෙසැම්බර් අගදී සියයට 20.2 ක්ව පැවතුනි.

කෙටි කාලීන පොලී අනුපාතික පහතබැසීමේ ප්‍රවණතාව අනුව යමින් ජාතික ඉතිරිකිරීමේ බැංකව විසින් එහි දොළොස් මාසික තැන්පතු සඳහා වූ පොලී අනුපාතිකය 1995 දෙසැම්බර් අවසානයේදී වූ සියයට 16.00 සිට 1996 මාර්තු මස සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 15.00 දක්වා අඩු කරන ලදී.

## දිගු කාලීන අනුපාතික

වෙළෙඳපොළ මගින් නිර්ණය නොවුවද රාජ්‍ය සුරැකුම්පත් (රුපියල් ණය) මගින්ද, දිගු කාලීන පොලී අනුපාතිකයන්හි වෙනස්වීමේ ප්‍රවනතා පිළිබඳව යම් පෙන්වාදීමක් සිදුකෙරේ. අවුරුදු 4-6 සහ අවුරුදු 5-7 පරිණත කාලයක් ඇති රුපියල් ණය සියයට 14 ක පොලී අනුපාතිකයක් දැරූ අතර අවුරුදු 7-8 ක පරිණතකාලයක් සහිත රුපියල් සුරැකුම්පත් සියයට 13 ක පොලී අනුපාතිකයක් සහිතව නිකුත් කරන ලදී. වෙළෙඳපොළ ඉල්ලුමට ප්‍රතිචාරයක් ලෙස වාර්ෂිකව සියයට 15.00 ක පොලී අනුපාතිකයක් ඇති වසර දෙකක රුපියල් ණයක් නිකුත් කරන ලදී. ඒ හැරුණු විට රජයේ උපදෙස් මත දුන් නොගෙවා පැහැර හරින ලද ණය හිලව්වීම සඳහා රජය විසින් රාජ්‍ය බැංකු දෙකට පිළිණ පත් නිකුත් කරන ලදී. මෙම පිළිණපත්වල පරිණත කාලය අවුරුදු 10 ක් වන අතර වාර්ෂික කූපන් පොලී අනුපාතිකය සියයට 14 ක් විය. පසුගිය කාලයේ පොලී සහනාධාර සහ පරිපාලනමය ණය ගැනීම් වෙනුවෙන් රජය විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවටද වාර්ෂිකව සියයට 14 ක්වූ මීට සමාන බැඳුම්කර නිකුත් කරන ලදී.

සමහර ලැයිස්තුගත පොදු සමාගම් විසින් දිගු කාලීන සුරැකුම්පත් නිකුත් කරන ලදී. සීමාසහිත ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව වාර්ෂිකව සියයට 17.54 ක පොලී අනුපාතිකයන් සහිත වර්ෂ 4 ණයකර නිකුත් කළ අතර සීමාසහිත වණික් ඉන්කෝපරේෂන් වාර්ෂිකව සියයට 20 ක වර්ෂ 3ක පොදු ණයකර නිකුතුවක් කළේය. පෞද්ගලික අංශයෙහි සුරැකුම්පත් සඳහා මගපෙන්වීමේ පොලී අනුපාතිකයන් ලෙස භාවිතා කිරීමට රාජ්‍ය ණය උපකරණය සඳහා මධ්‍යකාලීන වෙළෙඳ පොළ මගින් නිර්ණය කරනු ලබන පොලී අනුපාතිකයන් නොපැවතීම, මෙම ඉහළ මට්ටමක පැවතුණු පොලී අනුපාතික මගින් පිළිබඹු කළ බවක් පෙනුනි.

මහජන බැංකුව විසින් සුමක ණය සඳහා එකී ණය දීමේ අනුපාතිකය සියයට 18.5 සිට මාර්තු මසදී සියයට 16.0 දක්වා ප්‍රතිශතාංක 2.5 කින් අඩු කරන ලද අතර, ලංකා බැංකුව විසින් එහි මෙම ණය සඳහා පොලී අනුපාතිකය සියයට 19 සිට සියයට 17.5 දක්වා ප්‍රතිශතාංක 1.5 කින් පහත දමන ලදී.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ජාතික සංවර්ධන බැංකුව යන දිගුකාලීන ණය දෙන ආයතනවල ණය දීමේ අනුපාතික පහත වැටීමේ ප්‍රවණතාවය පෙන්නුම් කළ අතර ආයතන කිහිපයක් සිය පොලී අනුපාතික 1995 වසරේ පැවැති මට්ටමේ පවත්වා ගෙන ගියහ. රාජ්‍ය ආයෝජන සහ උකස් බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ණය දීමේ පොලී අනුපාතික පිළිවෙලින් සියයට 17.00 - 22.00 සහ සියයට 17.00-20.00 ක පරාසයක නොවෙනස්ව පැවතුණි. මේ අතර, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ණය දීමේ අනුපාතික 1995 වසර අගදී පැවති සියයට 20.5 සිට 1996 ජනවාරි මාසයේදී සියයට 15.0 දක්වා පහත දමනු ලැබූ අතර, වසර තුළදී ණය පොලී අනුපාතික පරාසය සියයට 10.00-15.00 ක නොවෙනස්ව පැවතුණි. ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවේ ණය පොලී අනුපාතික සියයට 20.00 සිට සියයට 16.00 දක්වා අඩු කෙරුණි. මේ අතර, පසුගිය වසරේ සියයට 12.5-26.0 පරාසයක පැවති ජාතික සංවර්ධන බැංකුවේ ණය පොලී අනුපාතික, ඊට සංසන්දනාත්මකව 1996 දී සියයට 11.90-26.00 පරාසයක පැවතුණි.

## 10.4 වාණිජ බැංකු කටයුතු

කෘෂිකාර්මික හා කාර්මික අංශවල නිෂ්පාදනයෙහි වසර මැද ඇති වූ පසුබෑසීමක්, අක්‍රිය ණයෙහි යම් වර්ධනයක් සහ ආරක්ෂිත තත්ත්වය හා සම්බන්ධ අවිනිශ්චිතතාවයන්ගෙන් යුතුවූ, තරමක අස්ථිර තත්ත්වයක් තුළ, වාණිජ බැංකු සිය ණය දීමේ කටයුතුවලදී, වඩාත් සූපරීක්ෂාකාරී වෙමින්, සිය වත්කම් පද්ධතියේ වැඩි කොටසක් අවදානම් අඩුවත්කම් වන භාණ්ඩාගාර බිල්පත් (වර්ෂය තුළ සියයට 34 ක වර්ධනයක් දක්වා ඇත.) සහ රුපියල් ණය ලෙස තබාගත් අතර, අධිරාවන් වෙනසක් නොවියැයි කිවහැකි ප්‍රමාණයකින් (සියයට 2 කින් පමණ වැඩිවීමක්) තබා ගනු ලැබිණ. වාණිජ බැංකු අංශයෙහි වත්කම්හි මුලු වැඩිවීමෙන් සියයට 26 ක්, ද්‍රවශීල වත්කම් සඳහා වෙන්කළ අතර, 1995 දී මීට සංසන්දනාත්මක ප්‍රතිශතය වූයේ සියයට 10 කි. 1996 දී වාණිජ බැංකු සතු මුලු වත්කම් සියයට 16.2 කින් වැඩිවූ අතර, 1995 දී රුපියල් දශලක්ෂ 4,186 කින් අඩුවූ භාණ්ඩාගාර බිල්පත්හි කළ ආයෝජන, 1996 දී රුපියල් දශලක්ෂ 4,066 කින් වැඩි විය.

අඛණ්ඩව පවත්වාගෙන ගිය දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය, නියගය හා විදුලිබල කපා හැරීම් සහ ආරක්ෂක හේතු නිසා කෘෂිකර්ම හා කාර්මික නිෂ්පාදනයන් පසුබෑමකට ලක්ව තිබියදීත්, වාණිජ බැංකුවල මුලුවත්කම් පසුගිය වර්ෂයේ මීට අනුරූප වර්ධනය වූ සියයට 19 ක ඉහළ නැගීම හා සසඳන විට1996 සියයට 16.2 කින් වැඩි වියමෙ අතර, ද්‍රවශීල වත්කම් 1995 වර්ෂයේ සියයට 7 වර්ධනයට සංසන්දනාත්මකව 1996 දී සියයට 16.8 කින් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 1995 වර්ෂය අවසානයේදී සියයට 19.6 ක් වූ ද්‍රවශීලවත්කම් හා ඉල්ලුම් තැන්පතු අතර අනුපාතය 1996 වසර අවසානයේදී සියයට 20.0 දක්වා වැඩි විය.

### වත්කම් හා වගකීම් ව්‍යුහය

1995 දී දක්නට වූ සියයට 19 (රුපියල් දශලක්ෂ 43,772) ක වර්ධනයක් හා සැසඳීමේදී වාණිජ බැංකුවල මුලු සම්පත් 1996 දී සියයට 16.2 (රුපියල් දශලක්ෂ 54,283) කින් ඉහළ නැගිය. 1996 වර්ෂය මැදදී ආර්ථික ක්‍රියාවලියෙහි වේගය අඩුවීමක් සමග ණය සහ අත්තිකාරම් ප්‍රසාරණයෙහි පහත වැටීමක් විය. රජයේ උපදෙස් මත දෙන ලද ගෙවීම් පැහැර හරින ලද සෑපු ණය වෙනුවෙන්, රාජ්‍ය බැංකු දෙකට නිකුත් කරන ලද රාජ්‍ය පිළිණපත් වත්කම් වර්ගීකරණය කෙරේ බලපෑමක් ඇති කළේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස I 1995 දී සියයට 56 ක්වූ ණය සහ අත්තිකාරම් මුලු වත්කම් හි දැරූ කොටස 1996 දී සියයට 51.9 ක් දක්වා අඩු විය. (පිළිණපත් නිකුතුව හැර මෙම අනුපාතය සියයට 56.8 ක් විය.) 1995 දී සියයට 31 (රුපියල් දශලක්ෂ 43,772) කින් වැඩිවූ වාණිජ බැංකුවල මුලු ණය හා අත්තිකාරම් ප්‍රමාණය හා සසඳන විට 1996 දී එම වත්කම් සියයට 8.3 (රුපියල් දශලක්ෂ 15,430) ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. (පිළිණපත් නිකුතුව හැර සියයට 18.5) 1996 දී මෙම වත්කම් වර්ධනයෙහි, ආනයන බිල්පත් වෙනුවෙන් දෙන ලද පහසුකම් සියයට 38.1 (රුපියල් දශලක්ෂ 3,416) කින් අපනයන බිල්පත් මූල්‍යකරණය සියයට 10.6 (රුපියල් දශලක්ෂ 594) කින් සහ අනෙකුත් ණය සියයට 9.4 (රුපියල් දශලක්ෂ 10,075) කින් වැඩිවීම ඇතුළත් විය.

වගකීම් අංශයෙහි ප්‍රධාන වශයෙන් වැඩිවීම් වාර්තා වූයේ තැන්පතු වගකීම්, දේශීය අන්තර් බැංකු ණය, ගෙවා නිමි ප්‍රාග්ධනය, සංචිත හා නොබෙදූ ලාභ හා අනෙකුත් වගකීම්වල ය. 1996 දී ඉල්ලුම් තැන්පතු සහ කාලීන සහ ඉතිරිකිරීම් තැන්පතු පිළිවෙලින් සියයට 14.8 (රුපියල් දශලක්ෂ 6291) කින් සහ සියයට 14.7 (රුපියල් දශලක්ෂ 27,384) කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවීමෙන් මුලු තැන්පතු සියයට 14.8 (රුපියල් දශලක්ෂ 33,675) කින් ඉහළ නැගුනි. ආදායමෙහි වර්ධන වේගය අඩුවීම හේතුවෙන් තැන්පතු රාශිකරණයේ මඳ පහත වැටීමක් පිළිබිඹු කරමින් මුලු සම්පත්හි ප්‍රතිශතයක් වශයෙන් මුලු තැන්පතු දැරූ කොටස 1995 පැවති සියයට 69 සිට 1996 දී සියයට 67 දක්වා අඩුවිය. 1995 වර්ෂය හා සසඳන විට කොටසක් ලෙස සාපේක්ෂව ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි පැවති අනුපාතික පහත මට්ටමක පැවතීම හේතුවෙන් බැංකු විසින් සිය කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විදේශීය ණය ගැනීම්වලට වඩා බොහෝදුරට දේශීය අන්තර් බැංකු වෙළෙඳ පොළ මත විශ්වාසය තබන ලදී. දේශීය අන්තර් බැංකු ණය ගැනීම් වස ර තුළදී සියයට 83.8 (රුපියල් දශලක්ෂ 11,949 ) කින් වැඩිවූ අතර, විදේශීය ණය ගැනීම් සියයට 28.6 (රුපියල් දශලක්ෂ 797) කින් අඩුවිය.

ගෙවා නිමි ප්‍රාග්ධනය සංචිත අරමුදල් සහ නොබෙදූ ලාභ කොටස් 1995 වර්ෂයේ සියයට 18.3 (රුපියල් දශලක්ෂ 5,181) කින්වූ වැඩිවීම හා සසඳන විට 1996 වර්ෂයේදී සියයට 17.3 (රුපියල් දශලක්ෂ 5,778) කින් වැඩිවිය. ප්‍රාග්ධනය, සංචිත හා නොබෙදූ ලාභ කොටස් මුළු වත්කම් වලට දැරූ අනුපාතය, වර්ෂය තුළ නොවෙනස්ව (සියයට 10 ක් පමණ) පැවතින. මින් පිළිබිඹු වූයේ බැංකු විසින් සිය වත්කම් හා සරිලන ලෙස සිය සංචිත වැඩි කළ බවය.

### අරමුදල් ලැබීම් සහ භාවිතය

වාණිජ බැංකු වෙත තිබූ මුළු ශුද්ධ අරමුදල් ප්‍රමාණය 1996 දී රුපියල් දශලක්ෂ 20,945 කින් වැඩිවූයේ, 1995 දක්නට වූ රුපියල් දශලක්ෂ 13,478 ට සංසන්දනාත්මකවය. මෙම වර්ධනයෙන් සැලකිය යුතු කොටසකට හේතුවූයේ රජය විසින් රාජ්‍ය බැංකු දෙකට දීර්ඝකාලීන පිළිණපත් නිකුත් කිරීමය. (පිළිණපත් නිකුතුව නොමැති තත්වයක් යටතේ 1996 දී අරමුදල් වර්ධනය රුපියල් 8,591 කි.) 1996 දී බැංකු ක්‍රමයට ශුද්ධ මුදල් සැපයූ අංශ අතර දේශීය පෞද්ගලික අංශය හා විදේශීය අංශ ප්‍රධාන තැනක් ගත් අතර, සමුපකාර හා රාජ්‍ය සංස්ථාද සැළකිය යුතු ප්‍රමාණයක් අරමුදල් සැපයූහ. ප්‍රධාන වශයෙන් බැංකු සම්පත් භාවිතා කළ අංශ වූයේ රජය සහ සංචිත අවශ්‍යතාවය මගින් අරමුදල් ලබාගත් මහ බැංකුවයි.

පසුගිය වර්ෂ කිහිපයේ ප්‍රධාන අරමුදල් භාවිතා කරන්නකු වූ, අනෙකුත් පෞද්ගලික අංශය එනම් (සංස්ථා සහ සමුපකාර හැරුන විට) ඊට ප්‍රතිවිරුද්ධව 1996 දී ශුද්ධ පදනමක් මත, බැංකු අංශයට ප්‍රධාන අරමුදල් සපයන්නකු බවට පත්විය. මෙම වෙනසට මූලික වශයෙන් හේතු වූයේ ණය සහ අත්තිකාරම් ලෙස භාවිතා කළ අරමුදල් ලබා ගැනීමෙහි ඇතිවූ ඉතා අඩු වර්ධනයයි. මෙසේ ණය හා අත්තිකාරම් අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ බැංකු විසින් සිය ණයදීම් වලදී දැක්වූ වැඩි සූපරීක්ෂාකාරීත්වයයි. 1995 දී බැංකු අංශයෙන් රුපියල් දශලක්ෂ 6,873 ක් ලබාගැනීමට ප්‍රතිවිරුද්ධව, අනෙකුත් දේශීය පෞද්ගලික අංශය විසින් 1996 දී බැංකු අංශය වෙත රුපියල් දශලක්ෂ 12,598 ක් සැපයිය.

1995 දී මෙන්ම 1996 දීද විදේශීය අංශය ශුද්ධ අරමුදල් සපයන්නකු විය. 1995 දී විදේශීය ණයගැනීම් හා තැන්පතු මගින් ලැබුණ රුපියල් දශලක්ෂ

සංඛ්‍යා සටහන 10.4

## වාණිජ බැංකු වත්කම් සහ වගකීම් වල තෝරාගත් ශීර්ෂ

| ශීර්ෂය | වෙනස | | | |
|---|---|---|---|---|
| | 1995 දෙසැම්බර් / 1994 දෙසැම්බර් | | 1996 දෙසැම්බර් / 1995 දෙසැම්බර් | |
| | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | සියයට ගණන |
| වත්කම් විශ්ලේෂණය | | | | |
| 1. ද්‍රවශීල වත්කම් | 5,525 | 7.1 | 14,059 | 16.8 |
| අතැති මුදල් | 312 | 7.5 | 2,429 | 54.1 |
| මහ බැංකුවෙන් අය විය යුතු ශේෂය | 7,180 | 30.2 | 3,310 | 10.7 |
| අතැති විදේශීය ව්‍යවහාර මුදල් | -2,401 | -9.9 | 411 | 1.9 |
| භාණ්ඩාගාර බිල්පත් | -3,591 | -23.7 | 3,978 | 34.4 |
| වාණිජ බිල්පත් | 4,025 | 37.4 | 3,931 | 26.6 |
| දේශීය බිල්පත් | -17 | -7.1 | -80 | 36.6 |
| ආනයන බිල්පත් | 3,542 | 65.3 | 3,416 | 38.1 |
| අපනයන බිල්පත් | 499 | 9.8 | 594 | 10.6 |
| 2. ආයෝජන | -6,737 | -25.9 | 7,686 | 39.9 |
| භාණ්ඩාගාර බිල්පත් | -3,591 | -23.7 | 3,978 | 34.4 |
| රජයේ සුරැකුම්පත් | -595 | -44.2 | 88 | 11.7 |
| අනෙකුත් ආයෝජන | -2,551 | -26.8 | 3,620 | 52.0 |
| 3. මුළු ණය සහ අත්තිකාරම් | 43,772 | 30.6 | 15,430 | 8.3 |
| ණය | 21,474 | 24.9 | 10,075 | 9.4 |
| අයිරා | 18,272 | 39.5 | 1,424 | 2.2 |
| වාණිජ බිල්පත් | 4,025 | 37.4 | 3,931 | 26.6 |
| 4. ස්ථාවර හා අනෙකුත් වත්කම් | 7,374 | 14.7 | 24,459 | 42.5 |
| වගකීම් විශ්ලේෂණය | | | | |
| 1. ප්‍රාග්ධන ගිණුම් | 5,181 | 18.3 | 5,778 | 17.3 |
| 2. මුළු තැන්පතු | 37,642 | 19.8 | 33,675 | 14.8 |
| ඉල්ලුම් තැන්පතු | 868 | 2.1 | 6,291 | 14.8 |
| කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු | 36,774 | 24.7 | 27,384 | 14.7 |
| 3. ණය ගැනීම් | 4,351 | 34.3 | 11,152 | 65.4 |
| දේශීය ණය ගැනීම් | 3,668 | 34.6 | 11,949 | 83.8 |
| විදේශීය ණය ගැනීම් | 683 | 32.5 | -797 | -28.6 |
| 4. අනෙකුත් වගකීම් | 7,272 | 14.7 | 3,678 | 6.5 |
| මුළු වත්කම් / වගකීම් | 54,447 | 19.4 | 54,283 | 16.2 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

6,372 හා සසඳන විට, වාණිජ බැංකු විදේශීය තැන්පතු වැඩිවීම මගින් ලද ශුද්ධ අරමුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 4,156 ක් විය. කෙසේ වෙතත්, 1996 දී ණය ගැනීම්ද අපනයන බිල්පත් ඇතුළු විදේශීය බිල්පත්ද අරමුදල් භාවිතා කළ අංශවූ අතර, 1995 දී මෙම අංශ විසින් අරමුදල් සපයන ලදී.

සමුපකාර ආයතන හා රාජ්‍ය සංස්ථා, පිළිවෙලින්, රුපියල් දශලක්ෂ 1639 ක් සහ රුපියල් දශලක්ෂ 383 ක් සපයමින් ශුද්ධ සම්පත් වර්ධනයට දායක වූහ. මෙහිදීද රජයේ පිළිණපත් නිකුතුව, ලබාගැනීමට තිබූ සම්පත් ප්‍රමාණය කෙරේ බලපෑමක් ඇති කළේය. 1995 දී බැංකු විසින් වී අලෙවි මණ්ඩලයේ කටයුතු මූල්‍යකරණය කිරීම සඳහා ණයදීම නිසා සමුපකාර අංශය ශුද්ධ වශයෙන් අරමුදල් භාවිතා කළේය. 1995 සහ 1996 වර්ෂ දෙකේදීම අන්තර් බැංකු ගනුදෙනු මගින් අරමුදල් සැපයීමක් සිදුවිය.

භාවිතා කිරීමේ අංශයෙන් බැලූ කල, 1995 දී අරමුදල් සැපයූ මූලයක් වූ, අනෙකුත් වත්කම් හා වගකීම් සඳහා 1996 දී රට ප්‍රතිවිරුද්ධව රුපියල් දශලක්ෂ 13,248 ක අරමුදල් යොදා ගැනුනි. රජය විසින් ඇපවූ ණය සඳහා 1996 ඔක්තෝබර් මස රාජ්‍ය බැංකු දෙකකට නිකුත් කළ දිගුකල් පිළිනපත් බැංකුවල අනිකුත් වත්කම් වැඩිකර ලිය. ව්‍යවස්ථාපිත සංචිත වශයෙන් මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙතින් රුපියල් දශලක්ෂ 3,310 ක් ලබාගන්නා ලදී. රාජ්‍ය මූල්‍ය හිගය වැඩිවීමත් සමග, රජය විසින් රජයේ සුරැකුම්පත්, ආනයන බිල්පත්, සහ කෙටිකාලීන ණය ස්වරූපයෙන් බැංකු වෙතින් රුපියල් දශලක්ෂ 5758 ක අරමුදල් ලබාගන්නා ලදී. කෙසේ වෙතත් මෙම අංශය රාජ්‍ය තැන්පතු ලෙස බැංකු ක්‍රමය වෙත රුපියල් දශලක්ෂ 3,419 ක් ලබාදුනි. මේ අනුව ශුද්ධ වශයෙන් රජය ලබාගත් සම්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2,471 ක් විය. මිට ප්‍රතිවිරුද්ධව 1995 දී මෙම අංශය රුපියල් දශලක්ෂ 595 සපයන ලදී.

### වාණිජ බැංකු ණය සහ අත්තිකාරම් *

1996 සැප්තැම්බර් මාසයෙන් අවසන්වූ මාස 12 තුල වාණිජ බැංකු විසින් රාජ්‍ය සංස්ථා සහ සමුපකාර ඇතුළු පෞද්ගලික අංශයට දෙන ලද ණය සහ අත්තිකාරම් සියයට 15.1 (රුපියල් දශලක්ෂ 26,579) කින් වර්ධනය

* *මෙම විග්‍රහය 1996 ත්‍රෛමාසික වාර්තා තුළෙහි දත්ත මත පදනම් වේ.*

## සංඛ්‍යා සටහන 10.5
## වාණිජ බැංකු තම සම්පත් ලබාගත් මාර්ග සහ ඒවා යෙදවූ මාර්ග

රුපියල් දශලක්ෂ

| අංශය සහ විස්තර විශ්ලේෂණය | වෙනස (අ) | | | |
|---|---|---|---|---|
| | 1995 | | 1996 | |
| | මූලයන් | භාවිතය | මූලයන් | භාවිතය |
| **1. රාජ්‍ය අංශය** | **595** | | | **2,471** |
| රජයේ සුරැකුම්පත් දැරීම | 4,186 | | | 4,066 |
| තැන්පතු | 193 | | 3,419 | |
| ආනයන බිල්පත් | | 2,548 | | 1,631 |
| කෙටි කාලීන ණය | | 857 | | 619 |
| අයිරාවන් | | 380 | 427 | |
| **2. මහ බැංකුව** | | **4,774** | | **5,227** |
| ණය ගැනීම් | | 428 | 425 | |
| සංචිත | | 7,180 | | 3,310 |
| මහ බැංකු සුරැකුම්පත්හි ආයෝජනය | 3,146 | | 88 | |
| කැට මුදල් | | 312 | | 2,429 |
| **3. රාජ්‍ය සංස්ථා** | **35** | | **383** | |
| තැන්පතු | 3,399 | | 1,794 | |
| අත්තිකාරම් | | 3,363 | | 1,411 |
| **4. සමුපකාර** | | **1,832** | **1,639** | |
| තැන්පතු | | 434 | | 835 |
| අත්තිකාරම් | | 1,398 | 2,474 | |
| **5. අනෙකුත් දේශීය** පෞද්ගලික අංශය | | **6,873** | **12,598** | |
| තැන්පතු (ආ) | 31,303 | | 23,721 | |
| දේශීය බිල්පත් | | 449 | | 1,025 |
| ආනයන බිල්පත් | | 471 | | 693 |
| අයිරාවන් | | 15,956 | | 3,483 |
| ණය මුදල් | | 20,705 | | 8,329 |
| සුරැකුම්පත් හා බැදුම්කරවල ආයෝජනය | | 595 | | 3,708 |
| ණයකර | | | 6,115 | |
| **6. අන්තර් බැංකු ගනුදෙනු** | **2,005** | | **2,169** | |
| දේශීය බැංකුවල ඇති ශේෂයන් | | 2,090 | | 1,012 |
| දේශීය බැංකුවල තැන්පතු හා ණය ගැනීම් | 4,095 | | 3,181 | |
| **7. විදේශීය අංශය** | **6,372** | | **4,156** | |
| ණය ගැනීම් | 683 | | | 797 |
| තැන්පතු | 3,786 | | 6,057 | |
| අපනයන බිල්පත් ද ඇතුළුව විදේශීය ශේෂයන් | 1,904 | | | 1,103 |
| **8. අනෙකුත් වත්කම් හා අනෙකුත් වගකීම්** | **4,471** | | | **13,248** |
| ප්‍රාග්ධන හා සංචිත | 5,182 | | 5,778 | |
| ස්ථාවර වත්කම් | | 1,342 | | 1,496 |
| දිගුකාලීන රජයේ පිළිණපත් | | | | 19,392 |
| ප්‍රතිව්‍යුහගත කරන පිළිණපත් | | | | |
| අනෙකුත් වත්කම් | | 6,032 | | 3,571 |
| අනෙකුත් වගකීම් | 6,663 | | 5,433 | |
| **මුළු ශුද්ධ සම්පත් ලැබීම් / භාවිතය** | **13,478** | **13,478** | **20,945** | **20,945** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තද කළු අකුරින් දක්වා ඇති සංඛ්‍යාවන්ගෙන් එක් එක් අංශයෙහි මුළු ශුද්ධ සම්පත් ලැබීම හෝ භාවිතය දැක්වේ.

(ආ) විශේෂ ඉතිරිකිරීමේ ක්‍රමය යටතේ රාජ්‍ය අංශයේ බැංකු දෙක විසින් යොදවන ලද දිගුකාලීන තැන්පතු ද ඇතුළත් වේ.

වූයේ 1995 අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තාවූ සියයට 23.2 (රුපියල් දශලක්ෂ 33,153) ක වැඩිවීමකට සංසන්දනාත්මකවය. මුළු ණයෙහි කෙටිකාලීන හා මැදිකාලීන ණය දැරූ කොටස 1995 දී පැවති සියයට 86.3 ක සිට 1996 දී සියයට 87.3 (රුපියල් දශලක්ෂ 72,140) දක්වා වැඩිවූ අතර, 1996 අවසානයේ අත්තිකාරම් කොටස සියයට 12.7 (රුපියල් දශලක්ෂ 25,833) ක් විය.

පසුගිය කාලයේ පැවති ප්‍රවනතාවය අනුව තවදුරටත්, වාණිජ බැංකු ණය සඳහා යෙදූ අරමුදල් වලින් විශාල ප්‍රමාණයක් එනම් සියයට 44 ක් වෙළඳ කටයුතු සඳහා විය. 1996 සැප්තැම්බර් මාසයෙන් අවසන්වූ 12 මාසය තුළ, වෙළඳ කටයුතු සඳහා දුන් ණය සියට 15.6 (රුපියල් දශලක්ෂ 11,980) කින් වර්ධනය විය. වාණිජ බැංකු ණය පිළිබඳ සාමාන්‍ය ස්වරූපය අනුව, වෙළඳ කටයුතු සඳහා දුන් ණයෙන් සියයට 78.5 ක් කෙටිකාලීන පහසුකම් ලෙස දී තිබුණි. වැඩිදුරටත් වෙළඳ කටයුතු සඳහා දුන් ණයෙහි, දිගුකාලීන හා මැදිකාලීන ණය දැරූ කොටස් තවදුරටත් අඩුවිය

1996 සැප්තැම්බර් මාසයෙන් අවසන්වූ මාස 12 තුල, වාණිජ බැංකු විසින් කාර්මික අරමුණු සඳහා දුන් ණය සියයට 13.5 (රුපියල් දශලක්ෂ 3,304) කින් වර්ධනය විය. මේ අතර, මෙම ණය මුළු ණයෙහි දැරූ කොටස 1995 සැප්තැම්බර් මාසයේ සියයට 13.9 (රුපියල් දශලක්ෂ 24,460) ව පැවති, 1996 සැප්තැම්බර් මාසයේ සියයට 13.7 (රුපියල් දශලක්ෂ 27,764) ක් දක්වා සුළු වශයෙන් අඩු විය. 1996 දී කාර්මික අරමුණු සඳහා දුන් කෙටිකාලීන ණය අඩුවූ අතර, මැදි හා දිගු කල් ණය වැඩිවිය.

මුළු ණයෙහි වර්ධන වේගයට අඩු වේගයකින් වැඩි වූ පාරිභෝගික අරමුණු සඳහා වූ ණය 1996 දී තව දුරටත් පහත වැටුණි. මෙම කාණ්ඩයට දුන් ණය 1995 දී වූ සියයට 22 ක වර්ධනය හා සැසඳීමේ දී 1996 දී සියයට 13.4 කින් වැඩිවිය.

නිවාස හා දේපොල සංවර්ධන කටයුතු උප අංශයට දුන් ණය, 1996 සැප්තැම්බර් මාසයෙන් අවසන්වූ 12 මාසය තුළ සියයට 27 කින් වැඩිවූයේ, 1995 අනුරූප කාල පරච්ඡේදයේ දක්නට වූ සියයට 4 ක වර්ධනයට සංසන්දනාත්මකවය. නිවාස හා දේපොල සංවර්ධනය සඳහා දුන් ණය, මුළු ණයෙහි දැරූ කොටස, 1995 සැප්තැම්බර් අවසානයේ පැවැති සියයට 11.6 සිට 1996 සැප්තැම්බර් අවසානයට සියයට 12.8 දක්වා වැඩි විය. මෙම අංශයේම දුන් ණයෙන් වැඩි කොටස් (සියයට 42) දිගුකාලීන කාණ්ඩයට අයිති විය.

1995 සැප්තැම්බර් අවසානයේ සියයට 7.6 ක් ව පැවති පාරිභෝජන කටයුතු සඳහා දුන් ණය මුළු ණයෙහි දැරූ කොටස, 1996 සැප්තැම්බර් අවසානයට සියයට 7.5 ක් දක්වා අඩුවිය. මේ අතර, කෘෂි මූල්‍ය හා සංචාරක අංශයන්ට දුන් ණය, පිළිවෙලින්, සියයට 4.0 (රුපියල් දශලක්ෂ 417) කින්, සියයට 4.6 (රුපියල් දශලක්ෂ 374 කින්) සහ සියයට 12.3 (රුපියල් දශලක්ෂ 351) වැඩි විය.

1995 අවසානයේ සියයට 20.7 ක්වූ සියළු ණය හා අත්තිකාරම් සඳහා වූ සාමාන්‍ය බර තැබූ ණය පොළී අනුපාතිකය, 1996 සැප්තැම්බර් අවසානයට සියයට 21.0 දක්වා සුළු වශයෙන් වැඩි විය. මුද්‍රණය හා අත්තිකාරම් වලින් සියයට 36 ක පොළී අනුපාතික වලින් සියයට 20 ට වඩා අඩුවූ අතර, සියයට 46 ක් සියයට 20-25 අතර පොළී අනුපාතික යටතේද, සියයට 9 ක් සියයට 25

## සංඛ්‍යා සටහන 10.6

# අරමුණු හා කල්පිරීම් රටාව අනුව වර්ග කරන ලද වාණිජ බැංකු අත්තිකාරම් (අ)

| වර්ගීකරණය | | කෙටිකාලීන | | මැදිකාලීන | | දිගුකාලීන | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | (1) ප්‍රමාණය රුපියල් දශලක්ෂ | (2) (1), (7) හි ප්‍රතිශතයක් වශයෙන් | (3) ප්‍රමාණය රුපියල් දශලක්ෂ | (4) (3), (7) හි ප්‍රතිශතයක් වශයෙන් | (5) ප්‍රමාණය රුපියල් දශලක්ෂ | (6) (5), (7) හි ප්‍රතිශතයක් වශයෙන් | (7) ප්‍රමාණය රුපියල් දශලක්ෂ | (8) (7), එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් |
| 1. වෙළෙඳ | | | | | | | | | |
| සැප්තැම්බර් | 1995 | 58,330 | 76.0 | 13,384 | 17.4 | 5,034 | 6.6 | 76,749 | 43.7 |
| දෙසැම්බර් | 1995 | 60,946 | 75.7 | 14,802 | 18.4 | 4,783 | 5.9 | 80,530 | 43.8 |
| සැප්තැම්බර් | 1996 | 69,658 | 78.5 | 15,089 | 17.0 | 3,981 | 4.5 | 88,728 | 43.8 |
| 2. මූල්‍ය | | | | | | | | | |
| සැප්තැම්බර් | 1995 | 5,428 | 67.0 | 2,045 | 25.2 | 629 | 7.8 | 8,102 | 4.6 |
| දෙසැම්බර් | 1995 | 3,994 | 50.5 | 3,194 | 40.4 | 720 | 9.1 | 7,908 | 4.3 |
| සැප්තැම්බර් | 1996 | 4,975 | 58.7 | 2,709 | 32.0 | 793 | 9.4 | 8,476 | 4.2 |
| 3. කෘෂිකාර්මික | | | | | | | | | |
| සැප්තැම්බර් | 1995 | 7,248 | 69.2 | 2,423 | 23.1 | 802 | 7.7 | 10,473 | 6.0 |
| දෙසැම්බර් | 1995 | 7,312 | 62.9 | 3,480 | 30.0 | 826 | 7.1 | 11,618 | 6.3 |
| සැප්තැම්බර් | 1996 | 7,178 | 65.9 | 2,753 | 25.3 | 959 | 8.8 | 10,890 | 5.4 |
| 4. කාර්මික (ආ) | | | | | | | | | |
| සැප්තැම්බර් | 1995 | 17,833 | 72.9 | 3,988 | 16.3 | 2,639 | 10.8 | 24,460 | 13.9 |
| දෙසැම්බර් | 1995 | 17,145 | 71.5 | 4,186 | 17.5 | 2,640 | 11.0 | 23,971 | 13.0 |
| සැප්තැම්බර් | 1996 | 18,112 | 65.2 | 6,508 | 23.4 | 3,144 | 11.3 | 27,764 | 13.7 |
| 5. සංචාරක | | | | | | | | | |
| සැප්තැම්බර් | 1995 | 1,441 | 50.6 | 557 | 19.5 | 853 | 29.9 | 2,851 | 1.6 |
| දෙසැම්බර් | 1995 | 1,368 | 48.1 | 665 | 23.4 | 813 | 28.6 | 2,846 | 1.5 |
| සැප්තැම්බර් | 1996 | 1,753 | 54.7 | 625 | 19.5 | 824 | 25.7 | 3,202 | 1.6 |
| 6. නිවාස | | | | | | | | | |
| සැප්තැම්බර් | 1995 | 4,323 | 21.2 | 6,138 | 30.1 | 9,899 | 48.6 | 20,359 | 11.6 |
| දෙසැම්බර් | 1995 | 4,688 | 21.1 | 7,143 | 32.2 | 10,349 | 46.7 | 22,180 | 12.1 |
| සැප්තැම්බර් | 1996 | 5,525 | 21.4 | 9,507 | 36.8 | 10,800 | 41.8 | 25,832 | 12.8 |
| 7. පරිභෝජන | | | | | | | | | |
| සැප්තැම්බර් | 1995 | 7,655 | 57.2 | 2,959 | 22.1 | 2,772 | 20.7 | 13,386 | 7.6 |
| දෙසැම්බර් | 1995 | 8,356 | 60.3 | 2,669 | 19.3 | 2,822 | 20.4 | 13,847 | 7.5 |
| සැප්තැම්බර් | 1996 | 8,847 | 58.3 | 3,216 | 21.2 | 3,122 | 20.6 | 15,184 | 7.5 |
| 8. අනෙකුත් ණය | | | | | | | | | |
| සැප්තැම්බර් | 1995 | 12,379 | 63.7 | 5,596 | 28.8 | 1,447 | 7.4 | 19,422 | 11.0 |
| දෙසැම්බර් | 1995 | 13,701 | 65.1 | 5,758 | 27.4 | 1,588 | 7.5 | 21,047 | 11.4 |
| සැප්තැම්බර් | 1996 | 14,192 | 63.6 | 5,903 | 26.5 | 2,210 | 9.9 | 22,304 | 11.0 |
| 9. එකතුව | | | | | | | | | |
| සැප්තැම්බර් | 1995 | 114,637 | 65.2 | 37,090 | 21.1 | 24,074 | 13.7 | 175,800 | 100.0 |
| දෙසැම්බර් | 1995 | 117,509 | 63.9 | 41,897 | 22.8 | 24,541 | 13.3 | 183,946 | 100.0 |
| සැප්තැම්බර් | 1996 | 130,239 | 64.4 | 46,307 | 22.9 | 25,833 | 12.8 | 202,379 | 100.0 |

මූලය . ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) අත්තිකාරම්වලට සංසරණයෙහි පවත්නා මුදල් ශීර්ෂයන් හැර ණය, අයිරා සහ වට්ටම් කළ බිල්පත් ඇතුළත්ය.

(ආ) ඉංජිනේරු සහ ගොඩනැගිලි ව්‍යාපාර, කැනීම් සහ ධීවර කර්මාන්තය සඳහා දෙන ලද අත්තිකාරම් ඇතුළත් වේ.

## සංඛ්‍යා සටහන 10.7
## සුරැකුම් වර්ගය අනුව අත්තිකාරම් (අ)

| ශීර්ෂය | 1995 සැප්තැම්බර් 30 | | 1995 දෙසැම්බර් 31 | | 1996 සැප්තැම්බර් 30 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් |
| 1. ලේඛනගත බිල්පත් | 5,706 | 3.2 | 4,943 | 2.7 | 6,038 | 3.0 |
| 2. රජයේ සුරැකුම්පත් | 6,237 | 3.5 | 6,809 | 3.7 | 9,007 | 4.5 |
| 3. බද්ධ ව්‍යාපාර වස්තු සමාගම්වල කොටස්, බැඳුම්කර, ණයකර, ජීවිත රක්ෂණ සහතිකවල මූල්‍ය වටිනාකම ඇතුළුව අනෙකුත් | 3,162 | 1.8 | 3,012 | 1.6 | 2,906 | 1.4 |
| 4. ස්ථාවර, ඉතිරිකිරීම් සහ තැන්පතු සහතික ඇතුළු අනෙකුත් මුදල් තැන්පතු | 15,541 | 8.8 | 16,067 | 8.7 | 18,406 | 9.1 |
| 5. වෙළෙඳ භාණ්ඩ | 15,140 | 8.6 | 14,688 | 8.0 | 16,493 | 8.1 |
| 6. නිශ්චල දේපල, යන්ත්‍ර සහ උපකරණ | 43,180 | 24.6 | 45,391 | 24.7 | 50,476 | 24.9 |
| 7. පොරොන්දු නෝට්ටු සහ පෞද්ගලික ඇපවීම් | 24,680 | 14.0 | 27,902 | 15.2 | 32,005 | 15.8 |
| 8. භාර කුවිතාන්සි | 10,197 | 5.8 | 10,240 | 5.6 | 10,510 | 5.2 |
| 9. කුලී පිට ගැනුම් ගිවිසුම් | 1,051 | 0.6 | 2,085 | 1.1 | 1,991 | 1.0 |
| 10. ට්‍රැක්ටර් සහ මෝටර් රථ | 2,220 | 1.3 | 2,495 | 1.4 | 2,935 | 1.5 |
| 11. අනෙකුත් සුරැකුම්පත් | 27,417 | 15.6 | 26,501 | 14.4 | 28,731 | 14.2 |
| 12. සුරැකුම් රහිත | 21,268 | 12.1 | 23,814 | 12.9 | 22,880 | 11.3 |
| එකතුව | **175,800** | **100.0** | **183,946** | **100.0** | **202,379** | **100.0** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) එකතුවෙමින් පවත්නා මුදල් ශීර්ෂයන් සහ සගතික මිල යෝජනා ක්‍රමය යටතේ මිලදී ගැනීම සඳහා ප්‍රදානය කළ අත්තිකාරම් හැර.

30 අතර පොලී අනුපාතික යටතේද, සියයට 11 ක් සියයට 30 ට වැඩි පොලී අනුපාතික යටතේද දී තිබුණි.

සුරැකුම් පිළිබඳව සලකා බලන විට, මුළු ණය හා අත්තිකාරම් වලින් සියයට 89ක් සුරැකුම් සහිතව දී තිබුණි. මුළු ණය හා අත්තිකාරම් වලින් සියයට 25 ක් නිශ්චල දේපොල සහ යන්ත්‍ර සූත්‍ර සුරැකුම් ලෙස ගෙන දී තිබූ අතර, සියයට 16 ක් පුද්ගලික ඇප සහ පොරොන්දු නෝට්ටු වලින් ආවරණය විය.

## 10.5 මහ බැංකු කටයුතු

ගෙවුම් ශේෂයේ සමස්ත හිඟය පිළිබිඹු කරමින්, 1996 දී මහ බැංකුවේ ශුද්ධ ජාත්‍යන්තර සංචිත අඩු විය. කෙසේ වෙතත්, මූලික වශයෙන් රජය විසින් මහ බැංකුවෙන් ලබාගත් ණය වැඩිවීම හේතුවෙන්, දේශීය වත්කම් වැඩිවීමෙන් දේශීය වත්කම් සමස්ත වශයෙන් සියයට 4.6 කින් වර්ධනය විය. 1995 වර්ෂයේ මීට සංසන්දනාත්මක වර්ධනය සියයට 11.3 ක් විය. වගකීම් අංශයේ, වර්ධනය පෙන්නුම් කරනු ලැබුයේ, ව්‍යවහාර මුදල් නිකුතුව හා තැන්පතු වගකීම් සම්බන්ධයෙනි. මුළු සම්පත් පිළිබඳ මෙම ප්‍රවණතා සහ සාපේක්ෂ වශයෙන් දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අඛණ්ඩව පවත්වා ගෙනයෑම පිළිබිඹු කරමින්, පදනම් මුදල් (සංචිත හෝ අධිබල මුදල්) 1995 දී දක්නට වූ සියයට 15.5 ක වර්ධනයට සංසන්දනාත්මකව, සියයට 8.8 කින් වැඩි විය.

### වත්කම් හා වගකීම් ව්‍යුහය

1996 අවසානයේ රුපියල් දශලක්ෂ 181,564 ක් වූ මහ බැංකුවේ මුළු සම්පත් වර්ෂය තුල සියයට 4.6 (රුපියල් දශලක්ෂ 8052) ක මධ්‍යස්ථ

## සංඛ්‍යා සටහන 10.8
## බැංකු ශාඛා ව්‍යාප්තිය 1994 - 1996

| වර්ගීකරණය | 1995 | 1996 |
|---|---|---|
| 1. ආයතන සංඛ්‍යාව | 44 | 44 |
| වාණිජ බැංකු සංඛ්‍යාව | 26 | 26 |
| දේශීය බැංකු සංඛ්‍යාව | 8 | 8 |
| විදේශීය බැංකු සංඛ්‍යාව | 18 | 18 |
| ඉතිරිකිරීමේ බැංකු සංඛ්‍යාව | 1 | 1 |
| ප්‍රා. ග්‍රා. සං. බැංකු සංඛ්‍යාව (අ) | 17 | 17 |
| 2. බැංකු ශාඛා සංඛ්‍යාව (ආ) | 1,202 | 1,332 |
| වාණිජ බැංකු ශාඛා සංඛ්‍යාව | 936 | 1,060 |
| දේශීය බැංකු ශාඛා සංඛ්‍යාව | 899 | 1,022 |
| ප්‍රධාන ශාඛා සංඛ්‍යාව | 797 | 828 |
| කෘ. සේ. ම. ශාඛා සංඛ්‍යාව | 19 | 17 |
| කච්චේරි ශාඛා සංඛ්‍යාව | 23 | 23 |
| ව්‍යාප්ති / ගෙවීම් කාර්යාල | 41 | 49 |
| උකස් මධ්‍යස්ථාන | 15 | 101 |
| එහෙර ශාඛා සංඛ්‍යාව | 4 | 4 |
| විදේශීය බැංකු ශාඛා සංඛ්‍යාව (ඇ) | 37 | 38 |
| ජා. ඉ. බැ. ශාඛා සංඛ්‍යාව | 95 | 97 |
| ප්‍රා. ග්‍රා. සං. බැංකු ශාඛා සංඛ්‍යාව | 171 | 175 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 1985 අංක 15 දරන ප්‍රා. ග්‍රා. බැංකු පනත යටතේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවන ලදී.

(ආ) ප්‍රධාන කාර්යාල ද ඇතුළත්ය.

(ඇ) උප කාර්යාල ද ඇතුළත්ය.

වර්ධනයක් වාර්තා කළේය. 1995 වර්ෂයේ මිට සංසන්දනාත්මක වර්ධනය සියයට 11.3 (රුපියල් දශලක්ෂ 17,548) ක් විය.

වත්කම් අංශයෙහි, වර්ධනය මුළුමනින් පිළිබිඹු වුයේ, 1995 වර්ෂයේ දක්නට වු සියයට 12.1 (රුපියල් දශලක්ෂ 7,323) ක වර්ධනය හා සැසඳීමේදී, 1996 දී සියයට 15.8 (රුපියල් දශලක්ෂ 10,710) කින් ඉහළ ගිය දේශීය වත්කම් සම්බන්ධයෙනි. දේශීය වත්කම් වැඩිවිමට බෙහෙවින් හේතුවුයේ භාණ්ඩාගාර බිල්පත් දැරීම් සහ ණය සහ අත්තිකාරම් වශයෙන් රජයට දුන් ශුද්ධ ණය වර්ධනය විමය.

ගෙවුම් තුලනයේ සමස්ත හිගය අනුව, මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත 1995 අවසානයේදී පැවති රුපියල් දශලක්ෂ 105,896 සිට රුපියල් දශලක්ෂ 103,244 දක්වා 1996 අවසානයට අඩුවිය. මෙම අඩුවිම, ප්‍රධාන වශයෙන් පිළිබිඹු වුයේ සියයට 11.7 (රුපියල් දශලක්ෂ 4,689) කින් පහත වැටුණු පිටරට ඇති මුදල් ශේෂ සම්බන්ධයෙනි.

වගකීම් අංශයෙන් බලන විට, 1996 දී මහ බැංකුවේ ව්‍යවහාර මුදල් නිකුතුව සියයට 6.0 (රුපියල් දශලක්ෂ 2,797) කින්ද, තැන්පතු වගකීම් සියයට 2.7 (රුපියල් දශලක්ෂ 2,078) කින්ද වැඩි විය. මහ බැංකුව වෙතැති තැන්පතු වර්ධනයට හේතු වුයේ, වාණිජ බැංකු සතු තැන්පතු සියයට 12.7 (රුපියල් දශලක්ෂ 4,054) කින්, රජයේ තැන්පතු සියයට 15.5 (රුපියල් දශලක්ෂ 470) කින් සහ රාජ්‍ය නියෝජ්‍යායතනයන්හි තැන්පතු සියයට 15.4 (රුපියල් දශලක්ෂ 74) කින් වැඩිවිමය. මෙම වර්ධනය, ජාත්‍යන්තර සංවිධානයන්හි තැන්පතු සහ අනෙකුත් තැන්පතු පිළිවෙලින් සියයට 3.4 (රුපියල් දශලක්ෂ 1,567) කින් සහ සියයට 58.8 (රුපියල් දශලක්ෂ 963) කින් අඩුවිම මගින් යම් දුරකට සමනය විය.

## 10.6 බැංකු සංවර්ධනය
### බැංකු ශාඛා ව්‍යාප්තිය

රටේ ක්‍රියාත්මක වන මුළු වාණිජ බැංකු සංඛ්‍යාව 26 ක් ලෙස නොවෙනස්ව පැවතුනි. මින් 8 ක් දේශීය බැංකු වු අතර 18 ක් විදේශීය බැංකු විය. (1996 දෙසැම්බර් මස විදේශීය වාණිජ බැංකුවකට, එනම් සොසයිටි ජෙනරාල් හට, ශාඛාවක් පිහිටුවිම සඳහා බලපත්‍රයක් නිකුත් කළ අතර, මෙම බැංකුව 1997 මාර්තු මස කටයුතු ඇරඹිය) බැංකු ශාඛා ජාලය ව්‍යාප්ත කිරිම, විශේෂයෙන්, දේශීය වාණිජ බැංකු විසින් සිදු කෙරුණි. දේශීය බැංකු විසින් ක්‍රියාත්මක කෙරෙන මුළු බැංකු ශාඛා ගණන 1996 දී 899 සිට 1,022 දක්වා වැඩිවු අතර, විදේශීය බැංකු ශාඛා ගණන 38 ට වැඩි වුයෙන්, මුළු වාණිජ බැංකු ශාඛා ගණන 1996 අවසානයට 1,060 දක්වා වැඩි විය. ජාතික ඉතිරි කිරිමේ බැංකුව ශාඛා 2 ක් විවෘත කළ අතර, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා 4 ක් විවෘත කලෙන්, මුළු බැංකු ශාඛා සංඛ්‍යාව 1995 දී වු 1,202 සිට 1996 දී 1,332 දක්වා වැඩිවිය. බැංකු ශාඛා සංඛ්‍යාවේ ඇතිවු මේ වෙනස්කම්, ජනගහනයේ සෑම 10,000 කින් ආවරණය කරන බැංකු ශාඛා ගණන අනුව මිනුම් කරනු ලබන බැංකු ඝනත්ව දර්ශකය කෙරේ බලපෑමෙන් එම දර්ශකය 1996 දී 0.7251 දක්වා වර්ධනය විය.

මහජන බැංකුව විසින් නව උකස් ණය මධ්‍යස්ථාන කීපයක් විවෘත කරන ලද මුත් මුළු බැංකු ශාඛා ගණන 325 ක් ලෙස නොවෙනස්ව පැවතිණ. ලංකා බැංකුවේ කෘෂි සේවා මධ්‍යස්ථාන දෙකක් එහි ප්‍රධාන ශාඛා වශයෙන් උසස් කිරිමත්, තවත් ශාඛා දෙකක් ඒකාබද්ධ කිරිමත් සමගම 1995 දී 273 ක්වු ලංකා බැංකුවේ මුළු ශාඛා ගණන 1996 දී 274 ක් දක්වා ඉගල ගොස් ඇත. මේ අනුව ලංකා බැංකුවේ සමස්ථ ශාඛා ජාලය, ප්‍රධාන ශාඛා 274 ක්, විදේශ ශාඛා 4 ක්, කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා 17 ක්, කච්චේරි ශාඛා 23 ක්, ව්‍යාප්ති කාර්යාල 21 ක් හා ගෙවිම් කාර්යාල 3 කින් සමන්විතය.

අදාල වර්ෂය තුලදී හැටන් නැෂනල් බැංකුව විසින් නව කාර්යාල 10 ක් විවෘත කරන ලද අතර, බගවන්තලාව ව්‍යාප්ති කාර්යාලය සියළු සේවා සපයන ශාඛා කාර්යාලයක් ලෙස උසස් කරන ලදී. සීමාසහිත ලංකා කොමර්ෂල් බැංකුව ශාඛා 5 ක්ද, සීමාසහිත සම්පත් බැංකුව හා සීමාසහිත කොළඹ යුනියන් බැංකුව ශාඛා තුන බැගින්ද විවෘත කළහ. සීමාසහිත සෙලාන් බැංකුව නව ශාඛා 5 ක් පිහිටවු අතර, ජංගම බැංකු මධ්‍යස්ථාන දෙකක් ඇරඹිය. තවද විදේශ බැංකු දෙකක් වන සීමාසහිත හොංකොං හා ෂැන්හයි බැංකුව සහ මුස්ලිම් කොමර්ෂල් බැංකුව නව ශාඛාව බැගින් විවෘත කරන ලද අතර, ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව එහි ශාඛාවක් වසාදමන ලදී.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල මුළු ගණන 17 ක් ලෙස නොවෙනස්ව පැවතින. එසේ වුවද, කළුතර, මාතර, නුවර හා ගම්පහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු එක් ශාඛාව බැගින් විවෘත කරන ලද අතර ඒවායේ මුළු ශාඛා ගණන 175 දක්වා වැඩි විය. ජාතික ඉතිරිකිරිමේ බැංකුව නව ශාඛා දෙකක් විවෘත කරන ලද අතර, එහි මුළු ශාඛා ගණන 97 දක්වා ඉහළ ගොස් ඇත.

### බැංකු පහසුකම්

වාණිජ පත්‍ර පිටසන් කිරිම, ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර, කල් බදුදීම්, උකස් ගැනීම් හා දුරකථන බැංකු පහසුකම් ( Tele Banking ) වැනි නව පහසුකම් ව්‍යාප්ත කිරිමත් සමග වාණිජ බැංකු විසින් සපයනු ලැබූ බැංකු සේවා පහසුකම් වර්ෂය තුල පුළුල් කෙරුණි. තැන්පතු රාශිකරණය කිරිමේ ප්‍රයත්නයෙහි කොටසක් ලෙස වාණිජ බැංකු විසින් ළමා ඉතිරි කිරිමේ ගිණුම්, පවුල් ඒකකයන් සඳහා වු ඉතිරි කිරිමේ ගිණුම් වැනි නව ගිණුම් වර්ග වෙළෙඳ පොලට හඳුන්වා දුන් අතර, සමහර බැංකු සිය තැන්පතු ක්‍රම ලොතරැයි දිනුම් ඇදීම්, ණය පහසුකම්, රක්ෂණ ප්‍රතිලාභ වැනි පහසුකම් හා සම්බන්ධ කළහ. මේ අතර ළමයින්, පවුල් ඒකක, සමෘද්ධිලාභීන්, වෛද්‍යවරුන්, ජනමාධ්‍යකරුවන්, ගුරුවරුන් වැනි තෝරාගත් කණ්ඩායම් වෙනුවෙන් විශේෂිතවු විවිධ වර්ගයේ තැන්පතු ක්‍රම තුලින් තැන්පතු රාශිකරණය කිරිමද බැංකු විසින් නොකඩවා සිදුකෙරුණි.

පාසැල් ශිෂ්‍යයන් අතර, ඉතිරිකිරිමේ පුරුද්ද වර්ධනය කිරිමේ අරමුණෙන් මහජන බැංකුව සිසු උදාන නම් නව තැන්පතු ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිය. මෙම ගිණුම් හිමි ශිෂ්‍යයන් සඳහා රුපියල් දෙලක්ෂයක් දක්වා වූ විශේෂිත වෛද්‍ය ප්‍රතිකාර සඳහා දරන ලද වියදම් ප්‍රතිපූරණ හිමිකමක් ලැබෙන අතර, ත්‍යාග දිනාගැනීමටද හිමිකම් ලැබේ. ණය පහසුකම් හා සම්බන්ධ කරණු ලැබූ තවත් ණය තැන්පතු ක්‍රමයක් වන සුව සෙවන මහජන බැංකුව විසින් හඳුන්වා දෙනු ලැබිය. සෞඛ්‍ය සේවාවේ නිරත හෙදියන් සඳහා මෙම ගිණුම් පහසුව ලබාදී ඇත. ලොතරැයි දිනුම් ඇදීම හා ගිණුම් හිමි පවුල් ඒකකයට පමණක් සිල්ලර ව්‍යාපාර ආයතන වලින් වට්ටම් ලබාගැනීමේ හිමිකමද ඇති රන් කැදැල්ල නම්වු පවුල් ඒකක සඳහා වු ඉතිරි කිරිමේ ක්‍රමයක් ලංකා බැංකුව විසින් හඳුන්වා දෙන ලදී.

හැටන් නැෂනල් බැංකුව 'රිදී රේඛා' නම්වූ නව ආයෝජන ක්‍රමයක් හඳුන්වා දුන් අතර ඒ යටතේ තැන්පතු කරුවන් සඳහා ජීවිත රක්ෂණ ආවරණයක් සපයන ලදී. මීට අමතරව, මෙම බැංකුව නේවාසික නොවන විදේශ මුදල් ගිණුම් හා නේවාසික විදේශ මුදල් ගිණුම් හිමියන් සඳහා පැතුම් උදානය නම්වූ වාසනා දිනුම් ඇදීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. සීමාසහිත ලංකා වාණිජ බැංකුව ප්‍රගති ඉතුරුම් ගිණුම් නම්වූ නව තැන්පතු ක්‍රමයක් හඳුන්වා දුනි. මේ ක්‍රමය යටතේ මුදල් ආපසු ගැනීමක් කර නැත්නම්, ඉතිරි කිරීමේ ගිණුම මත උපයන පොලිය මෙන් සියයට 25 ක්වූ දීමනාවක් ගණුදෙනුකරුවන් සඳහා ගෙවනු ලැබේ. සීමාසහිත පැන් ඒෂියා බැංකුව ළමයින් සඳහා ළමාසෙත නම්වූ නව තැන්පතු ක්‍රමයක් ඇරඹීය.

ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සම්පාදනය කරනු ලැබූ ධීවර අංශයේ ප්‍රජා සංවර්ධන ණය ව්‍යාපෘතිය, උතුරු මැද පලාතේ යටිතල පහසුකම් දියුණු කිරීමේ ණය වැඩ සටහන සහ වයඹ පලාත් සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මහජන බැංකුව සහභාගී ණය දෙන ආයතනයක් ලෙස සම්බන්ධ විය. ධීවරයන් විසින් කරගෙන යනු ලබන ස්වයං රැකියා කටයුතු වලට ණය සැපයීම සඳහා ධීවර අංශයේ ප්‍රජා සංවර්ධන ණය යෝජනා ක්‍රමය 1996 දී ලංකා බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව ලංකා බැංකුව විසිතුරු මාලු ඇති කිරීම සඳහා පාදුක්කේ නියාමක ව්‍යාපෘතියක් දියත් කළ අතර ඒ සඳහා ණය පහසුකම් ලබාදෙන ලදී.

හැටන් නැෂනල් බැංකුව, ලංකා බැංකුව සහ මහජන බැංකුව සමෘද්ධි වැඩ පිළිවෙල යටතේ සමෘද්ධිලාභී පවුල්වලින් ඉතිරි කිරීම් එක්රැස් කිරීමට කටයුතු කළහ. මේ ක්‍රමය යටතේ, ගම්වල අඩු ආදායම් ලබන පුද්ගලයන් සඳහා ණය පහසුකම් ලබාදීම පිණිස තෝරාගත් සමෘද්ධි නියාමකයන් වෙත ණය ප්‍රදානය කරන ලදී. සුළු පරිමාණ කෘෂිකාර්මික හා කාර්මික ව්‍යාපෘති, සුළු පරිමාණ ව්‍යාපාරික කටයුතු වැනි ආදායම් උපදවන ආර්ථික කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා වූ අලුතින් පටන් ගැනීමට සේවා වියුක්ති සමෘද්ධිලාභීන් නොවන පුද්ගලයන්ට මූලධනමය සහායන් දීම සඳහා මෙම බැංකු තුන සුරතුර ණය ක්‍රමය දියත් කළහ.

මීට අමතරව මහජන බැංකුව නව ණය යෝජනා ක්‍රම දෙකක් දියත් කළේය. මින් එකක් විද්‍යුත් උපකරණ මිලදී ගැනීම සඳහා මාධ්‍යවේදීන් සඳහාවූ අතර, අනෙක රජයේ සේවයට අයත් නොවූ දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ට පෞද්ගලික සායන පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික උපකරණ මිලදී ගැනීම සඳහා විය. මහජන බැංකුව ග්‍රාම නිලධාරීන්ට මෝටර් සයිකල් මිලදී ගැනීම සඳහා සහනදායී පොලී අනුපාතික යටතේ ණය ක්‍රමයක් හඳුන්වා දුනි. විදේශ රැකියා සඳහා දකුණු කොරියාව බලා යන තරුණ පිරිස්වලට උපකාර කිරීම සඳහා මහජන බැංකුව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහාය ඇතිව නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දුනි. ලංකා බැංකුව ගොවින් සඳහා ගොවි සංවිධාන මගින් වගා ණය සපයනු ලැබූ අතර, සීමසහිත පැන් ඒෂියා බැංකුව උපයන විට ණය ගෙවීම් ණය යෝජනා ක්‍රමය, මෝටර් රථයක් හිමිකර ගැනීමේ ණය යෝජනා ක්‍රමය හා නිවසක් අයිති කර ගැනීමේ ණය ක්‍රමය යනුවෙන් නව ණය යෝජනා ක්‍රම තුනක් හඳුන්වා දුන්නේය.

වර්ෂය තුල සීමාසහිත යුනියන් බැංකුව විසින් පොලී අනුපාතික පිළිබඳ ( Interest Rate Cap Arrangements ) ඉහල සීමා ගිවිසුම් සහ පොලී අනුපාතික අවම සහ උපරිම සීමා ගිවිසුම ( Interest Rate Floor and Cap Arrangements ) පිළිබඳ කටයුතු වල නිරත විය. වාණිජ බැංකු බොහෝමයක්, සිය ව්‍යාපාරික ගණුදෙනු කාර සමාගම් නිකුත් කළ වාණිජ පත්‍ර පිළිබඳ බැංකු කරුවන් ලෙස ක්‍රියා කළහ. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පද්ධතිය පුළුල් කරමින් 1996 දී ටෙලර් යන්ත්‍ර 26 ක් සවිකිරීමත් සමග 1996 අවසානයට ක්‍රියාත්මකවූ මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 161 ක් විය.

## 10.7 ණය තොරතුරු කාර්යාංශය

1996 ජනවාරි බෝම්බ පිපිරීමත් සමග ඇතිවූ ගින්නෙන් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සම්පූර්ණයෙන් විනාශවීමත් සමග අධිකාරියේ කටයුතු විශාල පසුබෑමකට ලක්විය. කෙසේ වුවද, මසක් ඇතුලත අධිකාරිය නව ස්ථානයක ප්‍රතිෂ්ඨාපිත කර නව උපකරණ මිලදී ගෙන 1996 මාර්තු මාසයේ ක්‍රියාකාරී කටයුතු ආරම්භ කරනු ලැබීය. සියලුම වාර්තා සහ උපකරණ ගින්නෙන් විනාශ වුවද, සුරැකුම් පරිගණක දත්ත භාවිතයෙන් ණය තොරතුරු යලි ගොඩනැගූ අතර, දත්ත පදනම යලි සකස් කෙරුණි.

වර්ෂය තුල අධිකාරිය විසින් එහි කොටස් හිමියන්ට වාර්තා 79,110 ක් සපයන ලදී. ණය ගිණුම් පිළිබඳ වාර්තා සැපයීමේ අවම සීමාවන් විධිමත් නොවන ණය ගිණුම් සඳහා රුපියල් ලක්ෂයක්ද, විධිමත් ණය ගිණුම් සඳහා රුපියල් ලක්ෂ 5 ක් වශයෙන්ද නොවෙනස්ව පැවනි. එහි දත්ත පදනම ක්‍රමවත්ව යාවත්කාලීන කිරීම මගින් අධිකාරිය සැමවිටම එහි වාර්තාවල ගුණාත්වය වර්ධනය කිරීමට උත්සුක විය. අවිධිමත් ණය පිළිබඳ දත්ත පදනම් යාවත්කාලීන කිරීම මාසිකව කරගෙන ගිය අතර, මෙතෙක් කාර්තුමය ලෙස යාවත්කාලීන කරමින් තිබූ බස්නාහිර පළාතේ විධිමත් ගිණුම් මාසිකව යාවත්කාලීන කෙරිණ. බැංකු ව්‍යාපාර අංශයේ වැදගත් කොටසකට නිවැරදි ණය තොරතුරු ලබාදීමට මෙමගින් කාර්යාංශයට හැකිවිය. වර්ෂය අවසානයට කාර්යාංශයේ දත්ත පදනමේ ණය ගිණුම් 72,700 ක් විය.

කාර්යාංශය විසින් සිය කොටස්කරුවන්ට අපේක්ෂිත ණය ගන්නන් පිළිබඳව සැපයූ තොරතුරු, අයැදුම් කිරීමකින් ලබාගැනීමට එම අපේක්ෂිත ණය ගන්නන්ට හැකිවන අයුරින් නීති සැකසීමෙන් 1995 ණය තොරතුරු කාර්යාංශ සංශෝධන පනතේ රීති සකස් කිරීමට කාර්යාංශය කටයුතු කළේය.

වර්ෂය තුල එක් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සහ එක් මූල්‍ය සමාගමක් කාර්යාංශයේ කොටස්කරුවන් ලෙස ඇතුළුකර ගැනීමත් සමග, මුළු කොටස් කරුවන්ගේ සංඛ්‍යාව 58 ක් බවට පත්විය.

## 10.8 ග්‍රාමීය බැංකු කටයුතු හා ග්‍රාමීය ණය

### ග්‍රාමීය ණය ප්‍රතිපත්තිය හා මූලික වර්ධනයන්

විශේෂයෙන් ම රැකියා විරහිත උගත් තරුණ තරුණියන් අතරෙහි ස්වයංරැකියා අවස්ථා ඇති කිරීම සඳහා සුළු පරිමාණ ණය දීම් කෙරෙහි අවධානයක් යොමු වීම, 1996 වසරේ දී අනුගමනය කරන ලද ග්‍රාමීය ණය ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණයක් විය. ආර්ථිකයෙහි නිශ්චිත අංශයන්ට ණය සැපයීම සඳහා විදේශ අරමුදල් සම්පාදිත ග්‍රාමීය ණය යෝජනා ක්‍රම කෙරෙහි විශ්වාසය තැබීමේ ප්‍රතිපත්තිය තවදුරටත් පවත්වාගත් අතර ම

රජයේ ආධාර ඇතිව නව සුළු පරිමාණ ණය යෝජනා ක්‍රම දෙකක් මෙම වසර තුළ දී ආරම්භ කරන ලදී. එනම් සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වූ සමෘද්ධි සංවර්ධන ණය යෝජනා ක්‍රමය හෙවත් සසණ යෝජනා ක්‍රමය සහ සමෘද්ධි ප්‍රතිලාභ නොලබනන්නන් සඳහා වූ සුළු ව්‍යවසායී ණය දීම මගින් ස්වයං රැකියා දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය හෙවත් 'සුරතුර දිරිය' යෝජනා ක්‍රමයත් ය. මෙම යොජන ක්‍රම දෙක සඳහා යොදාගන්නා ලද උපායමාර්ගය වූයේ සහනදායී කොන්දේසි මත ණය ලබාදීමයි. තවද, පුහුණුවීම, අලෙවිකරණය, අනිවාර්ය ඉතිරිකිරීම්, මහා පරිමාණ කර්මාන්තකරුවන් සමග උප කොන්ත්‍රාත් ඇතිකර ගැනීම ආදී කාර්යයන් සියල්ලක් ම අඩංගු ණය හා සම්බන්ධිත සේවා රාශියක් ඉගත කී ණය ක්‍රමවලින් ලබා දේ. මෙම ණය උපාය මාර්ගයේ අරමුණ වන්නේ සුදුසු ණයලාභීන්ගේ ව්‍යාපෘති සාර්ථක කරගැනීමට අවශ්‍ය යෝග්‍ය වාතාවරණයක් නිර්මාණය කරදීමයි.

1994 වසරේ දී හඳුන්වාදෙනු ලැබූ රජයේ පොලී සහනාධරයක් සමග බැංකු ක්‍රමය තුළින් ම උත්පාදිත සම්පත් තුළින් කෙටිකාලීන කෘෂිකාර්මික ණය අවශ්‍යතාවයන් සපුරාලීමේ උපායමාර්ග තවදුරටත් විමර්ශනයට ලක්වන වර්ෂයේ දී ක්‍රියාත්මක විය. නව සපිරි ග්‍රාමීය ණය යොජනා ක්‍රමය යටතට ගැනෙන වී සහ අනෙකුත් අතිරේක ආහාර භෝග වගා කිරීම සඳහා මෙම වැඩසටහන යටතේ ණය මුදල් ප්‍රාදානය කරන ලදී.

දිස්ත්‍රික් පදනමක් සහිත ව ක්‍රියාත්මක වූ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පළාත් පදනමකින් යුතු ප්‍රාදේශීය සංවර්ධන බැංකු (ප්‍රාසංබැං) වශයෙන් ඒකාබද්ධ කිරීම තුළින් දැනට පවතින ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම, විමර්ශනයට භාජන වන වසර තුළ දී සිදුවූ වැදගත් දියුණුවකි.

ඒ අතර ම රටේ ග්‍රාමීය අංශයේ මූල්‍ය හා සංවර්ධන අවශ්‍යතාවයන් සපුරාලීමේ අදහසින්, පුද්ගලික අංශයේ ආයතන කිහිපයක් විසින් සංවර්ධන හා ඉතිරි කිරීමේ බැංකු පිහිටුවීමට අවශ්‍ය මූලික කටයුතු අවසන් කරන ලදී. සුළු පරිමාණ ඉතිරිකිරීම් හා ණය සංගම්වලින් සමන්විත වන අවිධිමත් අංශය, සිය සාමාජිකයන්ගේ ඉතිරිකිරීම් ඒකරාශී කිරීමේ හා ඔවුන්ට සුළු ප්‍රමාණයෙහි ණය මුදල් සැපයීමේ කාර්යයන්හි දී සීඝ්‍ර දියුණුවක් 1996 වසර තුළ දී පෙන්නුම් කළේ ය. ග්‍රාමීය ණය පථය තුළට මෙවැනි ජනතා මූලික සංවිධාන ඇතුළත් වීම, ප්‍රදේශ පදනම් කරගත් සහභාගිත්ව ණය කටයුතු ප්‍රවර්ධනය කිරීමේ දී සිදුවූ ඵලදායී දියුණුවක් වශයෙන් දැකිය හැකිය.

## නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය

1996 වසර තුළ දී බැංකු විසින් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කරන ලද ණය මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 586 ක් වූ අතර, එය පෙර වසරට වඩා සියයට 51 ක අඩුවීමක් පෙන්නුම් කළේ ය. ඊට අනුරූප ව 1995 වසරේ දී ප්‍රදානය කරන ලද 82,000 ක් වූ ණය සංඛ්‍යාව 1996 වසරේ දී 30,810 දක්වා තියුණු අඩුවීමක් වාර්තා කළේ ය. 1996 වසරේ දී මෙම යෝජන ක්‍රමය පෙන්නුම් කළ අසතුටුදායක ක්‍රියාකාරීත්වයට කරුණු කීපයක් දායක වී ඇත. එනම් වසර තුළ දී පැවති දැඩි නියගය හේතුවෙන් වගාව සඳහා යොදාගත් ඉඩම් ප්‍රමාණය අඩුවීම, 1994 වසරේ දී රජය විසින් ගොවීනට හඳුන්වා දෙනු ලැබූ සහන වැඩපිළිවෙළේ කොන්දේසියක් වූ නොගෙවූ ණය

**සංඛ්‍යා සටහන 10.9**

**නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද වගා ණය (1996 .12.31 දිනට පැවැති තත්ත්වය)**

රුපියල් දශලක්ෂ

| වගා කන්නය | රාජ්‍ය බැංකු | | | දේශීය පෞද්ගලික බැංකු (අ) | | | ප්‍රා. ග්‍රා. සං. බැංකු | | | මුළු ණය මුදල (ආ) | | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද මුළු ණය ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වී | අතුරු ආහාර බෝග | එකතුව | වී | අතුරු ආහාර බෝග | එකතුව | වී | අතුරු ආහාර බෝග | එකතුව | වී | අතුරු ආහාර බෝග | |
| 1991 / 92 මහ | 365 | 94 | 459 | 18 | 5 | 23 | 100 | 49 | 149 | 484 | 148 | 632 |
| 1992 යල | 96 | 57 | 153 | 1 | 4 | 5 | 38 | 38 | 76 | 134 | 99 | 233 |
| වගා වර්ෂය 1992 | 461 | 151 | 612 | 19 | 10 | 29 | 138 | 87 | 225 | 618 | 247 | 865 |
| 1992 / 93 මහ | 315 | 89 | 404 | 17 | 15 | 32 | 87 | 81 | 168 | 418 | 185 | 603 |
| 1993 යල | 140 | 76 | 216 | 2 | 6 | 8 | 43 | 51 | 94 | 185 | 132 | 317 |
| වගා වර්ෂය 1993 | 455 | 165 | 620 | 19 | 21 | 40 | 130 | 132 | 262 | 603 | 317 | 920 |
| 1993 / 94 මහ | 308 | 85 | 393 | 23 | 22 | 45 | 122 | 73 | 195 | 453 | 180 | 633 |
| 1994 යල (ඇ) | 136 | 64 | 200 | 8 | 35 | 43 | 62 | 38 | 100 | 207 | 136 | 343 |
| වගා වර්ෂය 1994 | 444 | 149 | 593 | 31 | 57 | 88 | 184 | 111 | 295 | 660 | 316 | 976 |
| 1994 / 95 මහ | 516 | 182 | 698 | 18 | 18 | 36 | 37 | 22 | 59 | 571 | 222 | 793 |
| 1995 යල | 179 | 131 | 310 | 8 | 23 | 31 | 34 | 22 | 56 | 221 | 176 | 397 |
| වගා වර්ෂය 1995 | 695 | 313 | 1,008 | 26 | 41 | 67 | 71 | 44 | 115 | 792 | 398 | 1,190 |
| 1995 / 96 මහ | 265 | 76 | 341 | 18 | 28 | 46 | 25 | 33 | 58 | 308 | 137 | 445 |
| 1996 යල | 71 | 33 | 104 | 3 | 12 | 15 | 14 | 8 | 22 | 88 | 53 | 141 |
| වගා වර්ෂය 1996 | 336 | 109 | 445 | 21 | 40 | 61 | 39 | 41 | 80 | 396 | 190 | 586 |

(අ) හැටන් නැෂනල් බැංකුව, ලංකා වාණිජ බැංකුව සහ සෙලාන් බැංකුව පමණි

(ආ) 1992 වර්ෂයේ මුළු එකතුවෙහි විවිධ සේවා සමුපකාරවලින් ප්‍රදානය කරන ලද සුළු ණය ප්‍රමාණයක් ඇතුළත්ය

(ඇ) 1994 අප්‍රේල් මාසයේ දී ප්‍රතිමූල්‍ය ක්‍රමය ඉවත් කර ඒ වෙනුවට පොලී සහනාධාර ක්‍රමය ආරම්භ කරන ලදී

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ශේෂයන්ගෙන් සියයට 25 ක් ආපසු ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් බොහෝ ගොවීන් නව ණය ලබාගැනීමට නුසුදුස්සන් වීම සහ 1995 දී අත්දුටු ඉහළ ණය පැහැරහැරීමේ අනුපාතය හේතුවෙන් ග්‍රාමීය අංශයට ණය දීම කෙරෙහි බැංකු විසින් සුපරීක්ෂාකාරී පිළිවෙතක් අනුගමනය කිරීම යනාදියයි. මුළු ණය මුදලින් 1995/96 මහ කන්නයේ දී රුපියල් දශ ලක්ෂ 445 ක් ද, 1996 යල කන්නයේදී රුපියල් දශ ලක්ෂ 141 ක් ද ප්‍රදානය කර ඇත. සුපුරුදු පිරිදි මුළු ණය මුදල්වලින් සියයට 68 ක් වී වගාව සඳහා යෙදුණු අතර, ඉතිරි ප්‍රමාණය අගාර භෝග සඳහා යෙදවිණි.

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ, රජය විසින් 1994 දී හඳුන්වා දෙන ලද කෘෂිකාර්මික ණය සඳහා වූ පොලී සහනාධාර ක්‍රමය යටතේ දින 270 ක උපරිම කාලයක් සඳහා දෙනු ලබන කෘෂිකාර්මික ණය වලට වාර්ෂික ව සියයට 7.5 ක පොලී සහනාධාරයක් අදාල බැංකුවලට ගෙවන ලදී. එම නිසා තම අරමුදල් පිරිවැය නොසලකා සියයට 16 ක වාර්ෂික පොලියකට ගොවීනට ණය ලාබදීමට මෙම සහානාධාරය යටතේ ණයදුන් බැංකුවලට හැකි විය. 1995 යළ හා 1995/96 මහ කන්නවල දී ප්‍රදානය කරන ලද වගා ණය වෙනුවෙන් 1996 දී බැංකුවලට ගෙවනු ලැබූ මුළු පොලී සහනාධාරයේ වටිනාකම රුපියල් දශ ලක්ෂ 14.5 ක් විය.

1986 යල හා 1993/94 මහ කන්නය අතර කාලයේ දී ණය පැහැරහැරි ගොවීන්ට 1994 දී රජය ලබා දුන් ගොවි සහන වැඩ පිළිවෙළ යටතේ සහන ලබාගැනීම, 1997 වර්ෂයේ යල කන්නය දක්වා ඉඩදීමට රජය එකග විය. සහභාගීත්ව ණය කාපහැරීමේ ක්‍රමයක් තුළින් ණය පැහැරහැරි ගොවීන්ගෙ ගිණුම් ක්‍රමාණුකූල කරගැනීම සඳහා අවස්ථාව ලබා දීමෙන් ණය පැහැරහැරි වැඩි ගොවීන් සංඛ්‍යාවක් විධිමත් අංශය කෙරෙහි නැඹුරු කිරීම මේ ආකාරයෙන් මෙම සහන ක්‍රමය දීර්ඝ කිරීම තුළින් අපේක්ෂා කරන ලදී. මෙමගින් හොඳ වාර්තාවක් ඇති ණයකරුවන්ගෙන් අලුතින් ණය ලබා ගැනීමට ඔවුන් සුදුස්සන් වේ. රජයේ සහන වැඩ පිළිවෙළ හේතුකොටගෙන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය ඇප ආවරණ ක්‍රමය යටතේ මුළු ණය ඇප ආවරණ වන්දි මුදල් ලබා ගැනීමට බැංකු සුදුසුකම් ලැබීම පිණිස අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු ය යන කොන්දේසිය ලිහිල් කිරීමට සිදුවිය. එම ලිහිල් කිරීම හේතුකොටගෙන ගොවීන්ගෙන් ඔවුන් පැහැර හැර ඇති මුදලින් සියයට 25 ක් එකතු කරගත් පසු ඉතිරි වන මුල් මුදලින් අඩක් ගෙවීමට මහ බැංකුව එකග විය. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙනු ලැබූ අනෙකුත් සියලු ම ණය සඳහා සාමාන්‍ය ණය ඇප ආවරණ නීති තවදුරටත් එසේ ම අදාල විය.

## වගා රක්ෂණ යෝජනා ක්‍රම

විමර්ශනයට භාජනය වන වසර තුළ දී කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් කරගෙන යනු ලැබූ වගා රක්ෂණ යෝජනා ක්‍රමවල වර්ධනයක් සිදුවිය. රක්ෂණය සඳහා ඇතුළත් වූ නව අංශයන් වූයේ සත්ත්ව පාලනය (කුකුළන් ඇති කිරීම හැර) බඩඉරිඟු, උක්, පොල් (වසර හතරක් දක්වා) හා බුලත් වාගවන් ය. ගොවි ජනාතා විසින් යහපත් ප්‍රතිචාරයක් දක්වන ලද මෙම නව රක්ෂණ යෝජනා ක්‍රම දිවයාපත ව ක්‍රියාත්මකවිය. මේ අතර පුද්ගලික රක්ෂණ සමාගමක් වන සීමාසහිත යෙලින්කෝ රක්ෂණ සමාගම 1995 දී සුළු වශයෙන් ආරම්භ කළ ඔවුන්ගේ රක්ෂණ කටයුතු තව දුරටත් පුළුල් කළේ ය. එම සමාගමේ වගා රක්ෂණ යෝජනා ක්‍රම තෝරාගත් දිස්ත්‍රික්කයන්හි වී ගොවිතැන, බඩඉරිඟු, පළතුරු, එළවළු, සත්ත්වපාලනය හා අල වගාව සඳහා ක්‍රියාත්මක විය.

**සංඛ්‍යා සටහන 10.10**

**තැන්පතු සහ අත්තිකාරම් - ග්‍රාමීය අංශය**

රුපියල් දශලක්ෂ

| | සමුපකාර ග්‍රාමීය බැංකු | | කෘෂි සේවා මධ්‍යස්ථානවල ඇති ලංකා බැංකු උප කාර්යාල | | ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු | | සකසුරුවම් සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති | | සර්වෝදය | | ජනශක්ති බැංකුව හම්බන්තොට | | සමෘද්ධි ව්‍යාපාරය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | 1995 | 1996 | 1995 | 1996 | 1995 | 1996 | 1995 | 1996 | 1995 | 1996 | 1995 | 1996 |
| 1. මුළු ඉතිරිකිරීම් (අ) | 7,500 | 7,927 | 197 | 234 | 1,945 | 2,035 | 2,038 | 2,397 | 100 | 157 | 26 | 29 | - | 1,366 |
| ඉතිරිකිරීම් | - | ලැ.නො. | 169 | 194 | 1,595 | 1,596 | 1,049 | 1,152 | 73 | 121 | 6 | 6 | - | 8 |
| විශේෂ ඉතිරිකිරීම | - | ලැ.නො. | 4 | 5 | 8 | 22 | 509 | 631 | 27 | 36 | 7 | 9 | - | 1,347 |
| ස්ථාවර තැන්පතු | - | ලැ.නො. | 24 | 35 | 342 | 417 | 178 | 267 | - | - | 1 | 1 | - | 11 |
| කොටස් | - | - | - | - | - | - | 302 | 347 | - | - | 12 | 13 | - | - |
| 2. ප්‍රදානය කළ මුළු ණය (ආ) | 805 | 1,066 | 83 | 101 | 2,020 | 2,294 | 1,677 | 1,888 | 542 | 753 | 174 | 508 | - | 4 |
| කෘෂිකර්මය | 106 | 94 | 45 | 45 | 321 | 267 | 208 | 259 | 193 | 235 | 108 | 127 | - | ලැ.නො. |
| සත්ත්ව පාලනය | 28 | 34 | 1 | 1 | 30 | 24 | 43 | 38 | 22 | 29 | - | - | - | ලැ.නො. |
| ධීවර | - | - | - | - | 15 | 25 | - | - | - | 3 | 4 | 5 | - | ලැ.නො. |
| කුඩා කර්මාන්ත | 40 | 42 | 3 | 6 | 130 | 201 | 126 | 99 | 64 | 101 | 12 | 165 | - | ලැ.නො. |
| නිවාස තැනීම, විදුලිකරණය සහ ජල සැපයුම | 385 | 584 | | | | | | | | | | | | |
| ව්‍යාපාර / වාණිජ | - | - | 5 | 9 | - | - | 156 | 179 | - | - | 4 | 6 | - | ලැ.නො. |
| වෙනත් | 104 | 158 | 15 | 24 | 1,087 | 1,064 | 732 | 649 | 45 | 82 | 36 | 50 | - | ලැ.නො. |
| | 141 | 154 | 14 | 16 | 437 | 714 | 412 | 664 | 218 | 303 | 10 | 155 | - | ලැ.නො. |

මූලයන් ලංකා බැංකුව
මහජන බැංකුව
ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය
සණස
සර්වෝදය
කාන්තා සංවර්ධන පදනම - හම්බන්තොට

(අ) 1996 දෙසැම්බර් 31 දිනට ඉතිරිකිරීම්වල මුළු වටිනාකම
(ආ) 1995 සහ 1996 වර්ෂ තුළ දෙන ලද ණය

කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් 1996 දී රක්ෂණය කරන ලද මුළු වී වගා ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 26,000 ක් වූ අතර, මෙය 1995 දී රක්ෂණය කරන ලද හෙක්ටයාර 71,000 සමග සසඳන විට කැපී පෙනෙන අඩු වීමකි. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මෙම වසරේ දී ආවරණය කරන ලද වාග ඉඩම් ප්‍රමාණයෙහි තියුණු පහළ බැසීම මෙම අඩුවීම මගින් ද පැහැදිළි වේ. මේ අතර සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගම විසින් 1996 දී රක්ෂණය කරන ලද ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 374 ක් විය. මෙය 1995 දී රක්ෂණය කරන ලද හෙක්ටයාර 349 හා සසඳන විට සුළු වර්ධනයකි. වගා ණය සඳහා ඇප වශයෙන් පෞද්ගලික අංශයෙහි ගොවි රක්ෂණ ඔප්පු පිළිගැනීමට බැංකුවට අවසර දෙන ලද්දේ නම්, වගා රක්ෂණ ක්ෂේත්‍රයෙහි පෞද්ගලික සමාගම්වල ක්‍රියාකාරීත්වය මීට වඩා ව්‍යාප්ත වීම ට ඉඩ තිබුණි. කෘෂි රක්ෂණ මණ්ඩලය රක්ෂණ වාරික වශනේ 1996 දී රුපියල් මිලයන 16.1 ක් එකතු කර ඇති අතර, වන්දි වශයෙන් රුපියල් මිලියන 18.5 ක් ගෙවා ඇත. මෙය රුපියල් මිලයන 2.4 ක හිගයකි. සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගම, රක්ෂණ වාරික වශයෙන් රුපියල් මිලියන 0.33 ක් එකතු කළ අතර, වන්දි වශයෙන් රුපියල් මිලියන 0.21 ක් ගෙවා ඇත.

## සුළු පරිමාණ ණය හා ඉතිරිකිරීම්

### (අ) සමෘද්ධි සංවර්ධන ණය යොජනා ක්‍රමය හෙවත් සසණ යෝජනා ක්‍රමය

සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ආදායම් මට්ටම් හා ජීවන තත්ත්වය උසස් කරලීමේ පරමාර්ථයෙන් යුතු ව යෞවන කටයුතු, ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය විසින් දැනටමත් රටපුරා විසිරී සිටින සමෘද්ධි නියාමකයින් හා සමෘද්ධි කළමනාකරුවන්ගේ සේවය යොදා ගනිමින් ලංකා බැංකුව හා මහජන බැංකු අනුග්‍රහයෙන් 'සසණ' නමින් නව සුළු ව්‍යවසායී ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කර ඇත. නව ආදායම් ඉපදවීමේ ව්‍යාපෘති ආරම්භ කිරීමට හෝ දැනටමත් තිබෙන ව්‍යාපෘති පුළුල් කිරීමට හෝ රු. 2,500/- සිට රු. 10,000/- දක්වා සුළු පරිමාණ ණය මුදල් ලබා ගැනීමට මෙම ණය යොජනා ක්‍රමය යටතේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල සාමජිකයෝ සුදුසුකම් ලබති. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සුළු පරිමාණ ණය මුදල් ලබා ගැනීම සුදුස්සන් වීම සඳහා සමෘද්ධිලාභී පවුලක් විසින් රු. 2,000/- ක අවම ඉතිරි කිරීමක් සමෘද්ධි බැංකු සමිතියක පවත්වාගත යුතු ය.

සමෘද්ධි ප්‍රතිලාභීන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කිරීමේ අටියෙන්, විමර්ශනයට භාජනය වන වර්ෂය තුල, තෝරාගත් දිස්ත්‍රික්කවල සමෘද්ධි බැංකු සමිති 82 ක් පිහිටුවනලදී. තමන්ගේ කැමැත්තෙන් කරනු ලබන ඉතිරිකිරීම්වලට අමතර ව, සමෘද්ධි ප්‍රතිලාභීන් විසින් මෙම බැංකු සමිතිවල කොටස්වල මුදල් ආයෝජනය කළ යුතු විය. විමසුමට භාජනය වන වසර අවසානයේ දී, සමෘද්ධි ප්‍රතිලාභීන් විසින් හිමිකරගෙන සිටි කොටස්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 107 ක් වූ අතර, ඉතිරි කිරීම් රුපියල් දශලක්ෂ 8 ක් විය. මීට අමතර ව සමෘද්ධි ප්‍රතිලාභීන් විසින් මාසික ව රු. 500/- සිට රු. 1000/- දක්වා වූ අනිවාර්ය ඉතිරිකිරීම් යෝජනා ක්‍රමයකට දායක විය යුතු අතර, එම දායක මුදල් ඔවුනට ප්‍රතිලාභ බෙදාහැරුණු අවස්ථාවේ දී ම රැස්කරගන්නා ලදී. 1996 වර්ෂය අවසානය වන විට මෙලෙස රැස්කර ගන්නා ලද අනිවාර්ය ඉතිරිකිරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,347.5 ක් විය. සමෘද්ධි ප්‍රතිලාභීන් අතර ම කුඩා ණයමුදල් ප්‍රදානය කිරීමේ දී භාවිතා කළ යුතු කොන්දේසි, නිතිරීති හා මාර්ගොපදේශයන් ආදිය සැලසුම් කරන තෙක් මෙසේ ඒකරාශි කරන ලද සම්පූර්ණ ඉතිරි කිරීම් ප්‍රමාණය සමෘද්ධි අධිකාරිය විසින් භාණ්ඩාගාර බිල්පත් හා බැංකු තැන්පතුවල ආයෝජනය කර ඇත.

### (ආ) සුරතුර දිරිය වැඩසටහන - සුළු ව්‍යවසාය ණය තුළින් ස්වයංරැකියා ප්‍රවර්ධනය

සමෘද්ධි ප්‍රතිලාභීන් නොවන අය ඉලක්ක කරගත් දෙවැනි සුළු ව්‍යවසාය ණය යෝජනා ක්‍රමයක් 1996 වසර අවසානවත් ම රජය විසින් දියත් කරන ලදී. 'සුරතුර දිරිය' වැඩසටහන යනුවෙන් නම් කරන ලද මෙම ණය ක්‍රමය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකා බැංකුව, මහජන බැංකුව හා හැටන් නැෂනල් බැංකුව අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කෙරේ. මෙහි දී දිවයින පුරා විසිරී සිටින සමෘද්ධි නියාමකයන් හා සමෘද්ධි කළමනාකරුවන්ගේ සහාය මේ සඳහා ලැබේ. මෙම වැඩසටහන යටතේ සමෘධි ප්‍රතිලාභීන් වූ උගත් රැකියා විරහිත තරුණයන් හට ආදායම් උපදවා ගැනීමේ ස්වයංරැකියා කටයුතු සඳහා වාර්ෂික ව සියයට 10 ක පොලී අනුපාතිකයක් යටතේ රු. 50,000/- දක්වා ණය ලබාගත හැකි ය. 'ණය සමග සම්ප වීම' අරුතැති ව උවමනා කරන සියලු ම දේ ඇතුළත් ණය වශයනේ ප්‍රතිලාභීන්ට මෙම ණය ප්‍රදානය කරන ලදී. මෙම 'ණය සමග සේවා රැසක්' (කරුසළු ඒකම වවරද්ජය- යන සංකල්පය යටතේ පුහුණුවීම්, අලෙවිකරණය, මහා පරිමාණ කර්මාන්තකරුවන් සහ වෙළෙඳුන් සමග සම්බන්ධ කිරීම ආදී පුළුල් පරාසයක් තුළ ව්‍යාප්ත වූ සහාය සේවා රැසක් ප්‍රතිලාභී කණ්ඩායම් වෙත බැංකුව විසින් සපයන ලදී. මෙම වැසටහන යටතේ 1996 වසර අවසානය වන විට ප්‍රතිලාභීන් 2,400 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 78 ක් ලබා දී ඇත.

### (ඇ) හම්බන්තොට ජනශක්ති බැංකු සංගම්

ජනශක්ති බැංකු සංගම් යනු ඉතිරිකිරීම් සංචලනයට හා තම සමාජිකයන්හට සුළු ණය සැපයීමේ අරමුණු ඇතිව හම්බන්තොට දිස්ත්‍රික්කයේ කාන්තා සංවර්ධන සමුළුව විසින් පිහටුවා ගන්නා ලද අවිධිමත් ඉතිරිකිරීම් හා ණය සංගම් විශේෂයකි. කාන්තා සාමාජිකාවන් විසින් පමණක් පාලනය කරනු ලබන මෙම සංවිධාන අවිධිමත් ඉතිරි කිරීම් ක්‍රමයක් තුළින් සංවිධානාත්මක විධිමත් ස්වේච්ඡා සංවිධානයක් දක්වා ක්‍රමයෙන් දියුණු වූවකි. සමාජිකාවන්ගේ ජීවන තත්තවය උසස් කිරීම, සමාජීය පිළිගැනීම ඇති කිරීම, සෞඛ්‍ය හා පෝෂණ මට්ටම් වැඩිදියුණු කිරීම ආදිය මගින් සාමාජිකත්වයෙහි අංග සම්පූර්ණ වර්ධනයක් ඇති කිරීම මෙම සමිතිවල අරමුණ වේ. 1996 වසර අවසානයේ දී, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනශක්ති බැංකු සංගම් 67 ක් තිබූ අතර, සාමාජික සංඛ්‍යාව 26,000 ක් විය. 1996 වසර අවසානය දක්වා සාමාජිකාවන් විසින් ඉතිරි කරන ලද රුපියල් දශ ලක්ෂ 28 ක ප්‍රමාණය සංගමයේ කොටස්වල ඉතිරිකිරීම් හා ආයෝජන වශයෙන් තැන්පත් කර ඇත. මෙම වසර අවසානය වන විට, දී ඇති මුළු ණය ප්‍රමාණය රුපියල් මිලයන 217.4 ක් වන අතර, මූලික වශයෙන් ණය මුදාහැර ඇත්තේ කෘෂිකර්මය, කුඩා කර්මාන්ත හා වෙළෙඳාම් කටයුතු සඳහා ය. අරමුදල් ලබාගත් මූල වූයේ සාමාජිකයන්ගේ ඉතිරි කිරීම් සහ ජාතික සංවර්ධන භාරකාර අරමුදලෙන් ලබාගත් ණයයි. මෙම ණය සඳහා වන වාර්ෂික පොලිය සියයට 36 ක් වශයෙන් 1996 වසර තුළ දී නො වෙනස් ව පැවතිණි.

### (ඇ) සර්වෝදය ග්‍රාමීය ව්‍යාවසායකත්ව ව්‍යාපෘතිය

මෙම වැඩසටහන යටතේ සර්වෝදය ශ්‍රමදාන සමිති පිහිටුවා ඇති අතර, එමගින් සාමාජිකයන්ගෙ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම, ඔවුන් අතර ඉතිරි කිරීමේ පුරුදු ඇති කිරීම හා ඔවුන්ගෙ සුළු පරිමාණ මූල්‍ය අවශ්‍යතා ඉටුකරදීම බලාපොරොත්තු වේ. 1996 වසර අවසානය වන විට දිස්ත්‍රික්ක 20 ක මෙවැනි සංගම් 2,000 ක් පිහිටුවා තිබුණි. සාමාජිකයන්හට ණය ලබාදෙනුයේ ඔවුන් විසින් අවම වශයෙන් හය මසකවත් අනිවාර්ය ඉතිරිකිරීමේ ගිණුමක් සමිති සමග පවත්වා ගෙන ගියහොත් පමණි. සාමාජිකයෙකුට දෙනු ලබන උපරිම ණය ප්‍රමාණය රු. 30,000 කි. 1996 වසර අවසානය වන විට මෙම ව්‍යාපෘතිය යටතේ සාමාජිකයන්හිට සුළු ව්‍යාපාර ණය වශයෙන් රුපියල් දශ ලක්ෂ 7,525 ක් ලබා දී ඇත.

### (ඉ) සමුපකාර ණය දෙන සමිති-සුළු පරිමාණ මූල්‍යකරණ වැඩසටහන

සමුපකාර ණයදෙන සමිති (සණස) මගින් එහි සාමාජිකයන්ගේ ඉතිරිකිරීම්, තැන්පතු වශයෙන් සණස ප්‍රාථමික සමිතිවල පවත්වාගෙන යන අතර, සාමාජිකයන්ගෙ හදිසි මූල්‍ය අවශ්‍යතා සඳහා සුළු පරිමාණ මූල්‍ය පහසුකම් සපයයි. ඉතා සරල පිළිවෙත අනුගමනය කරමින් වෙළෙඳපොළේ පවතින පොලී අනුපාතයන්ට මෙම සුළු පරිමාණ ණය පහසුකම් සාමාජිකයන් වෙත ලබා දේ. ඉතා එලදායී ණය සැපයීම යටතේ සුළු පරිමාණ ණය පහසුකම් යටතේ දෙන ලද ණය ආපසු අයකර ගැනීමේ ප්‍රතිශතය සියයට 99 ක් දක්වා පවත්වා ගැනීමට සණස සමත් වී ඇත. 1996 වසරේදී දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,888 ක් විය.

## 10.9 අනෙකුත් මූල්‍ය ආයතන

### ඉතිරිකිරීමේ ආයතන

1996 දී ජාතික ඉතිරිකිරීමේ බැංකුව එහි තැන්පතු එක්රැස් කිරීමේ කටයුතු වර්ධනය කළේය. එහි පුළුල් ශාඛා පද්ධතියද සමග තරගකාරී පොලී අනුපාතික පවත්වා ගැනීමේ වාසිය අත්පත් කර ගැනීමෙන් පසුගිය වර්ෂයේ රැස්කරනු ලැබූ රුපියල් දශලක්ෂ 4,430 ට සාපේක්ෂව වර්ෂය තුල රුපියල් දශලක්ෂ 9,080 ක් වූ තැන්පතු රැස්කිරීමට බැංකුවට හැකිවිය. එම නිසා, 1996 අවසාන වනවිට එහි මුළු තැන්පතු රුපියල් දශලක්ෂ 66,835 දක්වා වැඩිවිය. පාස්පොත් ඉතිරි කිරීම්, ස්ථාවර තැන්පතු විශ්‍රාම වැටුප් ක්‍රමය, තිළිණ ගිණුම්, ඉතිරි කිරීමේ වාසනාපත්, තිළිනපත්, ඉතුරුම් කරුවන්ගේ නිවාස ණය ක්‍රමය හා සුරැකුම් ගිණුම් වැනි ඉතිරි කිරීමේ උපකරණ මාර්ගයෙන් බැංකුව ඉතිරි කිරීම් එක්රැස් කළේය. වර්ෂය තුල ස්ථාවර තැන්පතු සියයට 15 කින් (රුපියල් දශලක්ෂ 5,475) වැඩිවූ අතර ඉතිරි කිරීම් තැන්පතු සියයට 17 කින් (රුපියල් දශලක්ෂ ,3,595) වැඩිවිය. ජා.ඉ.බැ. විශ්‍රාම වැටුප් ක්‍රමය සහ ඉතිරි කිරීමේ වාසනාපත්ද ඇතුලත්ව, අනෙකුත් තැන්පතු සියයට 10.9 ක (රුපියල් දශලක්ෂ 10) වැඩිවීමක් පෙන්විය. අනෙකුත් වෙළෙඳ පොළවල පොලී අනුපාතිකයන්හි හැසිරීමට අනුකූලව යමින් වර්ෂයේ මුල් කාලයේ ජා.ඉ.බැ. පොලී අනුපාතික අඩු කෙරුණි. ඒ අනුව 1996 පෙබරවාරි මාසයේදී මාස 3 ස්ථාවර තැන්පතු සඳහා අදාල වන පොලිය සියයට 14 සිට සියයට 12 දක්වා ද පහත හෙලන ලදී. පරිණතවීමේදී පොලී ගෙවිය යුතු මාස 12 ස්ථාවර තැන්පතු සඳහාවූ පොලී අනුපාතිකය සියයට 16 සිට 15 දක්වා 1996 දී අඩුකරනු ලැබිය. ඉතිරිකිරීම් තැන්පතු සඳහා වූ පොලී අනුපාතික සියයට 12 ක් ලෙස වර්ෂය පුරාම පැවතුනි.

ජා.ඉ.බැ. විසින් එහි ගණුදෙනුකරුවන්ට සපයනු ලැබූ සේවාවන් පුළුල් කරමින් ජීවිත රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයකට හිමිකම් ලබන 'සුරැකුම් ගිනුම' නම් වූ නව තැන්පතු ක්‍රමයක් වර්ෂය තුල හඳුන්වා දෙන ලදී. මේ ක්‍රමය යටතේ තැන්පත් කරුවන් මාස 66 ක කාලයක් සඳහා ගිවිසගත් මාසික තැන්පත් මුදලක් තැන්පත් කළයුතු අතර එම කාල සීමාවෙන් පසුව එම මාසික තැන්පතුවට සමාන මුදලක් බැංකුවෙන් තැන්පත් කරුවන්ට ලැබේ.

මුළු ආයෝජන රුපියල් දශලක්ෂ 7,720කින් වැඩිවී 1996 අවසාන වනවිට රුපියල් දශලක්ෂ 60,220 ක් විය. ආයෝජන වැඩි ප්‍රමාණයක් (සියයට 74 ක්) රජයේ සුරැකුම්පත් හි වූ අතර භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජන 1996 අවසානයේ මුළු ආයෝජන වලින් සියයට 11 ක් විය.

1996 දී රටෙහි ප්‍රධාන අධිවෘද්ධිත්ව අරමුදල වන සේවක අර්ථසාධක අරමුදලෙහි (සේ.අ.අ) කටයුතුවල වර්ධනයක් පෙන්විය. අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල් සඳහා නව සාමාජිකයන් නොබැඳිය යුතු බවට, 1996 පෙබරවාරි මාසයේදී කම්කරු අමාත්‍යාංශය විසින් ගන්නා ලද තීරණය හේතුවෙන් මෙම අරමුදල් වලට අලුතින් ලැබීමට තිබූ දායක මුදල් ද සේවක අර්ථසාධක අරමුදලට යොමුවිය. සේ.අ.අ.ට ලැබුණු දායක මුදල් 1995 රුපියල් දශලක්ෂ 8,154 හා සසඳා බලන විට 1996 දී රුපියල් දශලක්ෂ 9,000 ක් වූ අතර සාමාජිකයන්ට ශුද්ධ ප්‍රතිලාභ ගෙවීම් රුපියල් දශලක්ෂ 2,175 සිට රුපියල් දශලක්ෂ 3,000 දක්වා ඉහල ගියේය. සේ.අ.අ. ආයෝජන ආදායම් ඇතුලුව මෙම ගණුදෙනු හේතුවෙන් අරමුදලේ සාමාජික ශේෂයන් 1995 අවසානයේ රුපියල් දශලක්ෂ 85,386 සිට 1996 අවසාන වනවිට රුපියල් දශලක්ෂ 102,000 දක්වා වැඩිවිය. සේ.අ.අ. ආයෝජනයන්හි මුළු අගය 1996 අවසානයට රුපියල් දශලක්ෂ 116,098 ක් වූ අතර, එය පැහැදිලිවම රටෙහි විශාලතම තනි ආයෝජකයා විය. එහි ආයෝජන වලින් සියයට 97.7 ක් රජයේ සහ රජය සහතික කල සුරැකුම් පත්වල විය.

රටෙහි දෙවන අධිවෘද්ධිත්ව අරමුදල වන, සේවක භාරකාර අරමුදල (සේ.භා.අ) ද, 1996 දී එහි මුළු වත්කම් වල මෙන්ම දායක මුදල් වලද සැලකිය යුතු වර්ධනයක් පෙන්විය. සේ.භා.අ. මුලු වත්කම් සියයට 20 කින් වැඩිවී 1996 අවසානයට රුපියල් දශ ලක්ෂ 16,951 ක් විය. මුළු දායක මුදල් ලැබීම් 1995 රුපියල් දශලක්ෂ 1,503 සිට 1996 රුපියල් දශලක්ෂ 1,609 දක්වා වැඩිවූ අතර, සාමාජික ශේෂයන් සියයට 22 කින් වැඩිවී 1996 අවසාන වනවිට රු.දශලක්ෂ 14,798 ක් විය. මුළු ආයෝජන 1995 අවසානයේ රුපියල් දශලක්ෂ 13,236 සිට 1996 අවසානයේ රුපියල් දශලක්ෂ 16,040 ක් දක්වා වැඩිවිය. මෙම ආයෝජන වලින් විශාල ප්‍රමාණයක් සුරැකුම්පත් වල විය. මෙය මුළු ආයෝජන වලින් සියයට 59 ක් වූ අතර, එය 1995 දී සියයට 68 ක් ලෙස වාර්තා විය. එමනිසා, රජයේ සුරැකුම් පත් වලින් මාරුවීමත් සමග ආයෝජනයන්හි කිසියම් ආකාරයක විවිධාංගීකරණයක් දක්නට ලැබුනි. රජයේ සුරැකුම්පත්හි ආයෝජනය රුපියල් දශලක්ෂ 8,932 සිට රුපියල් දශලක්ෂ 9,521 දක්වා එම කාලපරිච්ඡේදය තුල වැඩිවිය. 1995 සියයට 6 සමග සසඳා බලන විට, 1996 දී මුළු ආයෝජන වලින් සියයට 10 ක්වූ වාණිජ බැංකුවල සහ උකස් සහ ආයෝජන බැංකුවේ කර ඇති ආයෝජනයන් 1995 රුපියල් දශලක්ෂ 772 සිට 1996 දී රුපියල් දශලක්ෂ 1,525 දක්වා සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවිය. ණයකර, කොටස්, ජන භාරයන්හි ආයෝජන, වාණිජ පත්‍ර ආදිය ඇතුලත් අනෙකුත් ආයෝජනයන් 1995 දී මුළු ආයෝජනය වලින් සියයට 27 සමග

සසඳා බලන විට සියයට 31 ක් විය. මෙම කාණ්ඩයේ ආයෝජනයන් සියයට 14 කින් රුපියල් දශලක්ෂ 4,994 දක්වා 1996 අවසානයේදී වැඩිවිය.

## දිගුකාලීන ණය දෙන ආයතන

1996 දී ලංකා සංවර්ධන මුදල් සංස්ථාවේ (ලං.ස.මු.ස) ණය දීමේ කටයුතු වල යම් ප්‍රමාණයක අඩුවීමක් පෙන්නුම් කරමින්, අනුමත කරනු ලැබූ මුළු ණය සංඛ්‍යාව 1995 දී 1,248 සිට වර්ෂය තුල 878 දක්වා අඩුවූ අතර, අනුමත කල මුළු ණය ප්‍රමාණයද, සියයට 28 කින් රුපියල් දශලක්ෂ 4,259 දක්වා අඩුවිය. ප්‍රදානය කරනු ලැබූ මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 836 කින් අඩුවී රුපියල් දශලක්ෂ 2,851 ක් විය. කෙසේ වුවද, 1996 අවසාන වනවිට නොපියවා ඇති මුළු ණය සියයට 13 කින් රුපියල් දශලක්ෂ 10,411 දක්වා වැඩි විය. වර්ෂය තුල දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් (සියයට 56 ක්) පෙර වර්ෂයේ මෙන්ම කාර්මික කටයුතු සඳහා විය. මුළු ණයදීම් වලින් සියයට 18 ක් කල්බදු සමාගම් ඇතුලුව මූල්‍ය ආයතනවලට ලැබුණු අතර, සංචාරක සහ කෘෂිකර්ම අංශ පිළිවෙලින් සියයට 11 ක් සහ සියයට 8 ක් භාවිතා කළහ. විදුලිය, ගෑස්, ජලය, ප්‍රජා සහ සමාජසේවා, ගමනාගමන සේවා ආදිය ඇතුළු අනෙකුත් කාර්යයන් සඳහා දෙන ලද ණය 1995 දී රුපියල් දශලක්ෂ 228 සිට 1996 දී රුපියල් දශලක්ෂ 225 ක් දක්වා අඩු විය.

ලං.ස.මු.ස. ප්‍රධානම වශයෙන් මැදිකාලීන මූල්‍යකරණය කෙරෙහි යොමුවූ බව පෙන්වමින් මුළු නොපියවා ඇති ණයවලින් සියයට 64 ක් මැදිකාලීනද, සියයට 21 ක් දිගුකාලීනද සහ සියයට 15 ක් කෙටිකාලීනද විය. මුළු නොපියවා ඇති ණය වලින් සියයට 66 ක් රුපියල් දශලක්ෂ 5 වඩා වැඩි ඒවා වූ අතර, සියයට 58 ක් දේපල උකස් ඇපයට තබාගෙන මුදාහැර ඇත. වර්ෂය තුල ප්‍රදානය කරනු ලැබූ මුළු ණය වලින් සියයට 33 ක් සියයට 16 ට වඩා අඩු පොලී අනුපාතිකයක් යටතේද, මුදාහල මුළු ණය වලින් සියයට 19 ක් සියයට 17.0-19.5 අතර, පොලී පරාසයක් තුළද, මුළු ණය දීම් වලින් සියයට 48 ක් සියයට 20 ට වඩා වැඩිවූ පොලී අනුපාතයක් යටතේද ප්‍රදානය කරනු ලැබිය.

1995 දී කොටස් ප්‍රාග්ධන මූල්‍යකරණය සඳහා සමාගම් 20 ක් සඳහා දෙන ලද රුපියල් දශලක්ෂ 361ක් හා සසඳා බලන විට ලං.ස.මු.ස., සමාගම් 5 ක් සඳහා රුපියල් දශලක්ෂ 131 ක් සැපයීය. කොටස් ප්‍රාග්ධන මූල්‍යකරණ පහසුකම් වලින් විශාල ප්‍රමාණයක් (රුපියල් දශලක්ෂ 108 ක්) කාර්මික අංශය සඳහා සැපයූ අතර, පිළිවෙලින් මූල්‍ය අංශය සහ සංචාරක අංශය සඳහා රුපියල් දශලක්ෂ 13 ක් සහ රුපියල් දශලක්ෂ 10 ක් ලබාදෙන ලදී.

වර්ෂය තුල ලං.ස.මු.ස. ප්‍රධාන අරමුදල් මාර්ගයන් වූයේ ණයදෙනුකරුවන්ගෙන් ණය ආපසු අයකර ගැනීම් (රුපියල් දශලක්ෂ 2,889), සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ ආසියානු සංවර්ධන සංගමය සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් (රුපියල් දශලක්ෂ 973) ණය ගැනීමය.

අනෙක් ප්‍රධාන දිගුකාලීන ණය දෙන ආයතනය, ජාතික සංවර්ධන බැංකුව (ජා.ස.බැ) වර්ෂය තුලදී 240 ක්වූ ණය සංඛ්‍යාවක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 7,401 ක් අනුමත කරනු ලැබිය. 1995 මෙන් 1996 දී අනුමත කල මුළු ණයෙහි වැඩිවීම සියයට 14 ක් විය. වර්ෂය තුල අනුමත කරනු ලැබූ මුළු ණය වටිනාකමෙන් සියයට 54 ක් වාර්තා කරමින් කාර්මික අංශයට ණය වලින් විශාලතම කොටස දෙන ලදී. කෘෂිකාර්මික අංශයට රුපියල් දශලක්ෂ 1,057 (මුළු ණයෙන් සියයට 14 ක්) ලැබුනි. ජා.ස.බැ. වෙන් සැලකිය යුතු ප්‍රමාණයක ණය ලැබුනු අනෙකුත් අංශයන් වූයේ සංචාරක, මූල්‍ය, නිවාස හා දේපල

සංඛ්‍යා සටහන 10.11

### දිගුකාලීන ණය දෙන ආයතනවලින් අනුමත කරන ලද හා දෙන ලද ණය - අරමුණු අනුව

රුපියල් දශලක්ෂ

| අරමුණු | ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව | | ජාතික සංවර්ධන බැංකුව (අ) | | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | | නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | | එකතුව | | අනුමත කරන ලද මුළු ණය ප්‍රමාණයේ % | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | 1995 | 1996 | 1995 | 1996 | 1995 | 1996 | 1995 | 1996 | 1995 | 1996 | 1995 | 1996 | 1995 | 1996 |
| 1. කෘෂිකර්මය | 433 | 400 | 651 | 1,057 | - | - | 25 | 26 | - | - | - | - | 1,109 | 1,483 | 6 | 9 |
| 2. කර්මාන්ත | 3,560 | 2,223 | 3,437 | 3,979 | - | - | - | - | - | - | - | - | 6,997 | 6,202 | 36 | 36 |
| 3. සංචාරක | 1,056 | 447 | 1,117 | 301 | - | - | - | - | - | - | - | - | 2,173 | 748 | 11 | 4 |
| 4. වෙළෙඳ | - | - | | - | - | | - | - | - | | | - | 0 | 0 | 0 | 0 |
| 5. මූල්‍ය | 434 | 569 | 70 | 35 | 1,600 | 999 | - | - | - | - | - | - | 2,104 | 1,603 | 11 | 9 |
| 6. නිවාස | - | - | 91 | 199 | 239 | 1,328 | 819 | 1,081 | 555 | 544 | 875 | 1,276 | 2,579 | 4,428 | 13 | 26 |
| 7. ණයෙන් නිදහස් වීම | - | - | - | - | - | - | 11 | - | - | - | - | - | 11 | 0 | 0 | 0 |
| 8. අනෙකුත් ණය | 415 | 620 | 1,153 | 1,831 | 2,748 | 78 | 20 | 57 | - | - | - | - | 4,336 | 2,586 | 22 | 15 |
| එකතුව (අනුමත කරන ලද) | 5,898 | 4,259 | 6,519 | 7,402 | 4,587 | 2,405 | 875 | 1,164 | 555 | 544 | 875 | 1,276 | 19,309 | 17,050 | 100 | 100 |
| ප්‍රදානය කරන ලද ණය (ආ) | 3,687 | 2,851 | 4,011 | 5,537 | 4,587 | 2,405 | 738 | 1,164 | 469 | 468 | 373 | 519 | 13,865 | 12,944 | | |
| ප්‍රදානය කරන ලද ණය අනුමත කරන ලද ණයෙන් ප්‍රතිශතයක් වශයෙන් | 63 | 67 | 62 | 75 | 100 | 100 | 84 | 100 | 85 | 86 | 43 | 41 | 72 | 76 | | |

(අ) පසුගිය වර්ෂයේ දී අනුමත කරන ලදුව සහ මෙම වර්ෂයේ දී දෙන ලද ණය ද ඇතුළත් වේ.

(ආ) ප්‍රතිමූල්‍ය ණය සහ ප්‍රාග්ධන ආයෝජනයන් ද ඇතුළත් වේ.

මූලයන් : ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව
ජාතික ඉතිරිකිරීමේ බැංකුව
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව
ජාතික සංවර්ධන බැංකුව
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

සංවර්ධන යන අංශයන්ය. ජා.ස.බැ. ව්‍යාපෘතීන් 12 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 643 ක්වූ ප්‍රාග්ධන මූල්‍යකරණ පහසුකම් සපයනු ලැබිය. පෙර වර්ෂයේ මෙන් ප්‍රධාන අරමුදල් මාර්ග වූයේ ණය ආපසු අයකර ගැනීම් (සියයට 55), ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් ලබාගත් ණය (සියයට 19) සහ විදේශ ණය ගැනීම් (සියයට 19)ය.

වර්ෂය තුල රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (රා. උ. ආ. බැ.) රුපියල් දශලක්ෂ 1,164 ක්වූ ණය 8348 ක් අනුමත කළේය. මෙම මුළු ණය ප්‍රමාණයෙන්, ණය වල වටිනාකම රුපියල් දශලක්ෂ 1,081 ක්වූ ණය 7,986 ක සංඛ්‍යාවක් නිවාස අංශය සඳහා විය. රා.උ.ආ.බැ. මූලික අංශයක් වූ නිවාස කටයුතු සඳහා අරමුදල් සැපයීම දිගටම පවත්වා ගනිමින් 1996 අනුමත කරනු ලැබූ මුළු ණය වලින් සියයට 93 ක් නිවාස කටයුතු සඳහා වූ අතර, ඉතිරි ණය ප්‍රමාණය කෘෂිකාර්මික හා කාර්මික අවශ්‍යතාවයන් වෙනුවෙන් යොමුවිය. බැංකුව මගින් සපයන ලද ණය වලින් විශාල ප්‍රමාණයක් රුපියල් දශලක්ෂ 5 ට අඩු වූ අතර, මුළු ණය වලින් සියයට 94 ක් දිගුකාලීන ණය විය. රා.උ.ආ.බැ. ප්‍රධාන වශයෙන් ඉඩම් සහ දේපල සහ සේ.අ.අ. ශේෂයන් ඇපයට තබාගෙන ණය සැපයීය. දෙන ලද මුළු ණාට ප්‍රමාණයෙන් සියයට 48 ක් සියයට 16-18 පොලී පරාසයක වූ අතර, මුළු ණය වලින් සියයට 45 ක් සියයට 20 කට වඩා වැඩි පොලී අනුපාතිකයක් යටතේ දී තිබුණි.

සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව 1995 රුපියල් දශලක්ෂ 555 ක් වූ ණය සමග සැසඳීමේදී රුපියල් දශලක්ෂ 544 ක් වටිනා ණය 4,105 ක සංඛ්‍යාවක් නිවාස කටයුතු සඳහා අනුමත කරනු ලැබිය. ණයවලින් විශාල ප්‍රමාණයක් (සියයට 94 ක්) සියයට 15-19 අතර පොලී පරාසයක් තුල ප්‍රදානය කරනු ලැබූ අතර ඒවා දේපල උකසක් යටතේ මුදා හැර තිබුණි. නි.ස.මූ.ස. ප්‍රධාන අරමුදල් ලැබෙන මාර්ගයන් වූයේ එක්සත් ජනපද රජයේ නිවාස ණය වැඩ සටහනේ iv වැනි අදියර මගින් අරමුදල් සැපයූ මහ බැංකුව විසින් පරිපාලනය කළ අඩු ආදායම් නිවාස වැඩ සටහන සහ ස්ථාවර තැන්පතුය. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (ජා.නි.සං.අ.) ද නිවාස කටයුතු සඳහා ණය පහසුකම් ව්‍යාප්ත කිරීම සිදුකරගෙන ගියේය.

ජා.නි.සං.අ. 1996 දී නිවාස කටයුතු සඳහා රුපියල් දශලක්ෂ 1,276 ක්වූ ණය අනුමත කරනු කළ අතර ඉන් රුපියල් දශලක්ෂ 519 ක් වර්ෂය තුල දෙන ලදී. මෙය 1995 වර්ෂයේ අනුමත කරනු ලැබූ රුපියල් දශලක්ෂ 875 සහ දෙනු ලැබූ රුපියල් දශලක්ෂ 373 හා සැසඳිය හැක. මෙම සියළුම ණය ප්‍රමාණයෙන් රුපියල් 25,000 ට අඩුවූ අතර, පුද්ගල ඇප යටතේ සියයට 14 හා සියයට 15 ක් පොලී ප්‍රමාණයක් යටතේ දෙනු ලැබූ ඒවා විය. ජා.නි.සං.අ. යේ ප්‍රධාන අරමුදල් මාර්ග වූයේ රජයේ ප්‍රධාන නිවාස විකිණීම හා ණය ආපසු ගෙවීමය.

## මූල්‍ය සමාගම්

රටෙහි ක්‍රියාත්මක වූ මුළු මූල්‍ය සමාගම් සංඛ්‍යාව 1996 වැඩි කාලයක් තුල 24 ක්ව පැවතුනි. 1996 අවසානය වනවිට මහ බැංකුවේ ලියාපදිංචි මුළු මූල්‍ය සමාගම් සංඛ්‍යාව 25 බවට පත්කරමින් 1996 ඔක්තෝබර් මාසයේදී තවත් එක සමාගමකට ලියාපදිංචිය සඳහා අවසර දෙන ලදී. මූල්‍ය සමාගම්වල මුළු වත්කම් හා වගකීම් 1995 දී රුපියල් දශලක්ෂ 15085 සිට 1996 දී රුපියල් දශලක්ෂ 17,984 දක්වා වැඩිවිය.

මුළු ණය 1996 අවසානයට රුපියල් දශලක්ෂ 12,086 දක්වා සියයට 25 කින් වැඩිවිය. රජයේ සුරැකුම්පත්හි ආයෝජන, උපසමාගම්, ආශ්‍රිත සමාගම් හා මව් සමාගම්වල කරනු ලැබූ ආයෝජන හා අනෙකුත් ආයෝජන ඇතුලත් ආයෝජන සියයට 10 කින් රුපියල් දශලක්ෂ 2,161 දක්වා වැඩිවීමක් පෙන්විය. ආයෝජන වැඩි ප්‍රමාණයක් භාණ්ඩාගාර බිල්පත් හා කොටස් වල කර තිබුණි.

වගකීම් අංශයෙහි, මූල්‍ය සමාගම් වෙතැති තැන්පතු 1996 දී රුපියල් දශලක්ෂ 1,975 කින් වැඩි වූ අතර, 1995 සංසන්දනාත්මක වර්ධනය රුපියල් දශ ලක්ෂ 1,439 ක් විය. මූල්‍ය සමාගම් වල ණය ගැනීම් 1995 දී රුපියල් දශ ලක්ෂ 1,812 ක් වූ අතර 1996 දී රුපියල් දශ ලක්ෂ 1454 ක් දක්වා අඩු විය. මේ අතර, මූල්‍ය සමාගම් වල ප්‍රාග්ධනය හා සංචිත, වර්ෂය තුළ රුපියල දශ ලක්ෂ 279 කින් වැඩි විය.

**සංඛ්‍යා සටහන 10.12**

**මූල්‍ය සමාගම් වල වත්කම් සහ වගකීම්**

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1995 දෙසැම්බර් 31 දිනට | 1996 මාර්තු 31 දිනට | 1996 ජූනි 30 දිනට | 1996 සැප්තැම්බර් 30 දිනට | 1996 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| වගකීම් | | | | | |
| 1. ප්‍රාග්ධන ගිණුම් | 2,326 | 2,220 | 2,432 | 2,533 | 2,605 |
| 2. තැන්පතු | 8,227 | 8,793 | 9,536 | 9,876 | 10,202 |
| 3. ණය ගැනීම් | 1,812 | 1,243 | 1,124 | 1,269 | 1,454 |
| 4. අනෙකුත් වගකීම් | 2,720 | 3,372 | 2,962 | 3,137 | 3,723 |
| එකතුව | 15,085 | 15,628 | 16,054 | 16,815 | 17,984 |
| වත්කම් | | | | | |
| 1. කුලී පිට ගැනුම් කටයුතු | 9,664 | 10,474 | 10,763 | 11,461 | 12,086 |
| 2. නොපියවන ලද ණය | 988 | 1,045 | 1,019 | 994 | 1,036 |
| 3. ආයෝජන | 976 | 951 | 1,080 | 1,031 | 1,125 |
| 4. අනෙකුත් වත්කම් | 3,457 | 3,158 | 3,192 | 3,329 | 3,737 |
| එකතුව | 15,085 | 15,628 | 16,054 | 16,815 | 17,984 |
| මහ බැංකුවට වාර්තා කරන ලද මූල්‍ය සමාගම් | 24 | 24 | 24 | 24 | 24 |

සටහන : මූල්‍ය ව්‍යාපාරික කටයුතුවල නිරත විය හැක්කේ මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය සමාගම්වලට පමණි. පවත්නා අනෙක් මූල්‍ය සමාගම්වලට ව්‍යාපාරය වසුරුවා හැරීමේ කටයුතු ආරම්භ කිරීමට නියෝග කර ඇත

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1996 දී එක් අවුරුදු ස්ථිර තැන්පතු සඳහා වූ පොලී අනුපාතික සියයට 15-21 අතර පරාසයක පැවතුණි. ඒ හා සැසඳීමේ දී, කුලී සින්නක්කර කටයුතු සඳහා වූ පොලී අනුපාතික සියයට 16-30 අතර පරාසයක පැවති අතර බොහෝ මුල්‍ය සමාගම් විසින් අයකළ අවම පොලී අනුපාතිකය සියයට 21 කට ඉහළින් විය. දුෂ්කරතාවයන්ට පත් මුල්‍ය සමාගම්වල තැන්පතු හිමියන් සඳහා සහන සැලසීමේ වැඩ පිළිවෙල මහ බැංකුව විසින් 1996 දී දිගටම ගෙන ගිය අතර, බිඳ වැටුන මුල්‍ය සමාගම් තුනක තැන්පතු හිමියන්ට වර්ෂය තුළ සහන සපයන ලදී.

## 10.10 විශේෂිත මුල්‍ය ආයතන

### වාණිජ බැංකු

1995 දී මෙන්ම 1996 දී ද වාණිජ බැංකු 7 ක්වූ අතර ඉන් 6 ක් ව්‍යාපාරික කටයුතු වල නිරත විය. වර්ෂය තුළ මුළු ආදායමේ සැලකිය යුතු වර්ධනයක් හා මුළු වත්කම්හි තරමක වර්ධනයක් සමග වාණිජ බැංකු කටයුතු වල විශාල වර්ධනයක් දක්නට විය.

1995 දී රුපියල් දශ ලක්ෂ 11,342 ක්ව පැවැති වාණිජ බැංකු මුළු වත්කම් සියයට 6.8 කින් රුපියල් දශ ලක්ෂ 12,114 දක්වා වැඩිවිය. 1996 අවසාන වනවිට වාණිජ බැංකුවල මුළු ආදායම් සියයට 64 කින් (රුපියල් දශලක්ෂ 2,331 දක්වා) වැඩිවිය. ආන්තික වෙළඳ කටයුතු වලින් ලද පොලී ආදායම්, කල්බදු ආදායම්, බිල්පත් වට්ටම් කිරීමෙන් ලැබූ පොලී ආදායම් සහ කොටස් ආයෝජනයන්ගෙන් ලැබූ ආදායම් බැංකුවල ප්‍රධාන ආදායම් මාර්ගයන්වූ අතර ඒවා මුළු ආදායමෙන් සියයට 77 ක් විය. මෙම සියළුම මාර්ගයන්ගෙන් ලද ආදායම් 1996 දී වැඩිවිය.

**සංඛ්‍යා සටහන 10.13**

**වාණිජ බැංකු කටයුතුවල ප්‍රගතිය**

රුපියල් දශලක්ෂ

| | | 1995 | 1996(අ) |
|---|---|---|---|
| 1. | කල්බදු මගින් උපයන ලද ආදායම | 460 | 560 |
| 2. | වාණිජ බිල්පත් වට්ටම් කිරීමෙන් ලද පොලී | 320 | 374 |
| 3. | මුල්‍ය සහ අනෙලවි උපදේශක සේවා | 37 | 38 |
| 4. | ප්‍රාරක්ෂණ කොමිස් මුදල් | 23 | 12 |
| 5. | රක්ෂණ කොමිස් මුදල් | 3 | 2 |
| 6. | ආන්තික වෙළෙඳාම මත පොලී | 192 | 668 |
| 7. | කොටස් ආයෝජන මත පොලී | 56 | 194 |
| 8. | භාණ්ඩාගාර බිල්පත් මත පොලී | 17 | 123 |
| 9. | අනෙකුත් ආදායම් | 272 | 360 |
| 10. | මුළු ආදායම | 1,378 | 2,331 |
| 11. | මුළු වත්කම් | 11,342 | 12,114 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

### කල්බදු සමාගම්

කල්බදු සමාගම් තුනෙහි මුළු වත්කම් 1995 අවසානයේ රුපියල් දශලක්ෂ 4,595 සිට 1996 අවසානයේදී රුපියල් දශලක්ෂ 5,842 දක්වා වැඩිවිය. සමාගම් විසින් සපයනු ලැබූ මුළු කල්බදු මූල්‍ය පහසුකම් ප්‍රමාණය සියයට 13.6 කින් පහල ගොස් 1996 අවසානයේදී රුපියල් දශලක්ෂ 1,921 ක් වූයේ මූලික වශයෙන් වාණිජ වාහන සඳහා සැලසූ පහසුකම් සියයට 20 කින් පහත වැටීමකිනි. වාණිජමය කටයුතු සඳහා යොදවාගනු ලබන වාහන සඳහා වූ මුළු කල්බදු පහසුකම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,043 ක්වූ අතර එය මුළු කල්බදු පහසුකම් වලින් සියයට 53 ක් විය. මෑත වර්ෂ වල කල්බදු සමාගම් කටයුතු වල දක්නට ලැබුණු වැදගත් ලක්ෂණය වූයේ කුලී සින්නක්කර කටයුතු කෙරේ දැක්වූ අවධානය අඩු වී කල්බදු මූල්‍යකරණය වෙත වැඩියෙන් යොමු වීමයි.

කල්බදු කර්මාන්තයේ දියුණුව රටේ දිගුකල් ප්‍රාග්ධන සම්පාදනයට උපකාරී වනු ඇත. විශේෂිත කල්බදු සමාගම් ධෛර්යමත් කිරීමෙන්, මෙම අරමුණ සපුරා ගත හැකි වෙතැයි අපේක්ෂිත විය. එහෙයින්, විශේෂිත කල්බදු, සමාගම් වල පැවැත්මට සහ දියුණුවට ආධාර කිරීම සඳහා කල්බදු වත්කම් සඳහා වූ ක්ෂය දීමනාව කල් බදු ආදායමෙන් හිලව් කිරීමට අවසර දීමේ යෝජනාවක් 1997 අයවැයෙන් හඳුන්වා දෙන ලදී.

### ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්

1996 දී රටෙහි ක්‍රියාත්මක වූ මුළු ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් සංඛ්‍යාව 6 ක් විය. 1995 අවසානයේ රුපියල් දශලක්ෂ 2,076 ක්වූ මුළු වත්කම්, 1996 අවසානයේදී රුපියල් දශලක්ෂ 2,296 දක්වා වැඩිවීමත් සමග ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්හි කටයුතු වර්ෂය තුල වර්ධනය විය. ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් විසින් ව්‍යාපෘතින්හි කරන ලද ප්‍රාග්ධන ආයෝජන 1996 දී රුපියල් දශ ලක්ෂ 290 කින් (සියයට 47) ඉහළ ගියේ ය. පසුගියවර්ෂයේ මෙන්ම, ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් විසින් සපයනු ලැබූ අරමුදල් වලින් විශාල ප්‍රමාණයක් (සියයට 65 ක්) නව ක්‍රියාකාරී කටයුතු පටන් ගැනීම සඳහා වූ අතර, මුළු මූල්‍යනය කිරීම් වලින් සියයට 32 ක් පවතින ව්‍යාපෘතීන් වැඩි දියුණු කිරීම සඳහා විය. නිෂ්පාදන අංශයේ කරනු ලැබූ කොටස් ප්‍රාග්ධන ආයෝජනයන් රුපියල් දශලක්ෂ 658 ක් වූ අතර, සේවා හා කෘෂිකාර්මික අංශයන්හි ව්‍යාපෘතීන් සඳහා පිළිවෙලින් රුපියල් දශලක්ෂ 239 ක් හා රුපියල් දශලක්ෂ 66 ක් යොදවන ලදී.

### රක්ෂණ සමාගම්

කලින් වර්ෂයේ මෙන්ම 1996 දී ද රටෙහි රක්ෂණ කටයුතු රක්ෂණ සමාගම් 6 ක් විසින් කරගෙන යන ලදී. ජීවිත රක්ෂණ කටයුතු මෙන්ම සාමාන්‍ය රක්ෂණ කටයුතු වල වර්ධනයක් වර්ෂය තුල පෙන්විය.

මෙම සමාගම් විසින් එකතු කරනු ලැබූ මුළු ජීවිත රක්ෂණ වාරික ආදායම්, 1995 වූ සියයට 38 ක වැඩිවීම හා සසඳා බලන විට 1996 දී සියයට 23 කින් (රුපියල් දශලක්ෂ 2,761 දක්වා- වැඩිවිය. රක්ෂණ සමාගම්වල ජීවිත රක්ෂණ අරමුදලෙහි මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 52,281 ක් විය. එය පෙර වර්ෂයට වඩා සියයට 9 ක වැඩිවීමකි. මුළු ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව සියයට 9 කින් (708,000) දක්වා වැඩිවිය.

සාමාන්‍ය රක්ෂණය, ගිනි, හදිසි අනතුරු, මුහුදු සහ වාහන රක්ෂණයන්ගෙන් සමන්විතය. සාමාන්‍ය රක්ෂණ කටයුතු වලින් ලද ශුද්ධ වාරික ආදායම 1995 වූ සියයට 32 වැඩිවීම හා සසඳා බලන විට 1996 දී සියයට 19 කින් වැඩි විය. සාමාන්‍ය රක්ෂණ අංශයේ විශාලතම අංශය වන මෝටර් රථ රක්ෂණයෙන් ලැබූ ශුද්ධ වාරික ආදායම 1995 දී රුපියල් දශලක්ෂ 1,452 සිට 1990 දී රුපියල් දශලක්ෂ 1,589 දක්වා වැඩිවිය. ගිනි රක්ෂණය, හදිසි අනතුරු රක්ෂණය සහ මුහුදු රක්ෂණයෙන් ලද ශුද්ධ වාරික

ආදායම්ද, පිළිවෙලින් සියයට 5, සියයට 33 සහ සියයට 47 කින් ඉහළ ගියේය.

## 10.11 මුදල් වෙළෙඳපොළ

### සමස්ත උපනතීන්

වර්ෂයෙහි මැද ආර්ථික ක්‍රියාකාරීත්වයෙහි අඩු වේගයක් තිබියදීත්, 1996 දී මුදල් වෙළෙඳපොළ ක්‍රියාකාරීව සහ ස්ථායීව පැවතිනි. වෙළෙඳපොළෙහි අධි ද්‍රවශීලතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස, පොලී අනුපාතික 1995 වසරට වඩා අඩු මට්ටමක පැවතුන අතර උච්චාවචන අඩුවිය. බලවත් කම්පනවලට පවා ඔරොත්තු දීමට හැකිවන මට්ටමකට ශ්‍රී ලංකාවේ මුදල් වෙළෙඳපොළ සහ ආයතනික සැකසුම් වර්ධනය වී තිබෙන බව පැහැදිලිව දක්වමින් ජනවාරි මාසයේ මහ බැංකුවට එල්ල කළ බෝම්බ ප්‍රහාරය හමුවේත් මුදල් වෙළෙඳපොළෙහි දිරිගන්වන සුලු ස්ථායීතාවයක් පිළිබිඹු විය. මහජනතාව විසින් බොහෝ ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි සඳහා අධිදායකවීම් වාර්තා කරන ලදී. මහ බැංකුව විසින් මුදල් වෙළෙඳපොළෙහි ක්‍රියාත්මක වෙමින් සිය මූල්‍ය ප්‍රතිපත්තියෙහි ප්‍රධාන උපකරණයක් ලෙස විවෘත වෙළෙඳපොළ කටයුතු යොදා ගන්නා ලදී. විශේෂයෙන් සාපේක්ෂව ඉහළ මට්ටමක පැවති උද්ධමන අනුපාතිකය වැනි දේශීය වෙළෙඳපොළ බලපෑම් සහ ජාත්‍යන්තර විනිමය අනුපාතිකයන්හි ගමන් මග යැලකිල්ලට ගැනීමෙන් මැදිහත්වීම සඳහා යොදා ගන්නා මූල්‍ය ඒකකය වන, ඇමරිකානු ඩොලර් සඳහා මහබැංකුවේ මධ්‍යම අනුපාතිකය සියයට 5 කින් වසර තුළ දී පමණ අගය අඩු කරන ලදී.

### අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළ

1996 දී ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ නොකඩවා ප්‍රසාරණය විය. කුඩා විදේශීය බැංකු සහ වාණිජ නොවන බැංකු සාමාන්‍යයෙන් ශුද්ධ ණය ගන්නන් වූ අතර, දේශීය වාණිජ බැංකු ප්‍රධාන ණය දෙන්නන් ලෙස දිගටම ක්‍රියා කළහ. වාර්ෂික පිරිවැටුම 1995 වසරේදී රුපියල් දශලක්ෂ 654,000 සිට 1996 වර්ෂයේ රුපියල් දශලක්ෂ 945,000 (සියයට 44.6 ක වැඩිවීමක්) දක්වා ඉහළ නැගුනි. විශේෂයෙන් පළමු කාර්තුවේදී පැවති අධි ද්‍රවශීලතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස ඒක්ෂණ වෙළෙඳපොළෙහි අනුපාතික ජූනි මස අවසානයේදී සියයට 14.00-17.50 මට්ටමක ඉහළ නැගීමකට පෙර 1995 අවසානයේදී සියයට 20.00-58.00 සිට මාර්තු මස අගදී සියයට 9.60-10.80 දක්වා තියුණු ලෙස පහත වැටුනි. එයින් අනතුරුව ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ අනුපාතික සුලු උච්චාවචනයන් සහිතව පටු පරාසයක් තුළ චලනය විය. සැප්තැම්බර් මසදී සියයට 13.30-25.00 පරාසයක පැවති මෙම පොලී අනුපාතික දෙසැම්බර් මස තුළ සියයට 13.00-31.00 සුලු වශයෙන් පුලුල් පරාසයකට වැඩිවී වර්ෂය අවසානයේ දී 17.50-28.00 අතර පැවතුනි.

### භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල

### ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල

වෙළෙඳපොළෙහි ද්‍රවශීලතාවය පිළිබිඹු කරමින් වසරෙහි මුල් කාලයේදී භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල විශාල වශයෙන් අධි දායකවීම් සහ මට්ටම් අනුපාතිකයේ තියුණු පහත වැටීම් පැහැදිලිව දක්නට ලැබුණි. 1996 වර්ෂයේ දී අවදායක වීම් දක්නට ලැබුණේ වෙන්දේසි කිහිපයක පමණකි. පසුගිය වසරෙහි වූ රුපියල් දශලක්ෂ 224,000 සමග සසඳන විට ප්‍රාථමික වෙළෙඳපොළේ ඉදිරිපත් කරනලද, භාණ්ඩාගාර බිල්පත්වල මුලු වටිනාකම 1996 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 227,000 ක් විය. භාණ්ඩාගාර බිල්පත් මගින් රජයේ ණය ගැනීම සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කළ

සංඛ්‍යා සටහන 10.14

**මුදල් වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය**


රුපියල් දශලක්ෂ


| කාලච්ඡේදය | ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ | | | ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ | | | | | ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මුළු ණයට දීම් ණයට ගැනීම් | කාලච්ඡේදය අවසානයට නොපියවූ ප්‍රමාණයන් (අ) | නොපියවා පැවැති මුළු බිල්පත් | නිකුත් කළ ප්‍රමාණය | පිළිගත් ප්‍රමාණය (මිලදී ගැනීම්) | | | | මුළු විකිණුම | මුළු මිලදී ගැනීම් | කාලච්ඡේදය අවසානයට නොපියවා පැවැති තත්වය |
| | | | | | මහ බැංකුව | වාණිජ බැංකු | අනෙකුත් | එකතුව | | | |
| 1994 | | | | | | | | | | | |
| 1 කාර්තුව | 126,036 | 1,125 | 97,996 | 29,302 | 3,601 | 13,550 | 12,151 | 29,302 | 6,948 | 2,506 | 1,560 |
| 2 කාර්තුව | 88,612 | 2,144 | 98,096 | 36,152 | 4,147 | 22,885 | 9,119 | 36,152 | 5,546 | 5,192 | 2,688 |
| 3 කාර්තුව | 114,341 | 1,811 | 95,396 | 45,660 | 4,475 | 29,702 | 11,483 | 45,660 | 5,485 | 2,070 | 2,939 |
| 4 කාර්තුව | 139,475 | 1,242 | 98,896 | 57,255 | 7,881 | 35,812 | 13,562 | 57,255 | 3,208 | 9,097 | 1,415 |
| 1995 | | | | | | | | | | | |
| 1 කාර්තුව | 121,858 | 3,308 | 98,546 | 57,166 | 1,028 | 36,946 | 19,192 | 57,166 | 5,867 | 2,977 | 3,683 |
| 2 කාර්තුව | 145,655 | 2,301 | 100,396 | 56,577 | 4,770 | 35,085 | 16,723 | 56,577 | 3,534 | 6,542 | 2,822 |
| 3 කාර්තුව | 166,686 | 2,942 | 107,671 | 55,445 | 5,882 | 33,507 | 16,057 | 55,445 | 2,696 | 12,358 | 1,914 |
| 4 කාර්තුව | 219,416 | 8,078 | 113,771 | 54,823 | 8,237 | 31,425 | 15,161 | 54,823 | 4,947 | 13,451 | 1,728 |
| 1996 | | | | | | | | | | | |
| 1 කාර්තුව | 217,697 | 2,390 | 120,021 | 52,025 | 3,560 | 27,170 | 21,295 | 52,025 | 9,384 | 795 | 4,401 |
| 2 කාර්තුව | 191,406 | 4,792 | 122,821 | 50,009 | 8,586 | 27,285 | 14,138 | 50,009 | 1,710 | 3,871 | 1,493 |
| 3 කාර්තුව | 233,790 | 3,977 | 124,521 | 58,819 | 9,502 | 33,021 | 16,296 | 58,819 | 1,975 | 5,854 | 681 |
| 4 කාර්තුව | 301,921 | 6,862 | 124,996 | 66,027 | 2,753 | 42,362 | 20,912 | 66,027 | 3,043 | 6,301 | 1,003 |


(අ) සෑම කාර්තුවක ම අවසාන සතියේ දී නොපියවා පැවැති ප්‍රමාණය

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 10.4
කොටස් වෙළඳපොල දර්ශක




සීමාවට ලගාවෙමින් භාණ්ඩාගාර බිල්පත් නොපියවා පැවති මට්ටම 1995 වර්ෂය අවසානයේදී වූ රුපියල් දශලක්ෂ 114000 සිට 1996 ඔක්තෝබර් මාසයේ දී රුපියල් දශලක්ෂ 125,000 දක්වා ඉහළ නැගුනි. මෙම සීමාව භාණ්ඩාගාර බිල්පත් තවදුරටත් නිකුත් කිරීම වැලැක්වූ අතර ළදා අනුපාතික ඉහළ යෑම වැලැක්වීමටද උපකාරවිය.

1995 වර්ෂයේදී මිලදී ගත් රුපියල් දශලක්ෂ 20,000 හා සැසඳීමේදී මහ බැංකුව විසින් 1996 දී ප්‍රාථමික වෙළෙඳපොලෙහි දී රුපියල් දශලක්ෂ 24,000 වටිනාකමැති භාණ්ඩාගාර බිල්පත් මිළදී ගන්නා ලදී. රුපියල් දශලක්ෂ 6,900 ක් ව නව නිකුතුන් සියල්ලම මහ බැංකුව විසින් මිලට ගන්නා ලදී. මෙම විශේෂ නිකුතුන්ගෙන් වැඩි ප්‍රමාණයක් මහ බැංකුව විසින් මිලදී ගනු ලැබුවේ ජනවාරි මස 31 දින වූ බෝම්බ ප්‍රහාරයෙන් අනතුරුව වෙළෙඳපොල ස්ථායි කිරීමේ වැයමක් ලෙසිනි.

වෙළෙඳපොල වෙත ද්‍රවශීලතාවය සැපයීමත් සමග 1996 ප්‍රථම මාස කිහිපය තුළදී අඩුවූ භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතික නොවැම්බර් මස මැද්දී ක්‍රමයෙන් සියයට 18.25-17.98 පරාසයකට ඉහළ නැගුනි. මෙම අනුපාතික 1995 නොවැම්බර් මස මැද අනුරූප අනුපාතිකවලට වඩා ආසන්න වශයෙන් ප්‍රතිශතාංක 1.5-2.5 පහළින් පැවතුනි. එතැන් සිට පහත වැටුනු පොලී අනුපාතික 1996 දෙසැම්බර් මස අගදී සියයට 17.45-17.38 පරාසයකට පත්විය.

## ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

කලින් වසරෙහි රුපියල් දශලක්ෂ 17,000 හා සැසඳීමේදී 1996 වර්ෂයේ මහ බැංකුව විසින් ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේදී රුපියල් දශලක්ෂ 16,000 ක භාණ්ඩාගාර බිල්පත් මිලට ගන්නා ලදී. (වට්ටම් කිරීම) මේ අතර වෙළෙඳපොළ ඉහළගිය ද්‍රවශීලතාවය පෙන්නුම් කරමින්, භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (ප්‍රතිවට්ටම්) 1995 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 35,000 සිට රුපියල් දශලක්ෂ 16,000 දක්වා පහත වැටුණි.

ප්‍රාථමික වෙළෙඳ පොළ අනුපාතිකවල දක්නට ලැබුණු ප්‍රවනතාවය අනුගමනය කරමින් 1996 වසර තුළදී මහ බැංකුවේ ද්විතීයික වෙළෙඳපොලෙහි වට්ටම් හා ප්‍රතිවට්ටම් අනුපාතිකයන්හි වෙනස්කම් ඇතිවිය. 1995 වර්ෂය අවසානයේදී ප්‍රතිශතාංක 1.46 ක්වූ මෙම අනුපාතික අතර පරතරය, පෙබරවාරි 16 වන දින ප්‍රතිශතාංක 2.00 දක්වා වැඩි විය. මාර්තු මස මෙම පරතරය සියයට 3 දක්වා වැඩිවිය. පොලී අනුපාතික වෙනස්වීම් හා අනුකූලවීම සඳහා, ගැලපුම් කිහිපයකට පසුව අනුපාතික අතර පරතරය දෙසැම්බර් 26 දින සියයට 1.75 දක්වා අඩු විය. 1995 වර්ෂය අගදී පිළිවෙලින් සියයට 19.01 සහ සියයට 20.47 ක්වූ ත්‍රෛමාසික බිල්පත් සඳහා වට්ටම් සහ ප්‍රති වට්ටම් අනුපාතික 1996 වර්ෂය අවසානයේදී සියයට 17.20 සහ සියයට 18.95 දක්වා පහත වැටුනි.

## භාණ්ඩාගාර බිල්පත් ප්‍රති මිලදී ගැනීමේ වෙළඳ පොල (Repurchase Market for Treasury Bills ).

ඒක්ෂණ මුදල් වෙළඳපොලෙහි පහළ අන්තයේ ස්ථායිතාවය ඇති කිරීමේ අරමුණින්, භාණ්ඩාගාර බිල්පත් ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ භාණ්ඩාගාර බිල්පත් විකිණීම් මහ බැංකුව විසින් 1993 ඔක්තෝබර් මස දී ආරම්භ කරන ලද. ප්‍රාථමික සහ ද්විතීයික වෙළෙඳපොළ අනුපාතික

ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි අනුපාතික, ද්‍රවශීලතාවය, ආර්ථිකයේ සාමාන්‍ය ප්‍රවණතා සහ ප්‍රතිපත්තිමය කරුණු වැනි සාධක සැලකිල්ලට ගැනීමෙන් මහ බැංකුව විසින් ප්‍රති මිලදී ගැනුම් අනුපාතිකය දෛනික ව නිර්ණය කෙරුණි.

එක්දින ප්‍රති විකුණුම් අනුපාතිකය, වෙළෙඳපොළ ප්‍රවණතාවය අනුව යමින් ජූනි මස දී සියයට 12.75 ට වැඩි කිරීමට පෙර, 1995 දෙසැම්බර් මස අවසානයේදී සියයට 16.50 සිට මාර්තු මස අග දී සියයට 9.50 දක්වා ක්‍රමයෙන් අඩු විය. සැප්තැම්බර් මස මැද දක්වා සියයට 12.75 ක නොවෙනස් ව පැවතුණු ප්‍රති මිලදී ගැනුම් අනුපාතිකය සියයට 13.00 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. නොවැම්බර් මස අවසානය වන විට, එය තව දුරටත් සියයට 13.25 දක්වා ඉහළ ගිය නමුත්, භාණ්ඩාගාර බිල්පත් අනුපාතික අඩු වීමත් සමග, 1996 දෙසැම්බර් මස අවසානය වන විට සියයට 12.75 දක්වා අඩු විය.

ආයෝජකයන්ගේ වඩා වේගවත් සහභාගීත්වය පෙන්නුම් කරමින්, ප්‍රති මිලදී ගැනීමේ වෙළෙඳපොළෙහි විකුණුම්, 1995 වසරේ දී වූ රුපියල් දශ ලක්ෂ 198,000 හා සැසඳීමේ දී 1996 වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 404,000 ක් විය.

## භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රති විකුණුම් වෙළෙඳපොළ
(Reverse Repurchase Market for Treasury Bills)

ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි පොලී අනුපාතික පරාසයේ ඉහළ අන්තයෙහි ස්ථායිතාවයක් ඇති කිරීමේ අදහස සහිත ව මහ බැංකුව විසින් 1995 නොවැම්බර් මස දී ප්‍රතිවිකුණුම් වෙළෙඳපොළ හඳුන්වා දෙන ලදී. වෙළෙඳපොළෙහි පැවති අඛණ්ඩ ද්‍රවශීලතාවය හේතුවෙන්, ප්‍රතිවිකුණුම් ක්‍රමය මගින් අරමුදල් සැපයීමට මහ බැංකුවට අවශ්‍යතාවයක් පැන නොනැගුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 1996 වර්ෂයේ දී මෙම ක්‍රමය ක්‍රියාත්මක නො විය.

## අභ්‍යන්තර විදේශ විනිමය වෙළෙඳපොළ

මැදිහත් වීම සඳහා භාවිතා කරන මුදල් ඒකකය වන ඇමරිකානු ඩොලරය සඳහා දෛනික එතැන් මිලදී ගැනීම් සහ විකිණීම් අනුපාතික ප්‍රකාශයට පත් කරමින්, 1996 වර්ෂයේ දී මහ බැංකුව අභ්‍යන්තර විදේශ විනිමය වෙළෙඳපොළෙහි කටයුතු පහසු කරලීමේලා නොකඩවා ක්‍රියාත්මක විය. 1995 වර්ෂයේ දී සියයට 1 සිට 2 දක්වා වැඩි කරන ලද එතැන් මිලදී ගැනීම් සහ විකිණීම් අනුපාතික අතර පරතරය එම මට්ටමෙහි පවත්වාගෙන යනු ලැබිණි. ඇමරිකානු ඩොලරයට සාපේක්ෂ ව රුපියල සියයට 4 .7 ක අගය අඩුවීමක් පිළිබිඹු කරමින් මහ බැංකුවේ මධ්‍යම අනුපාතිකය 1995 වර්ෂය අවසානයේ දී ඇමරිකානු ඩොලරයට රුපියල් 54.0475 ක් වූ අනුපාතිකයට සාපේක්ෂ ව 1996 වර්ෂය අවසානයේ දී ඇමරිකානු ඩොලරයට රුපියල් 56.7050 ක් ව පැවතුණි. මහ බැංකුවේ මිලදී ගැනීම් 1995 වර්ෂයේ දී ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 202 සිට 1996 වසර අවසානයේ දී ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 96 දක්වා පහත වැටී සියයට 52 . 4 ක තියුණු අඩුවීමක් පෙන්නුම්කරලීය. මිලදී ගැනුම් සියල්ල ම 1996 ප්‍රථම මාස 8 තුළ 1996 දෙසැම්බර් 31 බැංකුවට ප්‍රහාරය එල්ල වූ පසු ඒ ආසන්න කාලයේ සිදු විය. මේ අතර මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට කළ ඇමරිකානු ඩොලර් විකුණුම් 1995 වසරෙහි ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 9 හා සසඳන විට 1996 වර්ෂයේ දී ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 198 ක් විය.

වාණිජ්‍ය බැංකු මගින් මහ බැංකුවෙන් කළ ශුද්ධ මිලදී ගැනුම් 1996 වර්ෂයේ දී ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 102 ක් වූයේ වාණිජ බැංකුවල විදේශ විනිනමය අවශ්‍යතාවන්හි වැඩි වීම පිළිබිඹු කරමිනි.

## අක් වෙරළ වෙළෙඳපොළ

1995 වර්ෂයේ දී වූ ප්‍රසාරණය හා සසඳන විට වාණිජ බැංකුවල විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි අක් වෙරළ බැංකු කටයුතු 1996 දී පහත වැටුණි. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි මුළු වත්කම්/වගකීම් සියයට 3 කින් (ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 46) කින් අඩු වී, 1996 වසර අවසානයේ දී ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 1,430 ක් විය. අනේවාසික කාණ්ඩයේ කටයුතුවල පහත වැටීම මෙම සංකෝචනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

වත්කම් අංශයෙහි, නේවාසික නොවන ගනුදෙනු කරුවන්ට සපයන ලද අත්තිකාරම් සියයට 12 කින් (ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 69) අඩු වී වසර අවසානයේ දී ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 504 ක් වූ අතර 1995 වසරේ දී දෙසැම්බර් අවසානයේ දී ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 835 සිට 1996 වර්ෂයේ දෙසැම්බර් අග දී ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 856 දක්වා සියයට 3 කින් ඉහළ නැගුණි. මෙය මූලික වශයෙන් ආයෝජන මණ්ඩලයේ පාලනයට යටත් වන අපනයන ව්‍යවසායකයන්ට දෙනු ලැබූ අත්තිකාරම්වල පිළිබිඹු වුණි.

වගකීම් අංශයෙහි නේවාසික නොවන කාණ්ඩයේ තැන්පතු වගකීම් ද සියයට 10 කින් (ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 67) පහත වැටුණු අතර නේවාසික කාණ්ඩයෙහි තැන්පතු වගකීම් සියයට 3 කින් (ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 18) වැඩි විය. දේශීය බැංකු වෙතින් ඔවුන්ගේ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ආයෝජන මගින් ලබාගනු ලබන අරමුදල් අඩු විය.

**සංඛ්‍යා සටහන 10.15**

**කොටස් වෙළෙඳපොළ දර්ශකයන්**

| | 1993 | 1994 | 1995 | 1996 |
|---|---|---|---|---|
| 1. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. දශලක්ෂ) | 123,790 | 143,210 | 106,869 | 104,197 |
| 2. නව නිකුතුන් සංඛ්‍යාව | 12 | 21 | 17 | 8 |
| 3. නිකුත් කළ මුළු කොටස් සංඛ්‍යාව | 42 | 190 | 100 | 64 |
| 4. නිකුත් කළ කොටස්වල වටිනාකම (රු. දශලක්ෂ) | 1,051 | 4,589 | 2,120 | 2,178 |
| 5. අලෙවි කළ කොටස් සංඛ්‍යාව (දශලක්ෂ) | 351 | 506 | 315 | 227 |
| 6. අලෙවි කළ කොටස්වල වටිනාකම (රු. දශලක්ෂ) | 18,579 | 34,522 | 11,249 | 7,403 |
| 7. මිල දර්ශක | | | | |
| - සියළු කොටස් මිල දර්ශකය (දෙසැ. 31 දිනට) | 605.3 | 986.7 | 663.7 | 603.0 |
| - සංවේදී කොටස් මිල දර්ශකය (දෙසැ. 31 දිනට) | 826.5 | 1,438.8 | 990.5 | 897.7 |

මූලය: කොළඹ කොටස් හුවමාරුව

**සංඛ්‍යා සටහන 10.16**

**1992 - 1996 වර්ෂ තුළ ආයෝජන වර්ගය අනුව නිකුත් කරන ලද නව කොටස් ගණන**

| ආයෝජන වර්ගීකරණය | 1992 | 1993 | 1994 | 1995 | 1996 |
|---|---|---|---|---|---|
| බැංකු, මූල්‍ය හා රක්ෂණ | 1 | 3 | 6 | 2 | - |
| බීම වර්ග, ආහාර හා දුම්කොළ | 2 | - | 3 | - | 1 |
| රසායන ද්‍රව්‍ය හා ඖෂධ | - | - | - | - | 1 |
| ඉදිකිරීම් හා ඉංජිනේරු | - | - | - | - | - |
| පාවහන් හා රෙදිපිළි | 1 | - | 1 | - | - |
| හෝටල් හා සංචාරක | 4 | 4 | - | 1 | 1 |
| ආයෝජන භාර | - | - | - | - | - |
| ඉඩම් හා දේපල | - | - | 1 | - | - |
| නිෂ්පාදන | - | 2 | 4 | 5 | - |
| මෝටර් රථ | 3 | 1 | 6 | - | - |
| ඔයිල් පාම | - | - | - | - | - |
| වැවිලි | - | - | - | 9 | 5 |
| සේවා | 1 | - | - | - | - |
| ගබඩා හා සැපයුම් | - | - | - | - | - |
| වෙළෙඳ | 3 | 2 | - | - | - |
| එකතුව | 15 | 12 | 21 | 17 | 8 |
| ඉදිරිපත් කළ කොටස් ගණන (දශලක්ෂ) | 78 | 42 | 190 | 100 | 64 |
| ඉදිරිපත් කළ කොටස්වල වටිනාකම (රු. දශලක්ෂ) | 1,267 | 1,050 | 4,589 | 2,120 | 2,178 |

මූලය : කොළඹ කොටස් හුවමාරුව

කෙසේ වෙතත්, ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන් විශේෂයෙන් විදේශීය හිමිකම් ඇති ව්‍යවසායයන් සහ අනෙකුත් අනුමත කාණ්ඩයන් විසින් පවත්වාගෙන යන ශේෂයන්හි විශාල වැඩි වීම් හේතුවෙන් අනේවාසික කාණ්ඩයෙහි තැන්පතු වගකීම්වල සමස්ත වැඩි වීමක් දක්නට ලැබුණි.

## 10.12 ප්‍රාග්ධන වෙළෙඳපොළ

ආයෝජක උද්යෝගය වැඩිවීම නිසා කොළඹ කොටස් වෙළෙඳ පොළෙහි ක්‍රියාකාරිත්වයේ යම් දියුණුවක් 1996 වසරේ දෙවන භාගයේ දක්නට ලැබුණ ද 1996 වර්ෂය තුළ දී එහි කටයුතු පහත් මට්ටමක පැවතුණි. මෙම පසුබෑමට හේතු වශයෙන් අඩු විජාතික සහභාගිත්වය, කම්කරු නොසන්සුන්තාව, ත්‍රස්තවාදී ක්‍රියා වැඩිවීම, කොළඹ නගරය තුළ බෝම්බ පිපිරීම සහ විදුලිබල අර්බුදය දැක්විය හැකි ය. වසර තුළ විජාතික සහභාගිත්වය අඩුවුව ද කොටස් විකුණුම් අඩු වූ බැවින් ඔවුන් ශුද්ධ ගැනුම්කරුවන් බවට පත්විය. වසර තුළ දී වෙළෙඳපොළ වැවිලි නොවන සමාගම්වල මූලික (ප්‍රාථමික) නිකුතුන් 4 න් 3 ක් ම පූර්ණ වශයෙන් මහජන දායකත්වයට පත් විය. ඊට අමතර ව පෞද්ගලීකරණය කරන ලද වතු සමාගම් හතරක සියයට 51 කොටස් 'සියල්ල විකිණීමේ හෝ එසේ නැතිනම් කිසිවක් නොවිකිණීමේ' පදනම යටතේ ඉහළම ලංසුකරුට විකුණන ලදී. මෙය පසුගිය වර්ෂවල දී පෞද්ගලීකරණය කරන ලද සමාගම් කොටස් වෙළෙඳපොළට නිකුත් කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රමයට වඩා වෙනස් විය.

### ප්‍රාථමික කොටස් වෙළෙඳපොළ

1996 වර්ෂයෙදී මූලික (ප්‍රාථමික) නිකුතුන් අටක් ව තිබූ අතර, සංසන්දනාත්මක ව බලන කල 1995 වර්ෂයේ දායකත්වය සඳහා නිකුතුන් දාහතක් විවෘත කර තිබුණි. මේ අතරින් වැවිලි නොවන සමාගම් හතරක් තිබූ අතර ඒවා නම් සීමාසහිත ලංකා ලුබ්රිකන්ට්, සීමාසහිත ඇසෝසියේටඩ් හොටෙල්ස් සමාගම, සීමාසහිත කුඩා තේ වතු සහ සීමාසහිත ලයන් බෲවරි ලංකා සමාගමය. වතු සමාගම් හතරක් තිබූ අතර ඒවා සීමාසහිත ආගරපතන වැවිලි සමාගම, සීමාසහිත හපුගස්තැන්න වැවිලි සමාගම, සීමාසහිත බලංගොඩ වැවිලි සමාගම සහ සීමාසහිත උඩපුස්සැල්ලාව වැවිලි සමාගම වශයෙන් නම් කළ හැකි ය. මෙම වතු සමාගම්වල කොටස් වෙළෙඳපොළට නිකුත් කරන ලද්දේ රජයේ පෞද්ගලීකරණ වැඩපිළිවෙළ යටතේ ය. කලින් පැවැති ක්‍රමය යටතේ කොටස් අවතක්සේරු වීමක් ඇති වූ අතර ඉන් රජයට ලැබුණු ආදායම අඩු වූ හෙයින්, වතු සමාගම්වල සියයට 51 ක් වූ කොටස් අංශ විකිණීමේ දී පසුගිය වසරවලට වඩා වෙනස් පිළිවෙතක් අනුගමනය කරන ලදී. නව ක්‍රමය යටතේ කොටස් 'සියල්ල විකිණීමේ හෝ එසේ නැතිනම් කිසිවක් නොවිකිණීමේ' පදනම අනුගමනය කළ නමුදු ඒවා වෙන්දේසි කළ බැවින් කොටස් අඩිමිලක් සහිත ව විකිණීමට හැකි විය. ප්‍රාථමික (මූලික) නිකුතුන් හතරෙන් එකක්,

**සංඛ්‍යා සටහන 10.17**

**1996 වර්ෂය තුළ සමාගම්වල නව කොටස් නිකුතුන්**

| සමාගම | ඉදිරිපත් කළ කොටස් ගණන | නාමික අගය | අඩිමිල (රුපියල්) | කොටස්වල වටිනාකම (රු.ද.ල.) | මහජනයා විසින් ඉල්ලුම් කරන ලද කොටස් ගණන | ප්‍රාරක්ෂකයින් විසින් මිල දී ගත් කොටස් ගණන |
|---|---|---|---|---|---|---|
| 1. සී/ස. කුඩා තේ වතු හිමියන්ගේ කර්මාන්ත ශාලා සමාගම | 5,850,000 | 10 | 2 | 70 | 5,850,000 | - |
| 2. සී/ස. ලංකා ලුබ්රිකන්ට් සමාගම | 11,700,000 | 10 | 40 | 585 | 2,048,200 | 9,651,800 |
| 3. සී/ස. ආගරපතන වැවිලි සමාගම | 7,599,000 | 10 | 25.25 | 268 | 7,599,000 | - |
| 4. සී/ස. ඇසෝසියේටඩ් හෝටල් සමාගම | 1,040,760 | 10 | 15 | 26 | 1,040,760 | - |
| 5. සී/ස. හපුගස්තැන්න වැවිලි සමාගම | 10,200,000 | 10 | 13.75 | 242 | 10,200,000 | - |
| 6. සී/ස. බලංගොඩ වැවිලි සමාගම | 10,200,000 | 10 | 31.25 | 421 | 10,200,000 | - |
| 7. සී/ස. උඩපුස්සැල්ලාව වැවිලි සමාගම | 4,845,000 | 10 | 55.25 | 316 | 4,845,000 | - |
| 8. සී/ස. ලයන් බෲවරි ලංකා සමාගම | 12,500,000 | 10 | 10 | 250 | 12,500,000 | - |

මූලය : කොළඹ කොටස් වෙළෙඳපොළ

සංඛ්‍යා සටහන 10.18

**1996 වර්ෂය තුළ දී ද්විතීයික කොටස් වෙළෙඳපොළෙහි අලෙවි වූ කොටස් ආයෝජන වර්ගීකරණය අනුව බෙදීයාම**

| ආයෝජන වර්ගීකරණය | කොටස් ගනුදෙනු ප්‍රමාණය | කොටස් ප්‍රමාණය (දහස්) | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|---|---|
| බැංකු, මූල්‍ය හා රක්ෂණ | 31,954 | 52,717 | 3,269 |
| බීම වර්ග, ආහාර හා දුම්කොළ | 13,176 | 38,045 | 529 |
| ඉදිකිරීම් හා ඉංජිනේරු | 1,933 | 9,651 | 111 |
| රසායන ද්‍රව්‍ය හා ඖෂධ | 1,353 | 735 | 44 |
| විවිධ | 7,050 | 3,566 | 1,720 |
| පාවහන් හා රෙදිපිළි | 2,616 | 1,952 | 17 |
| හෝටල් හා සංචාරක | 4,497 | 11,864 | 158 |
| ආයෝජන භාර | 598 | 398 | 8 |
| ඉඩම් හා දේපල | 3,830 | 10,653 | 79 |
| නිෂ්පාදන | 26,209 | 51,742 | 1,047 |
| මෝටර් රථ | 2,033 | 4,141 | 146 |
| ඔයිල් පාම් | 13 | 26 | 8 |
| වැවිලි | 1,008 | 5,749 | 137 |
| සේවා | 590 | 497 | 14 |
| ගබඩා හා සැපයුම් | 105 | 226 | 21 |
| වෙළෙඳ | 1,226 | 2,493 | 78 |

මූලය : කොළඹ කොටස් හුවමාරුව

(සීමාසහිත ලංකා ලුබ්රිකන්ට්ස්) පමණක් අවදායකත්වයට පත් විය. සමාගම් 8 හි ප්‍රාථමික කොටස් අලෙවියේ මුළු වෙළෙඳපොළ වටිනාකම (කොටස් අධිමිල ඇතුළත් ව) රුපියල් දශ ලක්ෂ 2,178 ක් විය. මේ හා සැසඳෙන 1995 වර්ෂයේ නව නිකුතුන්වල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 2,121 ක් වූ අතර එයට 'සියල්ල විකිණීමේ හෝ එසේ නැතිනම් කිසිවක් නොවිකිණීමේ පදනම' මත වෙන්දේසි කළ වතු සමාගම්වල කොටස් වටිනාකම ද අයත් විය.

## ද්විතීයික කොටස් වෙළෙඳපොළ

1994 වර්ෂයේ දී ආරම්භ වූ නැමියාව අනුව යමින්, සමස්ත කොටස් මිල දර්ශකය සහ සංවේදී මිල දර්ශකය තවදුරටත් 1996 ජූලි මාසය වන විට අඩු වුවද, 1996 ජනවාරි සිට මාර්තු දක්වා සුළු වැඩිවීමක් දක්නට ලැබුණි. මිල දර්ශකවල වැඩිවීමක් නැවතත් අගෝස්තු සහ නොවැම්බර් මාසවල දී දක්නට ලැබුණි. සමස්ත කොටස් මිල දර්ශකය සහ සංවේදී මිල දර්ශකය වර්ෂය මුල දී පිළිවෙළින් 663.7 සහ 990.5 වූ අතර එය වර්ෂය අවසානයේ දී 603.0 සහ 897.7 දක්වා පහත වැටුණි. මෙලෙස 1996 වර්ෂය තුළ දී සමස්ත මිල දර්ශකය සියයට 9.2 කින් (දර්ශකාංක 860.7 අඩුවීමකි) සහ සංවේදී මිල දර්ශකය සියයට 9.4 කින් (දර්ශකාංක 92.8 ක අඩුවීමකි). පහත වැටුණි.

කොළඹ කොටස් හුවමාරුවෙහි වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 1996 වසර ආරම්භයේ දී රුපියල් දශ ලක්ෂ 106,900 ක් වූ අතර, එය මාර්තු 15 වැනි දිනට රුපියල් දශ ලක්ෂ 118,400 ක් වූ උපරිමයක් දක්වා වැඩිවී නැවතත් ජූලි මසය වන විට රුපියල් දශ ලක්ෂ 92,700 දක්වා අඩු විය. එම අගය දෙසැම්බර මස අග රුපියල් දශ ලක්ෂ 104,200 ක් වූ අතර, මින් වසර තුළ රුපියල් දශ ලක්ෂ 2,700 ක (සියයට 2.5 ක) පසුබැස්මක් පිළිබිඹු විය. ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය වැඩි වශයෙන්, විශේෂිත වූ සුළු ආයතන සංඛ්‍යාවක් මත රඳා පවතින අතර, මේවායින් ප්‍රධාන තැනක් ගන්නේ මූල්‍ය ආයතනයන් ය. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය අතින් ගත් කළ විශාල ම සමාගම් වශයෙන් සංවර්ධන බැංකු (ජාතික සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව), ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, හේලීස්, ලංකා දුම්කොළ සමාගම, කොමර්ෂල් බැංකුව, ආසියා හෝටල් සංස්ථාව, සම්පත් බැංකුව සහ ඩිස්ටිලරීස් ලංකා සමාගම නම් කළ හැකි ය. 1996 වසර අවසානයේ දී මෙම සමාගම් දහය මුළු වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයෙන් සියයට 38 ක ප්‍රමාණයක් දැරී ය. තව ද මෙම සමාගම් 10 න් පහක් බැංකු ආයතන වූ අතර, වසර අවසානයේ දී මුළු වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයේ සියයට 21 ක් මේ සමාගම් හා සම්බන්ධිත විය.

ගනුදෙනු කටයුතුවල පහත වැටීමේ උපනතිය 1996 වසරේ ද පැවතිණ. සමාගම් පනත යටතේ පොදු සමාගම් 2,000 ක් පමණ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති නමුත්, 1996 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී මෙයින් සමාගම් 235 ක් පමණක් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කර තිබුණි. මෙයට අමතර ව කොටස් හුවමාරුවේ සංඛ්‍යා ලේඛන අනුව මෙම ලැයිස්තුගත සමාගම් අතරින් ද නිතර ගනුදෙනු කරනු ලබන්නේ සමාගම් 25 - 35 ක කොටස් පමණි.

කොටස් වෙළෙඳපොළේ මුළු පිරිවැටුම, 1995 වසරේ රුපියල් දශ ලක්ෂ 11,300 සිට 1996 වසරේ රුපියල් දශ ලක්ෂ 7,400 දක්වා (සියයට 34 කින්) පහත වැටුණි. තව ද, දෛනික පිරිවැටුම 1995 වසරේ රුපියල් දශ ලක්ෂ 46.9 සිට 1996 වසරේ රුපියල් දශ ලක්ෂ 30.6 දක්වා අඩු වූ අතර, ගනුදෙනු සංඛ්‍යාව 186,276 සිට 1996 වසරේ 98,121 දක්වා (සියයට 47 කින්) සැලකිය යුතු තරම් අඩු විය.

ජනවාරි මාසය තුළ රුපියල් දශ ලක්ෂ 878 ක් වූ මාසික පිරිවැටුම, ජූලි මාසය වන විට රුපියල් දශ ලක්ෂ 247 දක්වා අඩුවී නැවත දෙසැම්බර් මාසයේ දී රුපියල් දශ ලක්ෂ 782 දක්වා වැඩි විය. වසර තුළ දී ඉහළ ම මාසික පිරිවැටුම වූ රුපියල් දශ ලක්ෂ 941 මාර්තු මාසය තුළ වාර්තා විය. බැංකු, මූල්‍ය හා රක්ෂණ අංශයේ පිරිවැටුම මුළු පිරිවැටුමෙන් සියයට 47 ක් විය.එයින් සියයට 79 ක් ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, කොමර්ෂල් බැංකුව හා හැටන් නැෂනල් බැංකුව දැරූ අතර, සංර්ධන මූල්‍ය ආයතන දෙක පමණක් සියයට 48 කට සම්බන්ධ විය.

ත්‍රස්තවාදී ක්‍රියා නිසා ආර්ථිකයේ ඇතිවූ අවිනිශ්චිත භාවය, දැනට පවතින යුද්ධය, කම්කරු ප්‍රශ්න හා විදුලිබල අර්බුදය යනාදිය කොළඹ කොටස් වෙළෙඳපොළෙහි විජාතිකයනිගේ අඩු සහභාගිත්වයට හේතු වශයෙන් දක්වා ඇත. විජාතික සහභාගිත්වය පහත මට්ටමක පැවතුන ද ඔවුන් රුපියල් දශ ලක්ෂ 352 ක වටිනාකමකින් ශුද්ධ ගැනුම්කරුවන් බවට පත්වූ අතර, 1995 වසරේ දී ඔවුන් රුපියල් දශ ලක්ෂ 89.7 ක වටිනාකමකින් ශුද්ධ විකිණුම්කරුවන් වූහ.

1995 වසර හා සංසන්දනාත්මක ව බලන කල 1996 වසර තුළ විජාතික විකුණුම් හා ගැණුම් සැලකිය යුතු ප්‍රමාණයකින් පහත වැටුණි. විජාතිකයින්ගේ විකුණුම් ප්‍රමාණය පහත වැටීමට හේතුව වූයේ වෙළෙඳපොළෙහි පවතින අඩු මිලට විකිණීමට ඇති අකැමැත්ත් විය හැකි

ය. සලකා බලන වසර තුළ දී විජාතිකයින්ගේ සහභාගීත්වය මුළු පිරිවැටුමෙන් සියයට 54.7 ක් වූ අතර, පසුගිය වසරේ මේ හා සැසඳෙන ප්‍රතිශතය සියයට 59.5 ක් විය.

## අංශවල ක්‍රියාකාරිත්වය

ආංශික මිල දර්ශකයන්හි අඩු වැඩිවීම මගින් අංශවල ක්‍රියාකාරිත්ව විශ්ලේෂණය කිරීමේ දී මුළු අංශ 16 න් අංශ 7 ක්ම 1996 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී තම මිල මට්ටම් පවත්වාගෙන යෑමට හැකි විය. මෙම අංශ 7 වූයේ බීම වර්ග, අහාර හා දුම්කොළ, රසායනික ද්‍රව්‍ය හා බෙහෙත් වර්ග, ඉදිකිරීම් සහ ඉංජිනේරු, විවිධ, තෙල් සපයන තාල වර්ගයේ වැවිලි හා සේවා යන අංශයන් ය. දර්ශකාංක 125.3 ක වැඩිවීමක් දක්වමින් වැවිලි අංශය සාර්ථක ක්‍රියාකාරිත්වයක් පෙන්වා ඇති අතර, දර්ශකාංක 28.1 කින් පහත වැටෙමින් පාවහන් හා රෙදිපිළි අංශය වඩාත් ම පසුබෑස්මකට ලක් විය. අනෙක් අසාර්ථක වූ අංශ ලෙස ආයෝජන භාර, නිමැවුම්, හෝටල් හා සංචාරක මෝටර් රථ සහ බැංකු, මූල්‍ය හා රක්ෂණ අංශ දැක්විය හැකි ය.

## කලාපීය කොටස් වෙළෙඳපොළ

ආසියා ශාන්තිකර කලාපීය කොටස් වෙළෙඳපොළවල ක්‍රියාකාරිත්ව ඉහළ නැගීම් සහ පහළ බැසීම් අතර සමව බෙදී පැවතුණි. කලාපය තුළ ඉතා ම සාර්ථක වෙළෙඳපොළ ලෙස තායිපේ කොටස් වෙළෙඳපොළ සඳහන් කළ හැකි අතර, බැංකොක් වෙළෙපොළ ඉතාමත් ම අසාර්ථක වෙළෙඳපොළ ලෙස සඳහන් කළ හැකි ය. සති 52 ක කාලය තුළ තායිපේ බර තැබූ මිල දර්ශකය දර්ශකාංක 40.7 කින් වැඩි වූ අතර, බැංකොක් සෙට් (SET) දර්ශකය දර්ශකාංක 423 කින් අඩු විය. තවද සිඩ්නි, ක්වාලාලම්පූර් , ජකාර්තා, හොංකොං, බොම්බාය හා මැනිලා වෙළෙඳපොළවල දර්ශක වැඩිවූ අතර, කරච්චි, සෝල්, කොළඹ, ටෝකියෝ සහ සිංගප්පූරු වෙළෙඳපොළවල මිල දර්ශක පහත වැටුණි.

## වෙළෙඳපොළෙහි වර්ධනයන්

කොළඹ කොටස් හුවමාරුව, එහි ශත සංවත්සරය 1996 දී සැමරිය. වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය අඩු මට්ටමක පැවතුනත්, කොටස් හුවමාරුවෙහි කටයුතු වැඩි දියුණු කිරීම සඳහා තව දුරටත් යම් යම් වෙනස්කම් ඇති කරන ලදී. ශ්‍රී ලංකාවේ සුරැකුම් හා හුවමාරු කොමිසම විසින් කොළඹ කොටස් හුවමාරු වෙළෙඳපොළෙහි තැරැව්කරුවන් නොමැති ව කෙළින් ම ගනුදෙනු කටයුතු කිරීමේ මණ්ඩලයකට (Over the Counter Board) අනුමැතිය දී ඇත. මෙම මණ්ඩලය 1996. ජුලි 01 වැනි දින කටයුතු අරඹී ය. මෙම මණ්ඩලයේ අරමුණ වන්නේ කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි නො වූ පොදු සමාගම්වල කොටස් ගනුදෙනු පහසු කරලීම ය. මෙම මණ්ඩලය යටතේ කටයුතු කරන සමාගම් ලැයිස්තුගත සමාගම් ලෙස නොගැනෙන අතර, එම සමාගම් කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත සමාගම් කෙරේ බලපාන සාමාන්‍ය නියමයන්ගෙන් නොබැඳේ. කොටස් හුවමාරුව වෙත ලැයිස්තුගත වීමේ ක්‍රියාපටිපාටිය දුෂ්කර, කල්ගතවන, වියදම් අධික එකක් බැවින්, අරමුදල් සපයා ගැනීමට මහජනයා වෙත කොටස් විකුණා ඇති බොහෝ කුඩා හා මධ්‍යම පරිමාණයේ සමාගම් කොටස් හුවමාරුවෙහි නිල ක්‍රමයෙහි සහභාගී වීමට අකමැති ය. මෙම මණ්ඩලය එබඳු සමාගම්වලට සිය ද්විතීය ගුනදෙනු කටයුතු පහසුකර ගැනීමට අවස්ථාව සලසා දෙයි. මෙම ක්‍රමය පුළුල් කොටස් හිමිකමක් සහිත සමාගම්වලට ප්‍රයෝජනවත් වේ. මන්ඩලය සමග ලියාපදිංචි වීම නිසා පෞද්ගලික ගනුදෙනුවල නිරත වීමෙන් මෙම සමාගම් වැලැක්වීමක් මින් සිදු නොවේ.

තව ද කොළඹ කොටස් වෙළෙඳපොළ ණය සුරැකුම් මණ්ඩලයක් පිහිටුවීමට ද කටයුතු කරමින් සිටී. මෙම ණය සුරැකුම් මණ්ඩලයේ හි පරමාර්ථය ණය සුරැකුම් සඳහා ද්විතියික වෙලෙඳපොළක් ජනප්‍රිය කිරීම වේ. සුරැකුම් හුවමාරු කොමිසම හා කොළඹ කොටස් වෙළෙඳපොළ මෙය සඳහා ක්‍රියාවලියක් සකස් කරමින් සිටියි. කෙසේ වුව ද ණය සුරැකුම් සඳහා ද්විතීයික වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය දැනට අඩු මට්ටමකින් පැවතේ.

මූල්‍ය වෙළෙඳපොළේ කොටස් සුරැකුම් ආදිය ඒවායේ අවදානම අනුව වර්ගීකරණය කරන ආයතනයක් ශ්‍රී ලංකාවේ පිහිටුවීමට කටයුතු කරගෙන යනු ලැබේ. මෙවැනි ආයතනයක් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මතයන් අනුව කොටස්, සුරැකුම් ආදි මූල්‍ය උපකරණ අනුපිළිවෙළට වර්ග කරන්නා වූ ස්වාධීන ආයතනයකි. මෙම අනුපිළිවෙළට සැකසීම එම ආයතනය මගින් සපයන උපදෙසක් නොව ආයතනය මගින් කරන ලද විශ්ලේෂණයන් අනුව එම සුරැකුම්පත් හි අවදානම පිළිබඳ ඇගවීමකි. ආයතනය පිහිටවූ පසු ආයෝජකයින්ට විශ්වාසයකින් සහ වැඩි දැනුමකින් යුතු ව වෙළෙඳපොළේ ආයෝජනය කිරීම හැකිවන පරිදි එමගින් ණය සුරැකුම් නිකුත් කරන සමාගම් අවදානම අනුව අනුපිළිවෙළට වර්ගීකරණය කරනු ඇත.

**සංඛ්‍යා සටහන 10.19**

**ඒකක භාර**

| | 1994 | 1995 | 1996(අ) |
|---|---|---|---|
| 1 මුළු වත්කම් (රු. දශලක්ෂ) | 3,982.3 | 2,880.8 | 2,652.0 |
| 2 ශුද්ධ වත්කම් වටිනාකම (රු. දශලක්ෂ) | 3,946.8 | 2,855.0 | 2,636.9 |
| 3 කොටස්වල ආයෝජනය (රු. දශලක්ෂ) | 2,859.1 | 1,762.4 | 1,598.8 |
| 4 (3), (1) හි ප්‍රතිශතයක් වශයෙන් | 72.4 | 61.7 | 60.6 |
| 5 ඒකක හිමි මුළු ගණන | 22,286 | 25,251 | 25,235 |

මූලය : ඒකක භාර

(අ) සිබැන්ක් සෙන්චරි ග්‍රෝත් අරමුදල, 1997 දෙසැම්බර් 3 දින ආරම්භ කළ ද ඒකක භාර හතරක් පමණක් ඇතුළත් වේ.

(ආ) දෙසැම්බර් 31 දිනට වටිනාකම්

## ඒකක භාර

1996 වසරේ දෙසැම්බර් මස නව ඒකක භාරයක්, එනම් සෙන්චරි ග්‍රෝත් ෆන්ඩ් (Century Growth Fund) පිහිටුවීමත් සමග ඒකක භාර ගණන 5 දක්වා වැඩි විය. ඒකක භාරයන්හි ශුද්ධ වත්කම්හි එකතුව 1995 වසරේ දැක්වූ සියයට 27.7 ක පහත වැටීමට සාපේක්ෂ ව 1996 වසරේ සියයට 7.6 කින් පහත වැටුණි. ඒකක භාරයන්හි ක්‍රියාකාරිත්වය කොළඹ කොටස් වෙළෙඳපොළට සාපේක්ෂ ව මැනිය යුතු ය. කොළඹ කොටස් වෙළෙඳපොළේ සමස්ත මිල දර්ශකය 1995 වසරේ හා 1996 වසරේ පිළිවෙළින් සියයට 32 කින් හා සියයට 9 කින් පහත වැටුණි. 1996 වසර අවසානයේ දී ඒකක භාරයන්හි ආයෝජන ව්‍යුහය 1995 වසර අවසානයේ දී පැවති ව්‍යුහයට සමාන විය. තම මුළු ශුද්ධ වත්කම් අගයෙන් කොටසක් වශයෙන් කොටස් ප්‍රාග්ධනයෙහි ආයෝජනය 1995 වසරේ සියයට 61.7 ට සාපේක්ෂ ව 1996 වසරේ සියයට 60.6 ක් විය.